විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය
விஞ்ஞான மற்றும் தொழினுட்ப அமைச்சு
Ministry of Science and Technology

2024

විද්‍යා තාක්ෂණ හා පර්යේෂණ තුළින් ප්‍රගතිය කරා

விஞ்ஞானம், தொழினுட்பம் மற்றும் ஆராய்ச்சியினூடான சாதனைகள்

Achievements through Science, Technology and Research

ප්‍රගතිය 2024 හා ඉදිරි ගමන් මඟ 2025

විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය

ගරු අමාත්‍යතුමාගේ පණිවිඩය

විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය, ඒ යටතට ගැනෙන ක්‍රියාත්මක කිරීමේ ආයතන 12 සමඟ එක්ව, 2024 වර්ෂය සඳහා වන වාර්ෂික ප්‍රගති වාර්තාව, අයවැය කාරක සභා අවස්ථාවට යොමු කරනු පිණිස ඉදිරිපත් කරනුයේ සාඩම්බරයෙනි. ශ්‍රී ලංකාවේ සමාජ-ආර්ථික සංවර්ධන ඉලක්ක සමඟ පර්යේෂණ සහ සංවර්ධන (R&D) කාර්යයන් පෙළගැස්වීම සඳහා වූ අමාත්‍යාංශයේ නොසැලෙන කැපවීම මෙම වාර්තාවෙන් පිළිබිඹු වේ.

වත්මන් රජයේ ප්‍රතිපත්තිමය න්‍යාය පත්‍රයේ ඉහළ ප්‍රමුඛතාවයක් හිමිව ඇති ඉදිරියේදී එළිදැක්වීමට නියමිත ජාතික විද්‍යා හා තාක්ෂණ ප්‍රතිපත්තිය, ප්‍රමුඛතා ක්ෂේත්‍ර ආමන්ත්‍රණය කිරීමට සහ විද්‍යා හා තාක්ෂණ (S&T) අංශයේ මැනිය හැකි ප්‍රගතිය උත්ප්‍රේරණය කිරීමට පැහැදිලි මාර්ග සිතියමක් සකසා දෙනු ඇත. ඒ අනුව, කුසලතා සවිබල ගැන්වීම, විද්‍යා හා තාක්ෂණ පරිසර පද්ධතිය නවීකරණය සහ ප්‍රතිව්‍යුහගත කිරීම සහ ආර්ථිකයේ ප්‍රධාන අංශ හරහා අති නවීන තාක්ෂණයන් ඒකාබද්ධ කිරීම කෙරෙහි අමාත්‍යාංශය දැනටමත් සිය අවධානය යොමු කර ඇත.

දැනුම සහ නවෝත්පාදන මත පදනම් වූ වත්මන් යුගයේ, විද්‍යා හා තාක්ෂණ අංශය තිරසර කාර්මික හා ආර්ථික ප්‍රගතියෙහි තීරණාත්මක ධාවකයන් ලෙස ක්‍රියාත්මක වේ. ඉල්ලුම මත පදනම් වූ පර්යේෂණ ප්‍රවර්ධනය කිරීම, පර්යේෂණ වාණිජකරණයට පහසුකම් සැලසීම සහ අංගසම්පූර්ණ නවෝත්පාදන පරිසර පද්ධතියක් පෝෂණය කිරීම මගින් ශ්‍රී ලංකාව විද්‍යාව හා තාක්ෂණ ක්ෂේත්‍රයේ ගෝලීය පාර්ශවකරුවෙකු ලෙස ස්ථානගත කිරීමට මෙම අමාත්‍යාංශය විසින් කටයුතු කරනු ලැබේ. සංවර්ධිත රටවල අත්දැකීම් ඇසුරෙන් දැනුම්වත් වෙමින්, ගෝලීය මට්ටමේ හොඳම භාවිතයන් සමඟ ජාතික ප්‍රමුඛතා පෙළගැස්වීමට අපි කටයුතු කර ඇත්තෙමු. ඒ අතරම, බලපෑමක් ඇතිකිරීමට සමත් පර්යේෂණ සහ සංවර්ධන මූලාරම්භයන් හරහා සමාජ යහපැවැත්ම වැඩිදියුණු කිරීමටද මෙම අමාත්‍යාංශය කැපවී සිටී.

ජාතික අභියෝග සඳහා විසඳුම් ලබාදෙනු පිණිස කෘෂිකර්මය, සෞඛ්‍ය, බලශක්ති සහ නිෂ්පාදන යන ක්ෂේත්‍රවල නවීන තාක්‍ෂණයන් භාවිතයට ගැනීම සම්බන්ධයෙන් අමාත්‍යාංශය විසින් මෙම වසරේදී සැලකිය යුතු ප්‍රගතියක් අත් කර ගැනීමට සමත්ව ඇත. පර්යේෂණ සම්බන්ධ දූරදක්නාභාවය සහ නවෝත්පාදනයන් පිලිබඳ අවධාරණය කරමින්, පර්යේෂණ සහ සංවර්ධන අවශ්‍යතා ඩිජිටල්කරණය ප්‍රවර්ධනය කිරීමට, සහ ඵලදායිතාව සහ තරඟකාරිත්වය ඉහළ නැංවීම සඳහා නවීන තාක්‍ෂණ යෙදුම් වැඩිදියුණු කිරීමට අපගේ මූලාරම්භයන් සහාය වේ. දේශය පුරා සමානාත්ම වර්ධනයක් සහතික කරමින්,ග්‍රාමීය ප්‍රජාවන්ට පර්යේෂණයන් අදාළ කරගැනීම සහ ඒ හරහා බලපෑමක් ඇති කිරීමට අපි සමානව කැපවී සිටිමු.

මෙම වාර්තාවේ දක්වා ඇති අප ලබා ඇති ජයග්‍රහණ අපගේ පර්යේෂකයන්, ප්‍රතිපත්ති සම්පාදකයින්, ව්‍යවසායකයින් සහ පාර්ශවකරුවන්ගේ කැපවීම සහ සහයෝගීතාවයට කදිම සාක්ෂියකි. ඔවුන්ගේ එම දායකත්වයන් හරහා, සමෘද්ධිමත් සහ සැමට සමානාත්මතාවය තහවුරු කෙරෙන ශ්‍රී ලංකාවක් සාක්ෂාත් කර ගැනීමේ පරිවර්තනීය බලවේගයක් ලෙස විද්‍යා හා තාක්ෂණ අංශයේ ප්‍රගතිය භාවිතයට ගැනීමේ හැකියාව උදාවේ.

ඉදිරි කාලයේදී නවෝත්පාදන සංස්කෘතියක් ප්‍රවර්ධනය කිරීමටත්, විද්‍යාව හා තාක්ෂණය අප දේශයේ ආර්ථික හා සමාජයීය පරිවර්තනයේ හරය ලෙස ස්ථානගත කිරීමටත් දරන ප්‍රයත්නයන් තුළ අපි එක්සත්ව සිටිමු.ඒ හරහා සියලු ශ්‍රී ලාංකිකයන් සඳහා අවස්ථාවන් සපිරි සමෘද්ධිමත් අනාගතයක් ගොඩ නැංවීමට නියත වශයෙන්ම හැකි වනු ඇත.

වෛද්‍ය ක්‍රිෂාන්ත අබේසේන (පා.ම)
අමාත්‍ය
විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය
2024 දෙසැම්බර්

2024 වාර්ෂික වාර්තාව සඳහා අමාත්‍යාංශ ලේකම්තුමාගේ පණිවිඩය

විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශයේ ලේකම්වරයා වශයෙන්, තිරසර සංවර්ධනය සහ ජාතික සමෘද්ධිය ළඟා කර ගැනීම උදෙසා විද්‍යා හා තාක්‍ෂණ අංශය ප්‍රගතිය කරා මෙහෙයවීමේදී, ඒ සඳහා මෙම අමාත්‍යාංශය විසින් ගනු ලැබ ඇති අඛණ්ඩ ප්‍රයත්නයන් ප්‍රකට කරමින් 2024 වර්ෂය සඳහා වන වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරනුයේ මහත් සතුටිනි.

රජයේ විද්‍යා හා තාක්ෂණ ප්‍රතිපත්ති ප්‍රකාශය හා අනුකූලත්වය දක්වමින්, නවෝත්පාදනයන් පෝෂණය කිරීම, පර්යේෂණ වාණිජකරණය වැඩි දියුණු කිරීම සහ තාක්ෂණික දියුණුව සඳහා ශක්තිමත් පරිසර පද්ධතියක් ගොඩනැගීම කෙරෙහි අමාත්‍යාංශය විසින් සිය අවධානය යොමු කර ඇත. සිය විෂය පථය යටතට ගැනෙන ක්‍රියාත්මක කිරීමේ ආයතන 12ක් සමඟ එක්ව, පාර්ශවකරුවන් සවිබල ගැන්වීමට, යටිතල පහසුකම් නවීකරණය කිරීමට සහ පර්යේෂණ මත පදනම් වූ ආර්ථික වර්ධනය උත්ප්‍රේරණය කිරීමට අමාත්‍යාංශය මහත් පරිශ්‍රමයකින් කටයුතු කර ඇත.

මෙම වසරේදී, ඉල්ලුම මත පදනම් වූ පර්යේෂණ ක්‍රියාත්මක කිරීම සහ ජෛව තාක්‍ෂණය, නැනෝ තාක්‍ෂණය සහ අනෙකුත් නැගී එන විද්‍යාත්මක තාක්‍ෂණයන් වැනි අති නවීන තාක්‍ෂණයන් භාවිතයට ගැනීම යන කාර්යයන්හි සැලකිය යුතු ප්‍රගතියක් සනිටුහන් කිරීමට හැකියාව ලැබී ඇත. ශ්‍රී ලංකා නිනිති තාක්‍ෂණ ආයතනය (SLINTEC) සහ ශ්‍රී ලංකා ඉන්ස්ටිටියුට් ඔෆ් බයෝටෙක්නොලොජි (SLIBTEC) යන ආයතන ද්විත්වය සඳහා සහයෝගීත්වයෙන් කටයුතු කිරීමට හැකි වන පරිදි පර්යේෂණ යටිතල පහසුකම් සලසා දෙනු පිණිස ප්‍රතිපත්තිමය මාර්ගෝපදේශ සැපයීම සඳහා අමාත්‍යාංශය විසින් මූලික පියවර ගනු ලැබ ඇත. මෙම ප්‍රයත්නයන් හරහා කෘෂිකර්මාන්තය, නිෂ්පාදන සහ කර්මාන්ත වැනි ප්‍රධාන අංශ ආශ්‍රිතව මතුව ඇති ජාතික අභියෝග සඳහා නවීන විද්‍යාත්මක විසඳුම් සපයා දීමට මංපෙත් විවර කර දී ඇත. තරුණ පරපුර සහ ප්‍රජාවන් තුල නවෝත්පාදන සංස්කෘතියක් සහ විද්‍යාත්මක කුතුහලයක් පෝෂණය කිරීමට අප දරන උත්සාහයද මේ හා සමානව වැදගත්කමක් උසුලයි. ශිෂ්‍ය පර්යේෂණ සම්මන්ත්‍රණය, විද්‍යා සම්පත් මධ්‍යස්ථාන 267ක සහාය ඇතිව සිදුකෙරෙන ග්‍රාමීය තාක්‍ෂණ පැවරුම් වැඩසටහන් සහ 2023 සහ 2024 ජාතික විද්‍යා දින වැඩසටහන වැනි ප්‍රධාන සිදුවීම් හරහා විද්‍යා හා තාක්‍ෂණයේ ප්‍රතිලාභ රටේ සෑම අස්සක් මුල්ලක් නෑරම ළඟා වන බවට අමාත්‍යාංශය සහතික කරයි.

2024 වසරේදී ඉන්දියාව, දකුණු අප්‍රිකාව සහ කොරියාව වැනි රටවල් සමඟ නව හවුල්කාරිත්වයක් ඇති කර ගනිමින් සහ දැනට පවතින සහයෝගීතා ගිවිසුම් ශක්තිමත් කරමින් බෙන්ගාල බොක්ක ආශ්‍රිත රටවල බහු ආංශික තාක්ෂණ සහ ආර්ථික සහයෝගීතාවය සඳහා වන මූලාරම්භය (BIMSTEC) සහ නොබැඳි ජාතීන්ගේ සංවිධානයේ විද්‍යා හා තාක්ෂණ සහයෝගීතාවය (NAMS&T) වැනි සහයෝගීතාවයන් ඇති කර ගැනීම හරහා අපගේ ජාත්‍යන්තර සබඳතාවන් වර්ධනය කර ගැනීමට පියවර ගනු ලැබිණි. ගෝලීය විද්‍යාත්මක හා තාක්‍ෂණික භූ දර්ශනය තුළ ශ්‍රී ලංකාවේ පැවැත්ම තවදුරටත් තහවුරු කරමින් දැනුම හුවමාරු කර ගැනීම, ධාරිතා ගොඩනැගීම සහ ඒකාබද්ධ නවෝත්පාදනය සඳහා අවස්ථාවන් මෙම මූලාරම්භයන් හරහා නිර්මාණය කර දී ඇත.

නවෝත්පාදනයන් මත පදනම් වූ සමෘද්ධිමත් ශ්‍රී ලංකාවක් සඳහා වූ අමාත්‍යාංශයේ දැක්ම හා අනුගතව කටයුතු කරන අපගේ පර්යේෂකයන්, ආයතන සහ පාර්ශවකරුවන්ගේ නිරන්තර කැපවීම සහ සහයෝගයෙන් තොරව, මෙම වසරේදී මෙලෙස ලබා ගත් ජයග්‍රහණ අත් කර ගත නොහැකි වනු ඇත. නැගී එන අභියෝගවලට මුහුණ දෙමින් නව අවස්ථා ග්‍රහණය කර ගනිමින් ඉදිරිය කරා අප යන ගමනේදී අප දේශය සංවර්ධිත තත්ත්වය කරා රැගෙන යාමට සහ සියලුම ශ්‍රී ලාංකිකයන්ගේ ජීවන තත්ත්වය ඉහල නංවාලීමට විද්‍යාව හා තාක්ෂණය වැදගත් කාර්යභාරයක් ඉටු කරනු ඇති බව මාගේ විශ්වාසයයි.

වයි.එල්. මොහමඩ් නවවි
ලේකම්
විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය
2024 දෙසැම්බර්

දැක්ම

විද්‍යාව, තාක්ෂණය සහ නවෝත්පාදනය තුළින් සංවර්ධිත දේශයක්

මෙහෙවර

තිරසර සංවර්ධන රාමුව තුළ ජාතික සහ ගෝලීය අභියෝග සඳහා විසඳුම් සපයා දෙමින්, ජීවන තත්ත්වය වැඩිදියුණු කිරීම අරමුණු කරගත් ආර්ථික වර්ධනයක් අත්කර දීමට සමත් ඵලදායි විද්‍යා, තාක්ෂණ හා නවෝත්පාදන පරිසර පද්ධතියක් නිර්මාණය කිරීම.

පටුන

		පිටු අංකය
01.	හැඳින්වීම	01
02.	විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශයේ සංවර්ධන වැඩසටහන්වල ප්‍රගතිය	04
03	නවීන තාක්ෂණය පිළිබඳ ආතර් සී ක්ලාක් ආයතනය (ACCIMT)	20
04	කාර්මික තාක්ෂණ ආයතනය (ITI)	27
05	ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව (NASTEC)	32
06	ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය (NERDC)	36
07	ජාතික නවෝත්පාදන නියෝජ්‍යායතනය (NIA)	40
08	ජාතික මූලික අධ්‍යයන ආයතනය (NIFS)	43
09	ජාතික පර්යේෂණ සභාව (NRC)	48
10	ජාතික විද්‍යා පදනම (NSF)	53
11	ශ්‍රී ලංකා ඉන්ස්ටිටියුට් ඔෆ් බයෝටෙක්නොලොජි (SLIBTEC)	60
12	ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම (SLIC)	63
13	ශ්‍රී ලංකා නිනිති තාක්ෂණ ආයතනය (SLINTEC)	68
14	ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය (SLSI)	75

1. හැඳින්වීම

තිරසර ආර්ථික සංවර්ධනයක් ලඟාකර ගැනීම සහ සියලු පුරවැසියන් සඳහා උසස් ජීවන තත්ත්වයක් සහතික කිරීම උදෙසා විද්‍යාව, තාක්ෂණය සහ නවෝත්පාදන (STI) අංශය සතු පරිවර්තනීය විභවයන් උත්ප්‍රේරකයක් ලෙස යොදා ගැනීම සඳහා ශ්‍රී ලංකාව විසින් දරනු ලබන ප්‍රයත්නයන්හි පුරෝගාමී කාර්යභාරයක් විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය විසින් ඉටු කරනු ලැබේ. වසරේ මුල් මාස 10 තුළ අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ පර්යේෂණ හා නව නිපැයුම් අංශයක් ලෙස ක්‍රියාත්මක වුවද, ගෝලීය ප්‍රවණතා සමඟ අනුකූලත්වය දක්වමින් ජාතික ප්‍රමුඛතා ඵලදායි ලෙස ආමන්ත්‍රණය කරනු පිණිස සිය පර්යේෂණ සහ සංවර්ධන (R&D) මූලාරම්භයන් පුළුල් කිරීම සම්බන්ධයෙන් මෙම අංශය කැපී පෙනෙන ප්‍රගතියක් පෙන්නුම් කර ඇත.

2024 වසරේදී අංක 2412/08 හා 2024.11.25 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය පිහිටුවුවද, විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශයක් පිහිටුවීමේ පදනම රට පුරා විද්‍යාත්මක පර්යේෂණ සහ සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම සඳහා, ජාතික විද්‍යා සභාව පිහිටුවන ලද 1968 වර්ෂය දක්වා දිව යයි. ඉන් අනතුරුව, 1981 දී ශ්‍රී ලංකා ස්වාභාවික සම්පත්, බලශක්ති සහ විද්‍යා අධිකාරිය (NARESA) නිර්මාණය කරනු ලැබූ අතර එමගින් රටෙහි ස්වභාවික සම්පත් සහ බලශක්ති ක්ෂේත්‍ර සංවර්ධනය කෙරෙහි අවධානය යොමු කරන ලදී. 1994 අංක 11 දරන විද්‍යා හා තාක්ෂණ සංවර්ධන පනත මගින් විවිධ විද්‍යාත්මක හා තාක්‍ෂණික ආයතන එක් ආයතනයක් යටතේ ඒකාබද්ධ කරමින් නිල වශයෙන් විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය පිහිටුවීමට කටයුතු කෙරිණි. ගෙවීගිය කාලය තුල මෙම අමාත්‍යාංශය සංවිධානාත්මක වෙනස්කම් කිහිපයකට බඳුන් වෙමින් විවිධ ආකාරයෙන් විකාශනයට ලක් වී ඇත. එහිදී ආර්ථික ප්‍රතිසංස්කරණ, විද්‍යා සහ තාක්ෂණ අමාත්‍යාංශය (2001–2003), තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය (2010–2015) සහ විද්‍යා, තාක්‍ෂණ සහ පර්යේෂණ අමාත්‍යාංශය (2016-2018) ලෙසද "විද්‍යා, තාක්‍ෂණ සහ පර්යේෂණ" (2018.12.28 සිට) සහ "උසස් අධ්‍යාපන, තාක්‍ෂණ සහ නවෝත්පාදන" (2019.12.10 සිට) යන නාමයන් යටතේ කැබිනට් නොවන අමාත්‍යාංශයක් ලෙස ද ක්‍රියාත්මක විය. ඉතා මෑතක දී, එනම් 2020 දී, නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ සහ නවෝත්පාදන රාජ්‍ය අමාත්‍යාංශය ලෙස පැවතිනි. මෙම සංක්‍රාන්ති කාලය පුරාවටම, දේශයේ විද්‍යාත්මක හා තාක්‍ෂණික ප්‍රගතියට දායක වෙමින්, ශ්‍රී ලංකාව තුළ විද්‍යාව, තාක්‍ෂණය සහ නවෝත්පාදනයන් ප්‍රවර්ධනය කිරීමෙහිලා අමාත්‍යාංශය විසින් තීරණාත්මක කාර්යභාරයක් ඉටු කර ඇත.

2024 වසරේ පළමු මාස 10 තුල ආයතන 10 ක් සහ වසර අවසානය වනවිට ආයතන 12 ක් වශයෙන් අමාත්‍යාංශය විසින් විද්‍යාත්මක පර්යේෂණ, තාක්‍ෂණ සංවර්ධනය සහ නවෝත්පාදන දියුණු කිරීම සඳහා කැපවූ ක්‍රියාශීලී ආයතන ජාලයක් අධීක්ෂණය කරන ලදී. මෙකී ආයතන විසින් ඉල්ලුම මත පදනම් වූ පර්යේෂණ ප්‍රවර්ධනය කිරීම, කර්මාන්ත-පර්යේෂණ හවුල්කාරිත්වයන් ශක්තිමත් කිරීම සහ තාක්ෂණය මත පදනම් වූ ව්‍යවසායකත්වයන් සහ නවෝත්පාදන සඳහා හිතකර පරිසරයක් පෝෂණය කිරීම සඳහා උපායමාර්ගික මූලාරම්භයන් ක්‍රියාත්මක කිරීමට සහයෝගය ලබාදී ඇත. ජෛව තාක්‍ෂණය, නැනෝ තාක්‍ෂණය සහ තිරසර බලශක්ති විසඳුම් වැනි නැගී එන සහ දියුණු තාක්‍ෂණයන් කෙරෙහි විශේෂ අවධානයක් යොමු කර ඇති අතර, ඒ හරහා ශ්‍රී ලංකාව තාක්‍ෂණික දියුණුවේ ප්‍රමුඛයෙකු වීම සඳහා පදනම සකස් කර ඇත.

2024 වර්ෂය ශ්‍රී ලංකාවේ පර්යේෂණ සහ සංවර්ධන සහ නවෝත්පාදන ක්ෂේත්‍රයේ වැදගත් සන්ධිස්ථාන සනිටුහන් කළ වසරක් වූ අතර, මෙම ක්ෂේත්‍රය හා සම්බන්ධ ප්‍රධාන ආයතන සහ මූලාරම්භයන් වෙතින් ඒ සඳහා කැපී පෙනෙන දායකත්වයක් ලැබිණි. රටේ නවෝත්පාදන පරිසර පද්ධතිය සඳහා පහසුකම් සපයා දෙන ප්‍රමුඛ ආයතනයක් ලෙස, ජාතික නවෝත්පාදන නියෝජ්‍යායතනය (NIA) විසින්, පර්යේෂණ සහ සංවර්ධන ආයතන තුළ වාණිජකරණ උපාය මාර්ග ශක්තිමත් කිරීම සඳහා පුළුල් වාණිජකරණ මාර්ගෝපදේශයක් සහ ආයතනික ව්‍යාපාර සබඳතා ඒකක (IBL) හඳුන්වා දෙන ලදී. ජාතික මූලික අධ්‍යයන ආයතනය (NIFS) විසින් ජෛව පටල ජෛව පොහොර (BFBF) සංවර්ධනය හා වාණිජකරණය හරහා කැපීපෙනෙන අන්දමේ ප්‍රගතියක් අත් කර ගැනුමට සමත්ව ඇත. සාම්ප්‍රදායික පොහොර සඳහා පරිසර හිතකාමී විකල්පයක් ලෙස, ජාතික මට්ටමින් ජෛව පටල ජෛව පොහොර පුළුල් ලෙස භාවිතයට ගැනීම සහ බෙදා හැරීම, තිරසාර කෘෂිකාර්මික භාවිතයන් ප්‍රවර්ධනය කිරීම ගොවි ජනතාව සඳහා ධනාත්මක ලෙස බලපා ඇත. මෙයට අමතරව, මහනුවර හන්තාන කඳු බෑවුමක පිහිටි වසර 50 ක් පමණ පැරණි ජාතික මූලික අධ්‍යයන ආයතනයේ (NIFS) පර්යේෂණ යටිතල පහසුකම්

සංරක්ෂණය සඳහා රූඳවුම් බිත්ති ඉදි කිරීම තුළින් ගොඩනැගිලි ස්ථාවර තත්ත්වයට පත්කරගනිමින් ආයතනය ප්‍රතිසංස්කරණය කිරීමට පියවර ගෙන ඇත.

ශ්‍රී ලංකා නිනිති තාක්‍ෂණ ආයතනය (SLINTEC) විසින් වාණිජකරණ ව්‍යාපෘති හරහා ආර්ථිකයට සැලකිය යුතු දායකත්වයක් ලබා දී ඇති අතර ශ්‍රී ලංකා ඉන්ස්ටිටියුට් ඔෆ් බයෝටෙක්නොලොජි (SLIBTEC) ජෛව තාක්‍ෂණ පර්යේෂණ ක්ෂේත්‍රයේ ප්‍රධාන පාර්ශවකරුවෙකු ලෙස ස්ථාවර වී ඇත. SLIBTEC ආයතනය විසින් බහුවිධ ජාත්‍යන්තර ප්‍රදාන ලබා ගනිමින් කර්මාන්ත අංශයේ අනාගත ඉල්ලීම් සපුරාලනු පිණිස එහි යටිතල පහසුකම් පුළුල් කරමින් ශක්තිමත් ජෛව තාක්‍ෂණ අංශයක් සඳහා අඩිතාලම දමනු ලැබිණි. ජාතික විද්‍යා පදනම (NSF) සිසුන්ගේ සහ අධ්‍යාපනඥයින්ගේ සුවිශේෂී පර්යේෂණ සහ සංවර්ධන නිමැවුම් සහ ප්‍රකාශන කුසලතා ඉස්මතු කරන පර්යේෂණ සම්මන්ත්‍රණ සංවිධානය කරමින් පාසල් මට්ටමින් පර්යේෂණ සංස්කෘතියක් පෝෂණය කිරීමේ ප්‍රධාන කාර්යභාරයක් ඉටු කළේය. මෙම මූලාරම්භයන් අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ නවෝත්පාදනයන් පුළුල් ලෙස ව්‍යාප්ත කිරීමට දායක වී ඇත. තවද, ජාතික විද්‍යා පදනම (NSF) විසින් අංගසම්පූර්ණ පර්යේෂණ පරිසරයකට පහසුකම් සලසා දෙමින් ඩිජිටල් පුස්තකාල සමූහයක් පිහිටුවීමෙන්, පර්යේෂකයන්ගේ ප්‍රවේශ්‍යතාව වැඩි දියුණු කිරීමට පියවර ගැනිණි.

බිම් මට්ටමේ ව්‍යවසායකයින් සහ කුඩා හා මධ්‍යම පරිමානයේ ව්‍යවසායකයින් හට (SMEs) සහාය වීම සඳහා අමාත්‍යාංශය විසින් සිය තාක්ෂණ හුවමාරු වැඩසටහන් පුළුල් කරන ලදී. විදාතා සම්පත් මධ්‍යස්ථාන 267ක් හරහා ක්‍රියාවට නංවන ලද මෙම වැඩසටහන්, කර්මාන්ත අංශයේ අවශ්‍යතාවයන්ට ගැලපෙන පරිදි සකසා ඇති විද්‍යා,තාක්ෂණ සහ නවෝත්පාදන අංශයේ ප්‍රතිලාභ සඳහා සාධාරණ ප්‍රවේශයක් සහතික කරමින් ග්‍රාමීය ජනතාව සවිබල ගන්වා ඇත. ජාත්‍යන්තර වශයෙන් ගත් කල, අමාත්‍යාංශය විසින් , ඉන්දියාව, දකුණු අප්‍රිකාව සහ කොරියාව වැනි රටවල් සමඟ ගිවිසුම් ඇතිකර ගනිමින් ගෝලීය හවුල්කරුවන් සමඟ සහයෝගීතාවයන් ශක්තිමත් කිරීමට පියවර ගැනිණි. මෙම හවුල්කාරිත්වයන් හරහා ගෝලීය විද්‍යා,තාක්ෂණ සහ නවෝත්පාදන භූ දර්ශනය තුළ ශ්‍රී ලංකාවේ තරඟකාරිත්වය ඉහළ නංවමින් දැනුම හුවමාරු කර ගැනීම, ඒකාබද්ධ පර්යේෂණ සහ ධාරිතා ගොඩනැගීමේ මූලාරම්භයන් සවිබල ගැන්විණි.

මෙම වාර්තාවේ සවිස්තරාත්මකව දක්වා ඇති ජයග්‍රහණ හරහා ජාතික සංවර්ධනයේ ප්‍රධාන ක්ෂේත්‍රයන් වන විද්‍යාව හා තාක්‍ෂණය දියුණු කිරීමට අමාත්‍යාංශයේ නොසැලෙන කැපවීම පිළිබිඹු වේ. ගෝලීය දැනුම් ආර්ථිකය තුළ නවෝත්පාදනයන් පෝෂණය කිරීම සහ ප්‍රජාවන් සවිබල ගැන්වීම තුළින් ශ්‍රී ලංකාවට සමෘද්ධිමත් සහ තිරසාර අනාගතයක් උදාකර දීම අමාත්‍යාංශයේ අරමුණ වේ.

1.1 විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශයේ කාර්යභාරය

- රජය විසින් ජාතික මට්ටමින් ක්‍රියාත්මක කරනු ලබන ප්‍රතිපත්තීන් මත පදනම්ව, විද්‍යා හා තාක්ෂණ විෂයයන් සම්බන්ධව ප්‍රතිපත්ති, උපාය මාර්ග, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය , ක්‍රියාත්මක කිරීම, අධීක්ෂණය සහ ඇගයීම
- අමාත්‍යාංශයේ විෂය පථය යටතේ මහජන සේවාවන් කාර්යක්ෂමව සහ ජනතා හිතකාමී ලෙස සැපයීම.
- නවීන කළමනාකරණ ශිල්පීය ක්‍රම සහ තාක්‍ෂණය යොදා ගනිමින් සියලු පද්ධතීන් සහ ක්‍රියා පටිපාටි ප්‍රතිසංස්කරණය කිරීම හරහා දූෂණය හා නාස්තිය පිටුදකිමින් අමාත්‍යාංශයේ කාර්යයන් ඉටු වන බව සහතික කිරීම.
- ජාත්‍යන්තර පර්යේෂණ ආයතන සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම සඳහා පර්යේෂණ ආයතනවලට පහසුකම් සැලසීම.
- නවෝත්පාදන සහ පර්යේෂණයන්හි ප්‍රතිඵල උපයෝගී කර ගැනීම සඳහා කාර්යක්ෂම යාන්ත්‍රණයක් සම්පාදනය කිරීම.
- විද්‍යාත්මක, කාර්මික, සමාජීය සහ ආර්ථික පර්යේෂණ සහ සංවර්ධන කටයුතු පුළුල් කිරීමට පියවර ගැනීම.
- නවෝත්පාදනයන් උදෙසා ප්‍රජාවන් පෙළඹවීම සහ යොමු කිරීම.
- විද්‍යා හා තාක්ෂණ අංශයේ පරිපාලනයට අදාළ ප්‍රමිති සහ කරුණු බලාත්මක කිරීම
- හරිත තාක්ෂණ ව්‍යාපෘති සංවර්ධනය කිරීම සඳහා අදාළ අමාත්‍යාංශවලට තාක්ෂණික සහාය ලබා දීම

1.2 විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ආයතන

- නවීන තාක්ෂණය පිළිබඳ ආතර් සී ක්ලාක් ආයතනය (ACCIMT)
- කාර්මික තාක්ෂණ ආයතනය (ITI)
- ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව (NASTEC)
- ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය (NERDC)
- ජාතික නවෝත්පාදන නියෝජ්‍යායතනය (NIA)
- ජාතික මූලික අධ්‍යයන ආයතනය (NIFS)
- ජාතික පර්යේෂණ සභාව (NRC)
- ජාතික විද්‍යා පදනම (NSF)
- ශ්‍රී ලංකා ඉන්ස්ටිටියුට් ඔෆ් බයෝටෙක්නොලොජි (SLIBTEC)
- ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම (SLIC)
- ශ්‍රී ලංකා නිනිති තාක්ෂණ ආයතනය (SLINTEC)
- ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය (SLSI)

02. විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශයේ සංවර්ධන වැඩසටහන්වල ප්‍රගතිය

2.1. විද්‍යාත්මක සංවර්ධන වැඩසටහන

2.1.1. පර්යේෂණ අංශය

- **පර්යේෂණ හා සංවර්ධන අංශයෙහි සිදුකරනු ලැබූ ආයෝජනයන් (ජාතික පර්යේෂණ හා සංවර්ධන රාමුව - NRDF ක්‍රියාත්මක කිරීම)**

ජාතික පර්යේෂණ හා සංවර්ධන රාමුව යටතේ රටේ පර්යේෂණ හා සංවර්ධන ක්ෂේත්‍රයේ අභිවෘද්ධිය සඳහා අවශ්‍ය ක්‍රමවේද සහ වැඩසටහන් හඳුනා ගැනේ. 2024 වර්ෂයේදී ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් වල විස්තර සහ ප්‍රගතිය පහත පරිදි වේ.

- ජාතික පර්යේෂණ හා සංවර්ධන රාමුව යාවත්කාලීන කර ජාතික පර්යේෂණ මාර්ග සිතියමක් සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු සංවිධානය කිරීම

ශ්‍රී ලංකාව තුළ පර්යේෂණ සහ නවෝත්පාදන සඳහා පැහැදිලි දැක්මක් සහ උපායමාර්ගික දිශානතියක් සකස් කිරීම අරමුණු කර ගනිමින් ජාතික පර්යේෂණ මාර්ග සිතියම (National Research Roadmap) සකස්කිරීම සඳහා අවශ්‍ය මූලික කටයුතු සංවිධානය කිරීම ආරම්භ කරන ලදී.

මෙම මූලාරම්භය යටතේ පර්යේෂකයන්, වෘත්තිකයන් සහ විද්‍යාඥයින් ඒකරාශී කිරීම සඳහා පොදු වේදිකාවක් සකස්කිරීම උදෙසා අභිමත ප්‍රකාශයන් (Expression of Interests) කැඳවන ලදී. විවිධ අධ්‍යයන ක්ෂේත්‍ර ආවරණය කරමින් අයදුම්පත් 111ක් අමාත්‍යාංශයට ලැබී ඇත. මෙම අයදුම්කරුවන් කාණ්ඩ 12ක් යටතේ වර්ගීකරණය කර අනුකමිටු මගින් ඉන් 70ක් තෝරා ගන්නා ලදී.

ජාතික පර්යේෂණ හා සංවර්ධන රාමුව යටතේ හඳුනාගත් විෂය ක්ෂේත්‍රයන් හි දැනුම, භාවිතාව වර්ධනය කිරීම සඳහා වැඩසටහන්/ ව්‍යාපෘති සංවිධානය කිරීම

(අ) 2024 වසරේදී NRDF යටතේ දැනුවත් කිරීමේ වැඩසටහන් හතරක් සංවිධානය කරන ලදී. ජාතික නවෝත්පාදන නියෝජ්‍යාතනය (NIA) සමඟ සහයෝගීත්වයෙන් 2024.04.03 දින සංවිධානය කරනු ලැබූ බුද්ධිමය දේපළ අයිතිවාසිකම් කළමනාකරණය කරගනිමින් පර්යේෂණ ප්‍රතිඵල වාණිජකරණය කිරීම කෙරෙහි අවධානය යොමු වූ වැඩසටහනක් සහ පර්යේෂණ සහ සංවර්ධන කටයුතු ඵලදායී ලෙස කළමනාකරණය කිරීම සඳහා කාර්ය සාධන දර්ශක භාවිතා කිරීම පිළිබඳ අමාත්‍යාංශ කාර්ය මණ්ඩලය සඳහා අදියර දෙකක වැඩසටහනක් මේ සඳහා ඇතුළත් විය. තවද රේගුවෙන් පර්යේෂණ උපකරණ නිදහස් කර ගැනීම පහසු කර ගැනීම පිළිබඳ දැනුම්වත් කිරීමේ වැඩසටහනක් ආයතන වෙනුවෙන් පවත්වන ලදී. පර්යේෂණ ප්‍රයත්නයන්, ජාතික ආර්ථික සංවර්ධන කාර්යය සමඟ අනුගත කිරීම සහ පර්යේෂණ හා නවෝත්පාදනවල කාර්ය සාධන ඇගයීම වැඩිදියුණු කිරීම මෙම මූලාරම්භයන්හි අරමුණ විය.

(ආ) නවීන විද්‍යා දැනුම ප්‍රවර්ධනය සඳහා විද්‍යා ඊ නිවුස් වෙබ් අඩවිය පවත්වාගෙන යාම සහ විද්‍යා ඊ නිවුස් ලිපි තරඟාවලිය සංවිධානය කිරීම

ශ්‍රී ලාංකිකයන් අතර නවීන විද්‍යාත්මක දැනුම සහ ඒවායේ යෙදවුම් ප්‍රචලිත කිරීමේ අරමුණ ඇතිව 2022 වර්ෂයේදී ත්‍රෛභාෂා වේදිකාවක් ලෙස ආරම්භ කරන ලද විද්‍යා ඊ නිවුස් (www.vidyaenews.mostr.gov.lk) වෙබ් අඩවිය ඔස්සේ 2023 වර්ෂයේදී සිංහල, දමිළ හා ඉංග්‍රීසි මාධ්‍ය ලිපි 200කට අධික ප්‍රමාණයක් පළ කර ඇති අතර 2024 වර්ෂය අවසන් වන විට පළ කර ඇති විද්වත් ලිපි ගණන 100 ඉක්මවා ඇත. කෘත්‍රිම බුද්ධිය, වර්ධිත යථාර්ථය, තාරකා විද්‍යාව සහ නැනෝ තාක්ෂණය වැනි ක්ෂේත්‍රවල දැනුම ද Facebook සහ YouTube හරහා බෙදා ගනු ලබන අතර ජාතික විද්‍යා දින සැමරුමේදී පුවත්පත් අතිරේකවල ජයග්‍රාහී ලිපි පළ කෙරෙන වාර්ෂික ලිපි තරඟයක් හරහා සිසුන් සහ මහජනතාව සම්බන්ධ කර ගැනේ. මෙම වෙබ් අඩවිය රජයේ විද්‍යාත්මක දැනුම සම්පත් වෙත ප්‍රවේශ වීමේ කේන්ද්‍රස්ථානයක් ලෙස ක්‍රියා කරන අතර ලිපි ඇගයීමේ කටයුතු සඳහා විශ්වවිද්‍යාල මහාචාර්යවරුන් සහ ප්‍රවීණයන් සම්බන්ධ කර ගනී.

- **ඉන්දු-ශ්‍රී ලංකා විද්‍යා සහ තාක්ෂණ සහයෝගිතාව**

2019 දී අත්සන් කරන ලද ඉන්දු-ශ්‍රී ලංකා සහයෝගීතා ඒකාබද්ධ වැඩසටහන යටතේ, ක්‍රියාත්මක කෙරෙන මූලාරම්භයන් අතරට විද්‍යාත්මක දැනුම හුවමාරු කර ගැනීම, ද්විපාර්ශ්වික සම්මන්ත්‍රණ සංවිධානය කිරීම, තරුණ විද්‍යාඥයින් පුහුණු කිරීම, පර්යේෂණ පත්‍රිකා ප්‍රකාශයට පත් කිරීම සහ පේටන්ට් බලපත්‍ර නිකුත් කිරීම ඇතුළත් වේ.

- *ඉන්දු-ශ්‍රී ලංකා ඒකාබද්ධ සහයෝගිතා වැඩසටහන - 2019*

පර්යේෂණ යෝජනා 08ක් සහ වැඩමුළු 01ක් සඳහා මූල්‍ය ප්‍රතිපාදන ලබා දෙන අතර 2024.03.22 දින තුන්වන ද්විවාර්ෂික ප්‍රගති සමාලෝචනය පවත්වන ලදී. උක් ගසෙහි පත්‍ර වල සුදු පුල්ලි රෝගය පාලනය කිරීම පිළිබඳ වැඩමුළුවක් දෙරටේම පර්යේෂකයන් සම්බන්ධ කර ගනිමින් පැලවත්ත උක් පර්යේෂණායතනයේදී දෙසැම්බර් මාසයේදී පවත්වන ලද අතර එහි ප්‍රතිඵල වගාකරුවන් සමඟ බෙදා ගන්නා ලදී. මීට අමතරව, මෝටර් රථ සන්නිවේදනය සඳහා ඒකාබද්ධ බහු-සම්මත ඇන්ටනා පිළිබඳ පර්යේෂණ වාණිජකරණය සඳහා ජාතික නවෝත්පාදන නියෝජ්‍යායතනය වෙත යොමු කරන ලදී. ඒ යටතේ පර්යේෂණ පත්‍රිකා 26ක් ප්‍රකාශයට පත් කරන ලද අතර දර්ශනපති උපාධිධාරීන් සිව් දෙනෙක් බිහි කරන ලදී.

- *ඉන්දු-ශ්‍රී ලංකා ඒකාබද්ධ සහයෝගිතා වැඩසටහන- 2024*

ඉන්දු - ශ්‍රී ලංකා ඒකාබද්ධ සහයෝගිතා වැඩසටහන - 2024 ආරම්භ කිරීම සඳහා පර්යේෂණ ව්‍යාපෘති යෝජනා කැඳවා ඉන් ලද යෝජනා 434 ඇගයීම් ක්‍රියාවලිය ආරම්භ කර ඇත.

- **විද්‍යාව ප්‍රචලිත කිරීම**

පාසල් සහ විශ්ව විද්‍යාල සිසුන් ඇතුළු ශ්‍රී ලාංකිකයින් අතර විද්‍යාත්මක සාක්ෂරතාව වැඩිදියුණු කිරීම සඳහා විද්‍යාත්මක හා තාක්ෂණික දැනුම ප්‍රවර්ධනය කිරීම අමාත්‍යාංශයේ පර්යේෂණ හා නවෝත්පාදන අංශය වෙත පැවරී ඇති කාර්යයකි.

- *2023 ලෝක විද්‍යා දිනයට සමගාමීව අමාත්‍යාංශය යටතේ ඇති ආයතන සමඟ එක්ව ජාතික විද්‍යා දින සැමරුම් සංවිධානය කිරීම.*

"විද්‍යාත්මක සවිබල ගැන්වීම හරහා සෞභාග්‍යය කරා" යන තේමාව යටතේ ජාතික විද්‍යා දින ප්‍රදර්ශනය 2023 නොවැම්බර් 8-10 දිනයන්හිදී ජාතික ස්වභාවික විද්‍යා කෞතුකාගාරයේදී පවත්වන ලදී. එම ප්‍රදර්ශනය ඉදිකිරීමට සැලසුම් කර ඇති ජාතික විද්‍යා මධ්‍යස්ථානයේ අනුරුවක් ලෙස පවත්වන ලද අතර සිසුන්, පර්යේෂකයන් සහ මහජනතාව ඇතුළුව 8,000 කට අධික පිරිසක් ආකර්ෂණය කර ගනිමින් විශ්ව විද්‍යාල සහ

පාර්ශ්වකරුවන්ගේ දායකත්වයෙන් පැවැත්විණි. නොවැම්බර් 10 වැනිදා අධ්‍යාපන අමාත්‍යවරයාගේ සහභාගිත්වයෙන් මෙය පවත්වන ලදී.

- *ජාතික විද්‍යා දින සැමරුම් - 2024*

අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතේ පර්යේෂණ හා සංවර්ධන ආයතන සම්බන්ධීකරණය කර ගනිමින් 2024 විද්‍යා දින සැමරුම් උත්සවය පවත්වන ලදී.

- **පර්යේෂණ ව්‍යාපෘති සඳහා පහසුකම් සැලසීම**

පර්යේෂණ අංශය විසින් ජාතික පර්යේෂණ ව්‍යාපෘතිවල දත්ත එක්රැස් කිරීම, සුරක්ෂිත කිරීම සහ පහසුකම් සැලසීම කෙරෙහි අවධානය යොමු කරන අතරම පර්යේෂණ ප්‍රතිඵල සඳහා වෙළඳපොළක් ප්‍රවර්ධනය කරයි.

- *අමාත්‍යාංශයේ විෂය පථය යටතේ පර්යේෂණ ආයතන සහ ද්විපාර්ශ්වික, බහුපාර්ශ්වික සහයෝගිතා පර්යේෂණ මගින් සිදුකරන පර්යේෂණ අධීක්ෂණය සහ ඇගයීම සඳහා ක්‍රියා පටිපාටියක් ස්ථාපිත කිරීම සහ පවත්වාගෙන යාම.*

රජයේ පර්යේෂණ ආයතන ලියාපදිංචි කිරීම සහ විනිවිදභාවය සහතික කරමින් හා ද්විකරණය වීම වළක්වාලමින් පර්යේෂණ දත්ත කළමනාකරණය කිරීම සඳහා ජාතික පර්යේෂණ කළමනාකරණ තොරතුරු පද්ධති මූලාකෘතියක් සකසා අවසන් කර ඇත. මෙම පද්ධතිය ක්‍රියාත්මක කිරීම සඳහා විශ්ව විද්‍යාල සමඟ සාකච්ඡා සිදුවෙමින් පවතින අතර පර්යේෂණ ප්‍රදාන සඳහා අයදුම් කරනු පිණිස මෙම වේදිකාව භාවිතා කිරීමට යෝජිතය.

- *කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 02/2014 අනුව පර්යේෂණ දීමනා ගෙවීම සඳහා පර්යේෂණ සමාලෝචනය.*

පර්යේෂණ විෂය භාර අමාත්‍යාංශය විසින් රජයේ නිලධාරීන්ට පර්යේෂණ දීමනා ගෙවීම සඳහා පර්යේෂණ කළමනාකරණ කමිටුව සහ පර්යේෂණ අධීක්ෂණ කමිටුව කැඳවා පර්යේෂණ යෝජනා ඇගයීමට ලක් කර නිර්දේශ ලබා දෙනු ඇත. 2023 වසරේදී, කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 02/2014 යටතේ දීමනා ගෙවීම සඳහා පර්යේෂණ ව්‍යාපෘති 24 ක් ඇගයීමට ලක් කරන ලද අතර, කමිටු රැස්වීම් තුනක් පවත්වන ලදී. 2024 වසරේ දී, ව්‍යාපෘති 26 ක් සමාලෝචනය කිරීම, මාර්ගෝපදේශයක් නිකුත් කිරීම සිදු කරන ලද අතර, පර්යේෂණ අධීක්ෂණ කමිටු රැස්වීමක් මගින් සම්පූර්ණ කරන ලද ව්‍යාපෘති ඇගයීමට ලක් කරන ලදී. අධීක්ෂණ කමිටුව වෙත නව සාමාජිකයින් පත් කරන ලදී.

- *අමාත්‍යාංශයේ විෂය පථය යටතේ ඇති පර්යේෂණ ආයතන මගින් සිදු කරනු ලබන පර්යේෂණ අධීක්ෂණය සහ ඇගයීම.*

ජාතික නවෝත්පාදන නියෝජ්‍යාතනය හරහා මූලික ඇගයීම් සම්පූර්ණ කරගනිමින් 2024 දී සිදු කරන ලද පර්යේෂණ ව්‍යාපෘති 177 ක් පිළිබඳ දත්ත සම්පාදනය කරන ලදී. ද්වි-වාර්ෂික ප්‍රගතිය වාර්තා කරන ලෙස ආයතනවලට උපදෙස් දෙන ලද අතර 2025 පර්යේෂණ සැලැස්ම සකස් කිරීම සඳහා කාල රාමුවන් නිකුත් කරන ලදී.

2.1.2. ජාත්‍යන්තර සබඳතා අංශය

1. **විද්‍යාත්මක පුහුණුව**

ඉන්දියානු පාර්ශවයෙන් අයදුම්පත් කැඳවීමෙන් පසු ශ්‍රී ලංකාව සඳහා වන ඉන්දියානු විද්‍යා සහ පර්යේෂණ අධිශිෂ්‍යත්ව (ISRF) වැඩසටහනට ප්‍රචාරණය සැපයීම.

2. ද්විපාර්ශ්වික සහ බහුපාර්ශ්වික සහයෝගීතාවය යටතේ විද්‍යා සහ තාක්ෂණ සහයෝගීතාව

රට	ප්‍රගතිය
ඕස්ට්‍රේලියාව	- ශ්‍රී ලංකාවේ ජාතික මූලික අධ්‍යයන ආයතනය (NIFS) සමඟ කඩිනම් සහ පිරිවැය ඵලදායී පාංශු මිනුම් ප්‍රවේශයන්/ පාංශු කාබනික ද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳව පර්යේෂණ ක්ෂේත්‍රයේ සහයෝගීතාවයක් ඇති කර ගනු පිණිස, විදේශ කටයුතු අමාත්‍යාංශය සහ ඕස්ට්‍රේලියාවේ ශ්‍රී ලංකා මහ කොමසාරිස්වරයා හරහා ජාත්‍යන්තර කෘෂිකර්ම පර්යේෂණ සඳහා වන ඕස්ට්‍රේලියානු මධ්‍යස්ථානය (ACIAR) වෙතින් 2023.06.09 දින ඉල්ලීමක් කරන ලදී. ඒ අනුව කැන්බරා හි ශ්‍රී ලංකා මහ කොමසාරිස්වරයා විසින් මෙම ඉල්ලීම ACIAR වෙත ලිඛිතව දන්වා ඇත. - ඕස්ට්‍රේලියානු ප්‍රතිපත්ති සහ විද්‍යා ආයතනය (AIPS) සහ ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව (NASTEC) අතර සහයෝගීතාව ගොඩනැගීම සඳහා විදේශ කටයුතු අමාත්‍යාංශය වෙත 2024.10.25 දින සංකල්ප සටහනක් යොමු කරන ලදී.
චීනය	චීනයේ වුහාන් පොලිටෙක්නික් විශ්ව විද්‍යාලය සමඟ ඒකාබද්ධ රසායනාගාරයක් පිහිටුවීම සම්බන්ධයෙන් සාකච්ඡාවන් සිදුකෙරෙමින් පවතී.
කියුබාව	කියුබාවේ විද්‍යා, තාක්ෂණ හා පරිසර අමාත්‍යාංශය සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම සඳහා සංකල්ප පත්‍රිකාවක් ඉදිරිපත් කරන ලදී. • උක් පර්යේෂණ සහයෝගිතා • එන්නත් වැඩිදියුණු කිරීම
ජෝර්ජියාව	ජෝර්ජියාව සමඟ එළැඹීමට නියමිත අවබෝධතා ගිවිසුමේ සංශෝධිත කෙටුම්පත විදේශ කටයුතු අමාත්‍යාංශය වෙත ලබා දී ඇත.
නේපාලය	නේපාලය - ශ්‍රී ලංකා පළමු ඒකාබද්ධ කමිටු රැස්වීම (JCM) සංකල්ප පත්‍රිකාව විදේශ කටයුතු අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරනු ලැබ ඇත.
නවසීලන්තය	ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව (NASTEC) සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම සඳහා වන සංකල්ප පත්‍රිකාව Massey University (NZ) වෙත ඉදිරිපත් කරන ලදී
දකුණු අප්‍රිකාව	දකුණු අප්‍රිකා-ශ්‍රී ලංකා සහයෝගිතාවන් ස්ථාපනය කර ගනු පිණිස අතථ්‍ය රැස්වීම් කැඳවන ලදී:- • නැනෝ තාක්ෂනය - 17.07.2024 (SLINTEC – Mintek) • නවෝත්පාදන - 31.07.2024 (NIA - TIA) • ආහාර, කෘෂිකර්මය, ජල කළමනාකරණය - 28.10.2024 (NIFS – CSIR/ TIA)
දකුණු කොරියාව	විශේෂඥ දැනුම හුවමාරුව, නවෝත්පාදන සහ විද්‍යා ප්‍රතිපත්ති ප්‍රවර්ධනය කිරීම උදෙසා අරමුදල් සැපයීම සඳහා සංකල්ප පත්‍රිකාවක් දකුණු කොරියාවේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය වෙත ඉදිරිපත් කරන ලදී. උදා : සහයෝගීතා නියෝජිතායතනයන් • කොරියානු උසස් විද්‍යා හා තාක්ෂණ ආයතනය (KAIST) • කොරියානු බුද්ධිමය දේපල ප්‍රවර්ධන ආයතනය (KIIPP) NASTEC විසින් සකස් කරන ලද යෝජනාවක් විදේශ සම්පත් දෙපාර්තමේන්තුව (ERD) හරහා කොරියානු පාර්ශ්වය වෙත යැවීමට ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව (NPD) වෙත යොමු කරන ලදී

ස්වීඩනය	ජාතික නවෝත්පාදන නියෝජ්‍යායතනය (ශ්‍රී ලංකාව) සහ ස්වීඩනයේ **VINNOVA** ආයතනය අතර සහයෝගීතාවයක් ගොඩනැගීමට අදාළ කාර්යයන් සම්බන්ධීකරණය කිරීම. ස්ටොක්හෝම් හි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය විසින් වැඩිදුර සහයෝගීතාවයන් සඳහා ආරම්භක පියවරක් ලෙස **2025** ස්වීඩන් නවෝත්පාදන දිනයට සහභාගී වන ලෙස **NIA** වෙත ආරාධනා කර ඇත.
තායිලන්තය	ශ්‍රී ලංකාවේ විද්‍යා, තාක්ෂණ හා නවෝත්පාදන ආයතන සමඟ අත්සන් කරන ලද අවබෝධතා ගිවිසුම මත පදනම්ව තායිලන්ත විද්‍යා හා තාක්ෂණ දෙපාර්තමේන්තුව අතර සහයෝගීතාව ගොඩනැගීම සඳහා **2024.09.20** දින තායිලන්ත තානාපති කාර්යාලය වෙත ඉල්ලීමක් කරන ලදී. ශ්‍රී ලංකාවේ විද්‍යා, තාක්ෂණ හා නවෝත්පාදන ආයතන සමඟ සහයෝගීතාවයන් ගොඩනැගීම සඳහා **2024.10.15** දින ආසියානු තාක්ෂණ ආයතනය (**AIT**) සමඟ නිල නොවන මට්ටමේ රැස්වීමක් පවත්වන ලද අතර සංකල්ප පත්‍රිකාවක් ඉදිරිපත් කෙරිණි. මේ සම්බන්ධව සාකච්ඡා සිදු කෙරෙමින් පවතී.

3. ඉන්දු - ශ්‍රී ලංකා ඒකාබද්ධ පර්යේෂණ වැඩසටහන

පර්යේෂණ යෝජනා කැඳවීම

- ශ්‍රී ලංකා පාර්ශ්වය වෙත පර්යේෂණ යෝජනා 448 ක් ලැබී ඇත.
- දෙපාර්ශවයම විසින් ලද මුළු යෝජනාවන්හි එකතුව 431 කි.
- යෝජනා ඇගයීම් ක්‍රියාවලියේ පවතී

ඉන්දු - ශ්‍රී ලංකා ඒකාබද්ධ පර්යේෂණ වැඩසටහන යටතේ වැඩමුළු යෝජනා කැඳවීම

- වැඩමුළු යෝජනා 208ක් ලැබී ඇත.
- යෝජනා ඇගයීම් ක්‍රියාවලියේ පවතී

4. බෙන්ගාල බොක්ක ආශ්‍රිත රටවල බහු ආංශික තාක්ෂණික හා ආර්ථික සහයෝගීතාවය පිළිබඳ මූලාරම්භය යටතේ තාක්ෂණ පැවරුම් පහසුකම (BIMSTEC TTF) ස්ථාපනය හා සම්බන්ධිත කටයුතු සම්බන්ධීකරණය කිරීම, BIMSTEC යටතේ 02 වැනි විද්‍යා, තාක්ෂණ සහ නවෝත්පාදන සහයෝගිතාව පිළිබඳ විශේෂඥ කණ්ඩායම් හමුව (EG-STIC) පැවැත්වීම

- BIMSTEC විද්‍යා, තාක්ෂණ සහ නවෝත්පාදන සහයෝගිතාව පිළිබඳ විශේෂඥ කණ්ඩායමේ 02 වන රැස්වීම 2024 ජූලි 25 - 26 දිනයන්හිදී ශ්‍රී ලංකාවේ කොළඹදී පැවැත්විණි.
- BIMSTEC TTF හි පළමු පාලක මණ්ඩල රැස්වීම සඳහා තාවකාලික දිනය (30.01.2025) විදේශ කටයුතු අමාත්‍යාංශය හරහා සාමාජික රටවල් වෙත දැනුම් දෙනු ලැබිණි.

5. සකස් කරන ලද සංකල්ප පත්‍රිකා සඳහා IORA ලේකම් කාර්යාලයේ අනුමැතිය ලබා ගැනීම

- සාගර විශ්වවිද්‍යාලය සහ ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනය (NARA) විසින් පර්යේෂණ ව්‍යාපෘති 02ක් සම්බන්ධයෙන් සංකල්ප සටහන් 02ක් සකස් කරන ලදී.
- IORA ලේකම් කාර්යාලය විසින් 2024.10.24 දින සංකල්ප සටහන් අනුමත කරන ලදී.

6. න්‍යෂ්ටික පර්යේෂණ සහයෝගිතාව සඳහා වූ යුරෝපීය සංවිධානය යටතේ ක්‍රියාකාරකම් සිදු කිරීම

- අධ්‍යාපන අමාත්‍යාංශයේ විදේශ නියෝජිතායතන සහ විදේශ කටයුතු අංශය වෙත CERN ගුරු පුහුණු වැඩසටහන් පිළිබඳ තොරතුරු සපයනු ලැබිණි.

7. නොබැඳි සහ අනෙකුත් සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහා වන විද්‍යා හා තාක්ෂණ මධ්‍යස්ථානය (NAM S&T Centre)

ශ්‍රී ලංකාවේ කේන්ද්‍රස්ථානය ලෙස කටයුතු කරනු ලබන ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ (NASTEC) සහාය ඇතිව වැඩසටහන් සම්බන්ධීකරණය කෙරේ.

නිශ්චිත දර්ශක	2024		
	ඉලක්කගත	අත්කරගත් සාර්ථකත්වය	ප්‍රතිශතය
ප්‍රදානය කරනු ලැබූ පර්යේෂණ අධිශිෂ්‍යත්ව සංඛ්‍යාව	10	2024 වර්ෂය සඳහා ප්‍රදානය කෙරෙනු ලබන අධිශිෂ්‍යත්ව සංඛ්‍යාව පිලිබඳ ඉන්දියානු පාර්ශ්වය විසින් දැනුම් දීම කල යුතුය.	0%
සකස් කරනු ලැබූ සංකල්ප පත්‍රිකා සංඛ්‍යාව	02	05	100%

2.1.3. සූර්ය පැනල මූලාකෘති නිෂ්පාදනය පිලිබඳ අධ්‍යාපනික පුහුණු ව්‍යාපෘතිය

"සූර්ය පැනල මූලාකෘති නිෂ්පාදනය පිලිබඳ අධ්‍යාපනික පුහුණු ව්‍යාපෘතිය" අමාත්‍ය මණ්ඩල අනුමැතිය යටතේ 2017 වසරේදී ආරම්භ කරන ලදී. NPD විසින් අනුමත කරනු ලැබ ශ්‍රී ලංකා රජය විසින් අරමුදල් සපයා දෙනු ලැබූ මෙම ව්‍යාපෘතියෙහි සමස්ත ඇස්තමේන්තුගත අයවැය රු මිලියන 240 කි. මෙම ව්‍යාපෘතිය ,ව්‍යාපෘති යෝජනාවෙහි සඳහන් කර ඇති පරිදි සූර්ය බල ශක්ති ක්ෂේත්‍රයේ දේශීය විද්‍යාඥයින් සහ කාර්මික ශිල්පීන්ගේ ධාරිතා ගොඩනැංවීමේ ව්‍යාපෘතියකි. අවශ්‍ය පර්යේෂණ යටිතලයන් (උපකරණ) වැඩිදියුණු කිරීමද මෙම ධාරිතා ගොඩනැංවීම සඳහා අවශ්‍ය කෙරෙන අත්‍යාවශ්‍ය අංගයකි.කැලණිය විශ්වවිද්‍යාලයෙහි පිහිටුවා ඇති ව්‍යාපෘති කාර්යාලය හරහා අමාත්‍යාංශය විසින් මෙම ව්‍යාපෘතියෙහි පරිපාලන කටයුතු සිදු කෙරෙන අතර යාපනය,කැලණිය සහ පේරාදෙණිය යන විශ්වවිද්‍යාලයන්හි ක්‍රියාත්මක කෙරේ. ආරම්භක ව්‍යාපෘති කාල සීමාව 2017 -2021 දක්වා වූ අතර පසුව NPD අනුමැතිය යටතේ 2022 වර්ෂය සඳහාද 2023 වර්ෂයේ දෙසැම්බර් මස 31 දක්වා අමාත්‍ය මණ්ඩල තීරණයකට අනුව දීර්ඝ කරනු ලැබිණි.

ව්‍යාපෘතියෙහි කාර්යයන්

- සූර්ය බලශක්තිය සහ ඒ ආශ්‍රිත තාක්ෂණයන් පිලිබඳ නිපුණතා සහිත තරුණ තරුණියන් 2000ක පමණ පිරිසකගෙන් සැදුම් ලත් ලෝක මට්ටමේ ශ්‍රම බලකායක් (සූර්ය බලශක්ති කාර්මික ශිල්පීන්) පුහුණු කිරීම
- සූර්ය බලශක්තිය සහ එහි යෙදවුම් පිලිබඳ පාසල් සිසුන් සහ ගුරුවරුන් 2000ක් දැනුම්වත් කිරීම.
- සූර්ය පැනල මූලාකෘති නිෂ්පාදනය සඳහා පර්යේෂණ සහ පුහුණු පහසුකම් සංවර්ධනය කිරීම සහ තුනී පටල සූර්ය කෝෂ පිලිබඳ දර්ශනපති/ආචාර්ය උපාධි ශිෂ්‍යයින් 8 දෙනෙකු පුහුණු කිරීම

ප්‍රගතිය

- **සූර්ය බලශක්තිය පිලිබඳ ප්‍රායෝගික අත්දැකීමක් ලබා දීමේ අරමුණින් සූර්ය බලශක්තිය පිලිබඳ දැනුම්වත් කිරීමේ වැඩසටහන සියලුම පලාත්වල පාසල් පදනම් කර ගනිමින් සාර්ථකව පවත්වනු ලැබිණි.**

විකල්ප පුනර්ජනනීය විදුලි බල ප්‍රභවයක් ලෙස සූර්ය බලශක්තිය භාවිතා කිරීම පිලිබඳ උතුරු හා නැගෙනහිර ප්‍රදේශ ඇතුලත්ව දිවයිනෙහි විවිධ දිස්ත්‍රික්කයන්හි පාසල් 48ක් සඳහා සිසුන් 3277ක් ආවරණය වන පරිදි පාසල් මට්ටමේ දැනුම්වත් කිරීමේ වැඩසටහන් 36ක් සම්පූර්ණ කරන ලදී. 2019 සහ 2020 වර්ෂයන්හිදී අමාත්‍යාංශය සහ විශ්වවිද්‍යාල විසින් සංවිධානය කරනු ලැබූ ජාතික මට්ටමේ ප්‍රදර්ශන තුනකදී පවත්වනු ලැබූ මෙම දැනුම්වත් කිරීමේ වැඩසටහන හරහා පාසල් සිසුන් රාශියක් සඳහා ප්‍රතිලාභ අත්විය. මෙයට අමතරව සාමාන්‍ය පෙළ සහ උසස් පෙළ පාසල් ගුරුවරුන් 38 දෙනෙකු සඳහා ගුරුවරුන් දැනුම්වත් කිරීමේ වැඩසටහනක් ද පවත්වන ලදී.

- **NVQ 3 සහ 4 මට්ටමේ සූර්ය ප්‍රකාශ වෝල්ටීය පද්ධති කාර්මික ශිල්පී පුහුණු වැඩසටහන**

මෙම පුහුණු වැඩසටහන, සූර්ය පැනල මූලාකෘති නිෂ්පාදන පිළිබඳ අධ්‍යාපනික පුහුණු වැඩසටහන යටතේ ශ්‍රී ලංකාව තුළ ප්‍රථම වරට ක්‍රියාත්මක කරන ලද මූලාරම්භයක් වේ.

අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලත් යෝජනාවේ දක්වා ඇති පරිදි, ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය (NAITA) සහ ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය (SLSEA)සමඟ සහයෝගීතාවයෙන් දිවයිනේ ප්‍රථම වරට NVQ 3 සහ 4 මට්ටමේ සූර්ය බලශක්ති කාර්මික ශිල්පී පුහුණු වැඩසටහන සකස් කර ක්‍රියාත්මක කිරීමේ කාර්යයේදී ව්‍යාපෘති කණ්ඩායම විසින් ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරන ලදී. NAITA ආයතනයට මෙම කාණ්ඩය සඳහා විෂය මාලාවක් සහ පුහුණු වැඩසටහනක් අවශ්‍ය වූ බැවින් ව්‍යාපෘති කණ්ඩායම විසින් මෙම පාඨමාලාව සඳහා සම්පූර්ණ විෂය මාලාවම සකස් කරන ලදී. මෙම වැඩසටහන මාස 5ක සිද්ධාන්ත,මාස 12ක රැකියා පුහුණුව (OJT) සහ හම්බන්තොට සූර්ය බලශක්ති උද්‍යානයෙහි මාස 1ක උසස් පුහුණුවකින් සමන්විත වේ. මෙයට අමතරව NVQ 4 මට්ටමේ සූර්ය බලශක්ති කාර්මික ශිල්පී පුහුණු වැඩසටහන පැවැත්වීම සඳහා තෝරාගත් NAITA කාර්ය මණ්ඩල සාමාජිකයින් සඳහා පුහුණුකරුවන් පුහුණු කිරීමේ (ToT) වැඩසටහනක්ද පවත්වනු ලැබිණි.
සිසුන් 107 දෙනෙකුගෙන් සමන්විත පළමු කණ්ඩායම විසින් 2021 මැයි මසදී ඔවුන්ගේ NVQ 4 මට්ටමේ සූර්ය බලශක්ති කාර්මික ශිල්පී පාඨමාලාවේ පුහුණු කොටස සම්පූර්ණ කරන ලදී. NAITA සහ SLSEA යන ආයතනයන්හි සහයෝගීතාවයෙන් මෙම පුහුණු වැඩසටහන ක්‍රියාත්මක කරනු ලැබිණි. තවද NVQ පුහුණු ලාභීන් 84 දෙනෙකු විසින් ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියෙහි සහයෝගීතාවය යටතේ හම්බන්තොට සූර්ය බලශක්ති උද්‍යානයෙහි උසස් පුහුණු වැඩසටහනක් (ප්‍රායෝගික සැසියක්) සම්පූර්ණ කරනු ලැබිණි.

එබැවින් මෙම ව්‍යාපෘතිය, තෘතීය සහ වෘත්තීය අධ්‍යාපන කොමිසම (TVEC) සමඟ ඇතිකර ගනු ලැබූ සහයෝගීතාවය යටතේ NVQ 3 සහ 4 මට්ටමේ සූර්ය බලශක්ති කාර්මික ශිල්පී පුහුණු වැඩසටහන තක්සේරු කිරීම සඳහා තක්සේරුකරුවන් 4 දෙනෙකු පුහුණු කිරීම සිදු කරන ලදී. ඉදිරියේදී පවත්වනු ලබන ඊළඟ පුහුණුව සඳහා අයදුම්පත් 8ක් පමණ ලැබී ඇති අතර ඒවා TVEC වෙත ඉදිරිපත් කරනු ලැබ ඇත. හම්බන්තොට සූර්ය බලශක්ති උද්‍යානයේදී පවත්වනු ලැබූ අවසන් තක්සේරු කිරීමෙන් අනතුරුව, අයදුම්කරුවන් 35 දෙනෙකු NVQ 4 මට්ටමේ සුදුසුකම් සහිතව උපාධි ලබා ඇති අතර 30 දෙනෙකු NVQ 3 මට්ටමේ සුදුසුකම් සහිතව උපාධි ලබා ඇත. මෙම උපාධිලාභීන් සඳහා නිල උපාධි ප්‍රදානෝත්සවය 2022 අගෝස්තු 22 වන දින පැවැත්විණි.

NVQ 4 මට්ටමේ සූර්ය බලශක්ති කාර්මික ශිල්පී පුහුණු වැඩසටහන සඳහා සිසුන් දෙවන කණ්ඩායම NAITA මධ්‍යස්ථාන 9ක දී අයදුම්කරුවන් 136 දෙනෙකු සඳහා ආරම්භ කරන ලදී. ව්‍යාපෘතිය අවසානයේදී නව NVQ 3 සහ 4 මට්ටමේ සහතික ලත් සූර්ය බල ශක්ති කාර්මික ශිල්පීන් 71 දෙනෙකු සාර්ථකව පුහුණු කර උපාධි ලබා ගන්නා ලදී. ව්‍යාපෘති කණ්ඩායමේ සහායයෙන් දැනටමත් කර්මාන්තයෙහි නියැලී සිටින කාර්මික ශිල්පීන් සඳහා NVQ 3 මට්ටමේ සහතිකකරණය ලබා දීම සඳහා NVQ RPL වැඩසටහන පැවැත්වීම SLSEA විසින් දැනටමත් ආරම්භ කර ඇත. NAITA විසින් මෙම වැඩසටහන සඳහා වාර්ෂිකව නව අයදුම්කරුවන් බඳවා ගැනීම ආරම්භ කර ඇති අතර, SLSEA විසින් ව්‍යාපෘති නිලධාරීන්ගේ මගපෙන්වීම යටතේ RPL වැඩසටහන ආරම්භ කර ඇත. එහි ප්‍රතිඵලයක් වශයෙන්, දැනට ක්‍රියාත්මකව පවතින රජයේ පුහුණු ආයතන තුළ මෙම ව්‍යාපෘති සංරචකයේ තිරසාරභාවය දැනටමත් සුරක්ෂිත කර ඇත.

- **ව්‍යාපෘති අරමුදල් යොදාගනිමින් සහභාගී වන විශ්ව විද්‍යාල සඳහා මිල දී ගත් ප්‍රධාන පර්යේෂණ උපකරණ පහත පරිදි වේ:**
  - Closed Space Sublimation (CSS) System
  - Atomic Force Microscope
  - Tube Furnace
  - Solar simulator
  - De-ionized (DI) water systems
  - Heating water bath circulators
  - Plasma cleaners
  - Ultrasonic cleaners

- **පර්යේෂණ සහකාර (සහභාගී වන විශ්ව විද්‍යාලවලදී පූර්ණ කාලීන පර්යේෂණ පුහුණුව)**
  යාපනය - 1 (දර්ශනපති උපාධි - සම්පූර්ණ කිරීමට නියමිතව ඇත.)
  කැලණිය - 2 (1 ආචාර්ය උපාධියක් සහ 1 දර්ශනපති උපාධියක් සම්පූර්ණ කර ඇත.)
  පේරාදෙණිය - 2 (1 ආචාර්ය උපාධියක් සම්පූර්ණ කර ඇති අතර 1 දර්ශනපති උපාධියක් සම්පූර්ණ කිරීමට නියමිතව ඇත.)

මෙම දර්ශනපති/ ආචාර්ය සිසුන් පස්දෙනා විසින් 2017 සිට 2024 දක්වා තුනී පටල සූර්ය කෝෂ සම්බන්ධ නව පර්යේෂණ සොයාගැනීම් පිළිබඳ සඟරා ලිපි 19ක්, පොත් පරිච්ඡේදයක් සහ සාරාංශ 21ක් ප්‍රකාශයට පත් කර ඇත. මෙම ව්‍යාපෘතිය විසින් තුනී පටල සූර්ය පැනල මූලාකෘති දෙකක් සාර්ථකව නිර්මාණය කරනු ලැබ 2021 වසරේ පැවති විද්‍යා සතිය වැඩසටහනේදී ප්‍රදර්ශනය කරන ලදී. සම්පූර්ණ කරන ලද පර්යේෂණ සහ සංවර්ධන ප්‍රතිඵල මත පදනම්ව විද්‍යාගාර පරිමාණයේ මූලාකෘති පැනල නිෂ්පාදනය කිරීමට සියලුම පර්යේෂණ සහකාරවරුන් සහ නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂවරුන් විසින් සහයෝගතාවයෙන් කටයුතු කරන ලදී.

මෙම මූලාකෘති සූර්ය පැනල 2024 පෙබරවාරි 2 වන දින කැලණිය විශ්වවිද්‍යාලයේ ප්‍රධාන ව්‍යාපෘති කාර්යාලයේදී ප්‍රදර්ශනය කරන ලදී.



2.1.4. ජෛව පොහොර භාවිතය හරහා නිසරු වූ බිම් සාරවත් භාවයට පත්කිරීම

ජාතික මූලික අධ්‍යයන ආයතනය විසින් රනිල කුලයට අයත් බෝග සහ රනිල නොවන බෝග සඳහා ජෛව පොහොර දෙකක් නිපදවා ඇත. ඒවා පිළිවෙලින් Rhizobium Bio Fertilizer (RBF) සහ Biofilm Bio Fertilizer (BFBF) වේ.වී වගාවේදී BFBF භාවිතා කිරීමෙන් NPK රසායනික පොහොර 50% දක්වා අඩු කළ හැකි බව මේ දක්වා පෙන්නුම් කර ඇත. එසේම, වී වගාවේදී භාවිතා කිරීම සඳහා කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් වී වගාවේදී BFBF භාවිතා කිරීම මේ වනවිට නිර්දේශ කර ඇත. 2022/2023 මහ කන්නය සහ 2023 යල කන්නවලදී, කුරුණෑගල, ගාල්ල, ගම්පහ, කිලිනොච්චිය, වවුනියාව, මුලතිව් සහ මන්නාරම යන දිස්ත්‍රික්කවල වී වගා කෙරෙන අක්කර 285,000 ක් සඳහා BFBF බෙදා දෙන ලදී. එසේම, 2023 යල කන්නයේදී වී වගාව සඳහා රසායනික පොහොර අඩු මාත්‍රාවක් සහිත කැට පොහොර සහ BFBF භාවිතය (නව පොහොර තාක්ෂණය) පිළිබඳ අත්හදා බැලීම් වැලිකන්ද සහ දෙහිඅත්තකණ්ඩිය ප්‍රදේශවල සිදු කර අස්වැන්න නෙළා ගන්නා ලදී. මීට අමතරව, 2020 වර්ෂයේදී අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී ඇති පරිදි දීප ව්‍යාප්ත වී වගාවන් සඳහා BFBF භාවිතය ප්‍රවර්ධනය කිරීම උදෙසා අම්පාර සහ පොළොන්නරුව දිස්ත්‍රික්කවල ගොවි ක්ෂේත්‍ර පරීක්ෂාවන් සහ ආදර්ශන පවත්වන ලදී. 2023 සැප්තැම්බර් දක්වා, සෝයා බෝංචි, එළවළු බෝංචි සහ මුං බෝංචි වගාවන් අක්කර 5,200 ක් සඳහා RBF බෙදා දෙන ලදී.

2024 වර්ෂය තුළදී, මෙම ව්‍යාපෘතිය ආහාර සුරක්ෂිතතාව සහ කෘෂිකර්මය පිළිබඳ පාර්ලිමේන්තු ආංශික අධීක්ෂණ කාරක සභාවට (SOC) සම්බන්ධ කිරීම හරහා ජාතික මට්ටම දක්වා ගෙන යන ලදී. 2024 යල කන්නය තුළ SOC විසින් උපදෙස් ලබා දී ඇති පරිදි, නව පොහොර තාක්ෂණය භාවිතයෙන් දීප ව්‍යාප්ත මට්ටමින් ගොවීන්ගේ වී වගාවේ ක්ෂේත්‍ර ආදර්ශන පළාත් 7 ක සහ මහවැලි ජනපද 3 ක පවත්වන ලදී. මෙලෙස ක්ෂේත්‍ර ආදර්ශන සිදු කරනු ලැබූ ස්ථාන වලින් 90%කම පමණ ප්‍රතිඵලවලින් පෙන්නුම් කර ඇත්තේ 100%ක් රසායනික පොහොර යෙදීමේ සාම්ප්‍රදායික ක්‍රමයට සාපේක්ෂව නව පොහොර තාක්ෂණය ඇසුරින් වැඩි වී අස්වැන්නක් ලැබී ඇති බවයි. පරිසර හිතකාමී නව පොහොර තාක්‍ෂණ ක්‍රම පිළිබඳව මෙරට පවත්වනු ලබන විශාලතම ක්ෂේත්‍ර වැඩසටහන මෙය වේ. මෙම වැඩසටහන රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වයක් හරහා දිවයින පුරා ව්‍යාප්ත කිරීමට සැලසුම් කර ඇත. අමාත්‍යාංශය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව ඇතුළු කෘෂිකර්මාන්තයේ සියලුම පාර්ශ්වකරුවන් මෙම වැඩසටහන සඳහා සහභාගී වේ. මහ 2024/2025 කන්නය මේ වන විට ආරම්භ වී ඇති බැවින් පවත්වනු ලබන අත්හදා බැලීම් සඳහා සුදුසු කුඹුරු හඳුනා ගනිමින් පරිසර හිතකාමී පොහොර ලබා දෙමින් පවතී.

2.1.5. රොබෝ තාක්ෂණ යෙදවුම් විශිෂ්ටතා මධ්‍යස්ථානය (CERA)

2024 වසරේදී අංක 2412/08 හා 2024.11.25 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් මෙම ආයතනය අමාත්‍යාංශය යටතට පත් කර ඇත. කර්මාන්ත අමාත්‍යාංශය යටතට ගැනෙන කාර්මික සංවර්ධන මණ්ඩලය සමග සාකච්ඡාවක් පවත්වා ඉදිරියේදී CERA කාර්යක්ෂමව පවත්වා ගෙන යාමේ ක්‍රමවේදයක් හඳුනා ගැනීමේ අවශ්‍යතාවය කෙරෙහි අවධානය යොමු විය.

2.1.6. විදාතා ඒකකය

හැඳින්වීම

2000 වර්ෂයේදී ජාතික මට්ටමින් ආරම්භ කරන ලද විදාතා වැඩසටහන, විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය යටතේ ඇති පර්යේෂණ ආයතනවලින් විද්‍යාත්මක දැනුම හා තාක්ෂණය බිම් මට්ටමේ ප්‍රජාවන් වෙත රැගෙන යමින් ජාතික සංවර්ධනය සහ නවෝත්පාදනය ප්‍රවර්ධනය කරයි. එය නාගරික සහ ප්‍රජාවන් අතර පවතින තාක්ෂණික පරතරය සඳහා විසඳුම් සපයා දෙමින් , අගය එකතු කිරීම හරහා සම්පත් භාවිතය ප්‍රශස්ත කිරීමට පුද්ගලයින් සවි බල ගැන්වීම හරහා රටේ ආර්ථික වර්ධනයට දායක වන අතර ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ගේ ජීවනෝපායන් වැඩි දියුණු කරයි.

2024.11.25 දිනැති 2412/08 අංක දරන අතිවිශේෂ ගැසට් පත්‍රය අනුව විදාතා වැඩසටහන මෙම අමාත්‍යාංශය යටතට නැවත පත්විය. තාක්‍ෂණ පැවරුම් හරහා තරඟකාරී ජාතික සහ ගෝලීය වෙළඳපොළට කර්මාන්තකරුවන් සම්බන්ධ කරමින් ඔවුන් දිරිමත් කරන ක්‍රියාකාරී ඒකකයක් ලෙස මෙම ඒකකය ක්‍රියාත්මක

වේ. සේවය සඳහා කැපවූ සේවකයින් 925 දෙනෙකුගේ සහාය ඇතිව ක්‍රියාත්මක පුළුල් විද්‍යාතා සම්පත් මධ්‍යස්ථාන (VRCs) ජාලය, සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකම පිහිටුවා ඇති අතර, ඒ හරහා පුළුල් ප්‍රවේශයක් සහ බලපෑමක් ඇති කිරීම සහතික කරයි.

කාර්යභාරය

1. නිෂ්පාදන සඳහා තාක්ෂණයන් පවරාදීම, වැඩිදියුණු කිරීම සහ ප්‍රමිතිකරණය.
2. නවීන තාක්ෂණය ලබාදීම තුලින් ප්‍රාදේශීය විෂමතා අවම කිරීම සඳහා කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ගේ ආදායම උත්පාදන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.
3. අගය එකතු කිරීම සහ නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීම තුළින් පවතින සම්පත් ඵලදායී ලෙස භාවිතා කිරීම.
4. ව්‍යවසායකයින් මුහුණ දෙන ගැටළු විද්‍යාත්මකව විසඳීම
5. පර්යේෂණ සහ සංවර්ධන කාර්යයන් සඳහා පහසුකම් සැලසීම

කාර්යසාධනය

නිෂ්පාදනවල ගුණාත්මකභාවය ඉහල නැංවීම සහ ප්‍රමිතිකරණය (GMP සහ පරීක්ෂා සහතිකකරණය)

විද්‍යාතා ඒකකය, ග්‍රාමීය මට්ටමින් වෙළෙඳපොළට ළඟා වන නිෂ්පාදනවල ගුණාත්මක තහවුරු කිරීම සඳහා කාර්මික තාක්ෂණ ආයතනය (ITI), ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය (SLSI) සහ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයේ ප්‍රතීතනය ලද පෞද්ගලික ආයතන සමඟ එක්ව පරීක්ෂණ වාර්තා සහ තත්ත්ව සහතික නිකුත් කිරීමට කටයුතු කරයි. රටපුරා ව්‍යවසායකත්වය පෝෂණය කිරීමේදී නිෂ්පාදන ප්‍රමිතිකරණය තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරයි. 2024 වර්ෂයේ දී යහපත් නිෂ්පාදන පිළිවෙත් (GMP) සහතිකකරණයන් සහ ආහාර පාන වර්ග, කුළුබඩු සහ ශාකසාර නිෂ්පාදන වැනි අංශවල තත්ත්ව පරීක්ෂණ සඳහා රුපියල් මිලියන 10.0ක මුදලක් වෙන් කරන ලදී. මෙම මූලාරම්භය යටතේ අයදුම්කරුවන්ගේ සංචිතයෙන් සුදුසුකම් ලත් ව්‍යවසායකයින් තෝරා ගැනීම සිදු කෙරිණි . වෙන් කළ අරමුදල්වලින් රු. මිලියන 9.78ක් භාවිතා කරන ලද අතර, එහි ප්‍රතිඵලයක් ලෙස GMP සහතික 36ක් සහ පරීක්ෂණ වාර්තා 247ක් මෙම ව්‍යවසායකයින් වෙත නිකුත් කරන ලදී.

ව්‍යවසායකයින් සඳහා වෙළඳපල සහ අලෙවි ප්‍රවර්ධන වැඩසටහන්

දිවයින පුරා සිටින ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් (MSMEs) සම්බන්ධ කර ගනිමින් දිස්ත්‍රික් මට්ටමේ වෙළෙඳ ප්‍රදර්ශන සංවිධානය කිරීමට රුපියල් මිලියන 4ක් වෙන් කර ඇත. මෙම ප්‍රදර්ශන හරහා දිස්ත්‍රික් ලේකම් කාර්යාල මට්ටමින් ලබා දෙන මූල්‍ය අනුග්‍රහය තුලින් විකුණුම් ඉහළ නැංවීම අරමුණු කෙරේ. දිස්ත්‍රික්ක 21 ක වෙළෙඳ ප්‍රදර්ශන සාර්ථකව පවත්වා ඇත.මෙයට අමතරව, විද්‍යාතා මූලාරම්භය මගින් සවිබල ගැන්වූ ව්‍යාපාර ප්‍රවර්ධනය කිරීම සහ ඔවුන්ගේ වෙළඳපල ප්‍රවේශය වැඩිදියුණු කිරීම උදෙසා ව්‍යවසායක නාමාවලියක් සම්පාදනය කර ඇත. රටපුරා විසිරී සිටින ව්‍යවසායකයින් 520 දෙනෙකුගේ පැතිකඩ ලැයිස්තුගත කර ඇති මෙම නාමාවලිය සඳහා වැය කර ඇති මුදල රු. මිලියන 0.085 ක් වන අතර එය දැන් අන්තර්ජාලය හරහා ලබා ගත හැකිය.

තාක්ෂණ පැවරුම් වැඩසටහන්

විද්‍යාතා ඒකකය විසින් 2024 වර්ෂයේදී ව්‍යවසායකයින් සවිබල ගැන්වීම සඳහා තාක්ෂණික හුවමාරු වැඩසටහන් මාලාවක් සාර්ථකව ක්‍රියාත්මක කරන ලදී.

- තාක්ෂණ හුවමාරු සහ ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන යටතේ කුළුබඩු මත පදනම් වූ නිෂ්පාදන, පිරිසිදුකාරක, බිම්මල් ආශ්‍රිත නිෂ්පාදන, මත්ස්‍ය නිෂ්පාදන සඳහා අගය එකතු කිරීම සහ අනෙකුත් අගය එකතු කළ ආහාර නිෂ්පාදන කෙරෙහි අවධානය යොමු කර ඇත. පුහුණු සැසි 34ක් සාර්ථකව පවත්වා ඇත.වෙන් කරනු ලැබූ රු. මිලියන 7.5ක මුදලින්, රු. මිලියන 5.48ක් ඵලදායී ලෙස භාවිතා කර ඇත.

- පොල්, කිතුල් සහ තල් ක්ෂේත්‍රයේ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සවිබල ගැන්වීමේ තාක්ෂණ හුවමාරු වැඩසටහනේ කොටසක් ලෙස ව්‍යවසායකයින් 525 දෙනෙකුට ප්‍රතිලාභ ලබා දෙමින් වැඩසටහන් 11ක් සාර්ථකව පවත්වන ලදී. වෙන් කර ඇති රු. මිලියන 6.0ක මුදලින් , රු. මිලියන 2.54 ක් ඵලදායී ලෙස භාවිතා කරන ලදී.

- 2024 ගෝලීය ව්‍යවසායකත්ව සතිය තුළදී තාක්‍ෂණික හුවමාරුව සහ දැනුවත්භාවය ගොඩනැගීම තුළින් කුඩා පරිමාණ ව්‍යවසායක මට්ටම කරා ළඟාවනු පිණිස ක්ෂුද්‍ර ව්‍යවසායකයින් සවිබල ගැන්වීම අරමුණු කර ගත් පුහුණු වැඩසටහන් 75ක් පවත්වන ලදී. වෙන් කර ඇති රු. මිලියන 7.0ක මුදලින්, රු. මිලියන 0.89ක් භාවිතයට ගෙන ඇත.
- ව්‍යවසායකයින් 214 දෙනෙකුට ප්‍රතිලාභ අත්කර දෙමින් එළවළු, කොළ වර්ග සහ පලතුරු සංරක්ෂණය හා විජලනය පිළිබඳ පුහුණු වැඩසටහන් 07ක් අවසන් කර ඇත. (රු. මිලියන 7.23ක් වෙන් කර ඇති අතර රුපියල් මිලියන 0.67ක් වැය කර ඇත.).
- ව්‍යවසායකයින් සඳහා නව අවස්ථා ඇති කිරීම සඳහා ස්වභාවික මල් සංරක්ෂණය පිළිබඳ තාක්ෂණික පුහුණු වැඩසටහනක් පවත්වන ලද අතර, සැසි පහක් හරහා සහභාගිවූවන් 98 දෙනෙකුට ප්‍රතිලාභ හිමි විය. රු. මිලියන 7.50 ක මුදලක් වෙන් කරන ලද අතර, වියදම රු. මිලියන 2 කි.
- ශ්‍රී ලංකාවේ රෙදිපිළි හා ඇඟලුම් ක්ෂේත්‍රයේ ගුණාත්මකභාවය ඉහළ නැංවීම සඳහා ශ්‍රී ලංකා රෙදිපිළි හා ඇඟලුම් ආයතනය සමඟ එක්ව පුහුණු වැඩසටහන් පවත්වා ඇත. ව්‍යවසායකයින් 118 දෙනෙකුට ප්‍රතිලාභ අත් කර දෙමින් වැඩසටහන් හතක් සාර්ථකව නිම කර ඇත.වෙන් කරනු ලැබූ මුළු මුදල රු. මිලියන 9.5 ක් වූ අතර, වියදම ලෙස රු. මිලියන 3.42ක් වැය විය.
- දිස්ත්‍රික් විද්‍යාතා කාර්යාල සහ ප්‍රාදේශීය විද්‍යාතා සම්පත් මධ්‍යස්ථාන විසින් ආහාර නිෂ්පාදනය, රසායනික සැකසුම්, අලෙවිකරණය, ව්‍යවසායකත්ව සංවර්ධනය, නිෂ්පාදන සඳහා අගය එකතු කිරීම සහ ප්‍රායෝගික හා සෛද්ධාන්තික පරිගණක තාක්ෂණය ඇතුළු විවිධ ක්ෂේත්‍ර ඔස්සේ පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලැබේ. ඉහත සඳහන් ක්ෂේත්‍ර ඔස්සේ පවත්වනු ලැබූ වැඩසටහන් 26514ක් හරහා ව්‍යවසායකයින් වෙත ප්‍රතිලාභ ලැබී ඇත.

ධාරිතා ගොඩනැංවීමේ වැඩසටහන

- ග්‍රාමීය ව්‍යවසායකයින් සඳහා සුදුසු තාක්‍ෂණයන් වෙත ඔවුන්ගේ ප්‍රවේශය වැඩි දියුණු කිරීම අරමුණු කර ගනිමින්, විද්‍යාතා ඒකකවල විද්‍යා හා තාක්ෂණ නිලධාරීන්ගේ ධාරිතාවය ගොඩනැගීම හරහා වඩාත් ඵලදායී තාක්‍ෂණ හුවමාරුවක් සඳහා සම්පත් සංචිතයක් මෙම වැඩසටහන මගින් ස්ථාපිත කරන ලදී. කිරි ආශ්‍රිත ආහාර සඳහා අගය එකතු කිරීම පිළිබඳ නිලධාරීන් 167 දෙනෙකුට සහ පිරිසිදු කාරක පිළිබඳ නිලධාරීන් 77 දෙනෙකුට ප්‍රතිලාභ අත් කර දෙමින් සිදු කරනු ලැබූ පුහුණු වැඩසටහන් 09 ක් මෙයට ඇතුළත් විය. (ප්‍රතිපාදන: රුපියල් මිලියන 4, වියදම: රුපියල් මිලියන 3.33).

- විභවතාවක් සහිත ව්‍යවසායකයින්ට සහාය වනු පිණිස දිස්ත්‍රික් විද්‍යාතා නිලධාරීන් සහ සම්පත් මධ්‍යස්ථානයන්හි කාර්ය මණ්ඩලය කුසලතාවන්ගෙන් සවිබල ගැන්වීම අරමුණු කර ගනිමින්, ව්‍යවසායකන් මුහුණ දෙන අභියෝගයන්ට විසඳුම් සහ උපදෙස් ලබා දීම සඳහා ධාරිතා ගොඩනැංවීමේ වැඩසටහන් පවත්වා ඇත. (රුපියල් මිලියන 3ක් වෙන් කර ඇති අතර ඉන් රුපියල් මිලියන 0.84ක් වියදම් කර ඇත)

2.1.7. ශ්‍රී ලංකා ග්‍රහලෝකාගාරය

හැඳින්වීම

තාරකා විද්‍යාව පිලිබඳ දැනුම ප්‍රචලිත කිරීම අරමුණු කරගනිමින් 1965 වර්ෂයේදී ස්ථාපනය කරනු ලැබූ ශ්‍රී ලංකා ග්‍රහලෝකාගාරය ශ්‍රී ලංකාව සතු එකම ග්‍රහලෝකාගාරය වේ. ලොව ඇති විශාලතම ග්‍රහලෝකාගාර අතරින් එකක් වන ශ්‍රී ලංකා ග්‍රහලෝකාගාරය තුළ එක් දර්ශන වාරයක් සඳහා නරඹන්නන් 560 දෙනෙකු සඳහා ආසන පහසුකම් සැපයිය හැකිය. ගෙවී ගිය 59 වසර තුළ ශ්‍රී ලාංකීය පාසල් සිසුන් මෙන්ම සාමාන්‍ය මහජනයා අතර දැනුම සොයන්නන්ගේ තාරකා විද්‍යා දැනුම සඳහා ඇති කුතුහලය සංසිඳවනු පිණිස ග්‍රහලෝකාගාර දර්ශන, එළිමහන් වැඩසටහන් සහ තාරකාවිද්‍යා පාඨමාලා පැවැත්වීම හරහා සිය අරමුණු කරා ලඟා වීමට සහාය දැක්වීමට ශ්‍රී ලංකා ග්‍රහලෝකාගාරයට හැකිවිය. විශ්වය ත්‍රිමාන අවකාශයක් තුළ ප්‍රක්ෂේපණය කර පෙන්වීම සඳහා 2014 වසරේදී 4D/ ඩිජිටල් පූර්ණ අර්ධ ගෝලාකාර ප්‍රක්ෂේපණ යන්ත්‍රයක් සවි කිරීම හරහා ග්‍රහලෝකාගාරය නවීකරණය කරනු ලැබිණි. මෑතකදී එක් කරනු ලැබූ තාක්ෂණික උද්‍යානය හරහා ග්‍රහලෝකාගාරය වෙත පැමිණෙන නරඹන්නන් හට භෞතික විද්‍යා සංසිද්ධි පිළිබඳ තත්‍ය කාලීන අත්දැකීමක් ලැබේ. අගනුවරින් පිටත වාසය කරන්නන් සඳහා විශ්වයේ අසිරිමත් බව පෙන්වාදෙනු පිණිස දීපව්‍යාප්ත පදනමින් රාත්‍රී අහස නිරීක්ෂණ කඳවුරු, විශේෂ ස්වාභාවික සංසිද්ධි නිරීක්ෂණ කඳවුරු, තාරකා විද්‍යා වැඩමුළු, විද්‍යා ප්‍රදර්ශන සහ සම්මන්ත්‍රණ පවත්වනු ලැබේ. තවද, තාරකා විද්‍යා පාඨමාලා සහ එළිමහන් වැඩසටහන් සම්පූර්ණයෙන්ම නොමිලේ පවත්වනු ලැබේ. සවිඥානික අත්දැකීම් හරහා තාරකා විද්‍යාව කෙරෙහි මහජන උද්‍යෝගය ඇති කරනු පිණිස මෙම සියලු ක්‍රියාකාරකම් සිදු කරනු ලැබේ.

දැක්ම

විශ්වය හා බැඳුනු නවෝත්පාදක සහ ගවේෂණශීලී දේශයක් ගොඩනැංවීම

මෙහෙවර

විශ්වය පිලිබඳ පුළුල් ඉදිරි දැක්මක් සහිතව ජනතාව දැනුවත් කිරීම සහ ශ්‍රී ලංකාවේ තාරකා විද්‍යාත්මක අධ්‍යාපනයේ නිම් වළලු පුළුල් කිරීම

අරමුණු

- **පාසල් ළමුන්, ගුරුවරුන්, සහ සාමාන්‍ය මහජනතාව අතර තාරකා විද්‍යාව සහ අභ්‍යවකාශ තාක්ෂණය පිලිබඳ දැනුම ප්‍රවර්ධනය කිරීම**
    - අධ්‍යාපනය ලබාදීම සහ දැනුම බෙදාදීම
    - පුළුල් විද්‍යාත්මක ප්‍රජාවට සම්බන්ධ වීම
- **ශ්‍රී ලංකා නාවික හමුදා නිලධාරීන් සඳහා නාවික මඟපෙන්වීම් ලබා දීම.**
    - තාරකා විද්‍යාත්මක නිරීක්ෂණ භාවිතයෙන් දිශාවන් සෙවීමට සහ මුහුදේ යාත්‍රා කිරීමට මාර්ගෝපදේශයන් ලබා දීම.
- **තාරකා විද්‍යාව සහ අභ්‍යවකාශ විද්‍යාව පිලිබඳ අධ්‍යයනය කිරීමට සහ අත්හදා බැලීමට පුළුල් අවස්ථා ලබාදීම**
    - තාරකා විද්‍යාව සහ අභ්‍යවකාශ විද්‍යාව පිලිබඳ අත්හදා බැලීම් සඳහා උපදෙස් සහ උපදේශන ලබාදීම
- **සාමාන්‍ය ජනතාව වෙත තාරකා විද්‍යාව පිලිබඳ යාවත්කාලීන තොරතුරු සැපයීම**
    - තොරතුරු වලින් සන්නද්ධ පුද්ගලයෙකු ගොඩනැගීම
- **සංවිධානයක් ලෙස දියුණුව කරා පියනැගීම**
    - සවිමත් සංවිධානාත්මක ව්‍යුහයක් ගොඩනැංවීම
    - පාරිභෝගික හිතකාමී සංවිධානයක් ලෙස ගොඩනැගීම

- **ජාතික සහ ජාත්‍යන්තර සහයෝගීතා**
    - ජාතික මට්ටමින් අදාළ ආයතන සමඟ සහයෝගීතාවයන් ගොඩනංවා ගැනීම
    - ග්‍රහලෝකාගාර ප්‍රයත්නයන් දිරිමත් කරවීම උදෙසා ජාත්‍යන්තර කණ්ඩායම් සමඟ කටයුතු කිරීම

2024 වර්ෂයේ ජයග්‍රහණයන්

විද්‍යාව ප්‍රචලිත කිරීමේ වැඩසටහන

පාසල් සිසුන් සහ සාමාන්‍ය මහජනතාව අතර විද්‍යාව ප්‍රචලිත කරනු පිණිස පහත ක්‍රියාකාරකම් සිදු කරන ලදී.

- **ශ්‍රී ලංකා ග්‍රහලෝකාගාරයෙහි තාක්ෂණික උද්‍යානය**
  විශ්වයේ ඇති තාරකා විද්‍යාත්මක සංසිද්ධි පැහැදිලි කිරීමට සහ ග්‍රහලෝකාගාරය වෙත පැමිණෙන නරඹන්නන්ට එම සංසිද්ධීන් පිළිබඳ සැබෑ අත්දැකීමක් ලබා දීම අරමුණු කර ගනිමින් ඒ සඳහා වඩාත් ඵලදායී මාධ්‍යයක් ලෙස ශ්‍රී ලංකා ග්‍රහලෝකාගාර පරිශ්‍රය තුළ තාක්ෂණික උද්‍යානය ස්ථාපිත කර ඇත.
- **ග්‍රහලෝකාගාර දර්ශන**
  ග්‍රහලෝකාගාර දර්ශන සඳහා ඩිජිටල් පූර්ණ අර්ධ ගෝලාකාර චිත්‍රපට, සූර්ය ග්‍රහ මණ්ඩලය පිළිබඳ කෙරෙන හැඳින්වීම සහ රාත්‍රී අහස නිරූපණය ඇතුලත් වේ. එළිමහන් වැඩසටහන්

- **ජංගම ග්‍රහලෝකාගාර දර්ශන**
  ශ්‍රී ලංකා ග්‍රහලෝකාගාරය විසින් දිවයින පුරා ග්‍රාමීය ප්‍රදේශයන්හි සිසුන් සඳහා ජංගම ග්‍රහලෝකාගාර භාවිතයෙන් ග්‍රහලෝකාගාර දර්ශන සාර්ථකව පැවැත්වීමේ කාර්යයෙහි නියැලී සිටී .
- **රාත්‍රී අහස නිරීක්ෂණ කඳවුරු**

තාරකා විද්‍යාව ප්‍රවර්ධනය කිරීම සහ පාසල් සිසුන් මෙන්ම මහජනතාවගේ නිරීක්ෂණ කුසලතා වැඩිදියුණු කිරීම අරමුණු කර ගනිමින් දිවයින පුරා රාත්‍රී අහස නිරීක්ෂණ කඳවුරු පවත්වන ලදී. මෙවැනි වැඩසටහන් හරහා පියවි ඇසින් සහ දුරේක්ෂ භාවිතයෙන් ආකාශ වස්තු නිරීක්ෂණය කිරීමේ සජීවී අත්දැකීම් ලබා දේ.

- **ස්වාභාවික සංසිද්ධි නිරීක්ෂණ කඳවුරු**
  සූර්යග්‍රහණ, චන්ද්‍රග්‍රහණ, වල්ගාතරු, බුධ හෝ සිකුරු සංක්‍රාන්ති වැනි ස්වාභාවික සංසිද්ධීන් සිදු වන අවස්ථාවන්හි දී ශ්‍රී ලංකා ග්‍රහලෝකාගාරය විසින් කඳවුරු සංවිධානය කරනු ලැබේ. ඇතැම් සංසිද්ධීන් ජීවිත කාලයට එක් වරක් පමණක් සිදු වන හෙයින් එවැනි සංසිද්ධීන් නිරීක්ෂණය කිරීම සඳහා අප සමඟ එක්ව කටයුතු කිරීමට ශ්‍රී ලාංකීය ජනතාව මහත් උනන්දුවක් දක්වති.

- **තාරකා විද්‍යා පන්ති සහ වැඩමුළු**
  ද්විතීයික මට්ටමේ පාසල් සිසුන් අතර තාරකා භෞතික විද්‍යාව ජනප්‍රිය කරවීම සහ ප්‍රාථමික මට්ටමේ සිසුන් සඳහා අන්තර් ක්‍රියාකාරී තාරකා විද්‍යාව ආශ්‍රිත ක්‍රියාකාරකම්වල නියැලීමට අවස්ථාව ලබා දීම හරහා සිය නිර්මාණශීලී හැකියාවන් වැඩිදියුණු කිරීම අරමුණු කර ගනිමින් පන්ති සහ වැඩමුළු පැවැත්වීම. මෙවැනි වැඩසටහන් පැවැත්වීමේ ප්‍රධාන අරමුණ වනුයේ විශ්වය සම්බන්ධව ඉහල නිරීක්ෂණ හැකියාවන්ගෙන් යුතු ඉදිරි තාරකා විද්‍යාඥයින්ගෙන් සමන්විත ඉදිරි පරම්පරාවක් ගොඩනැගීමයි.

මෙම වැඩසටහන්වල ප්‍රගතිය පහත පරිදි වේ.

ප්‍රචලිත කිරීමේ ක්‍රමවේදය	2023		2024 වර්ෂයේ ඉලක්ක		2024 වර්ෂයේ ප්‍රගතිය	
	වැඩසටහන	ප්‍රතිලාභීන්	වැඩසටහන	ප්‍රතිලාභීන්	වැඩසටහන	ප්‍රතිලාභීන්
1. ග්‍රහලෝකාගාර දර්ශන	478	217,235	400	250,000	250	108,774
2. එළිමහන් වැඩසටහන්	20	12,915	35	20,000	18	18,171
3. තාරකාවිද්‍යා පාඨමාලා	3	115	3	150	3	75
4. ආදායම (රු.මි.)		22.79		30.00		12.00

2.1.8. මූල්‍ය ප්‍රගතිය

පහත දත්ව භාණ්ඩාගාර මුද්‍රිත සටහන්වල පළවන පරිපූරකය පදනම් කරගෙන සටහන් කර ඇත.

මූල්‍ය වෙන් කිරීම් හා වියදම් (2024.12.31 දිනට)

වර්ෂය	පුනරාවර්තන (රු.මි.)		ප්‍රාග්ධන (රු.මි.)		එකතුව (රු.මි.)	
	වෙන් කළ මුදල	වියදම	වෙන් කළ මුදල	වියදම	වෙන් කළ මුදල	වියදම
2022	1842.5	1662.9	1664.5	499.8	3507	2162.7
2023	1266	1064.6	1391	623.6	2657	1688.2
2024	1350.5	1192.4	1026.8	359	2377.3	1551.4

ප්‍රාග්ධන වෙන් කිරීම් හා වියදම් (2024.12.31 දිනට)

	2022 (මුදල රු.මි.)			2023 (මුදල රු.මි.)			2024 (මුදල රු.මි.)		
	වෙන් කළ	වියදම	%	වෙන් කළ	වියදම	%	වෙන් කළ	වියදම	%
ජාතික අය වැය වැඩසටහන	3407	2156.5	63.3	2657	1688.2	63.5	2377.3	1551.4	65.3
අයවැය යෝජනා වැඩසටහන	100	6.2	6.2	0	0	0	0	0	0
විදේශීය ණය /ආධාර වැඩසටහන	0	0	0	0	0	0	0	0	0
එකතුව	3507	2162.7	69.5	2657	1688.2	63.5	2377.3	1551.4	65.3

ආයතන අනුව ප්‍රතිපාදන වෙන් කිරීම

ආයතනය	පුනරාවර්තන 2024			ප්‍රාග්ධන 2024		
	වෙන් කළ මුදල (රු.මි.)	සත්‍ය වියදම (රු.මි.)	%	වෙන් කළ මුදල (රු.මි.)	සත්‍ය වියදම (රු.මි.)	%
අමාත්‍යාංශය	178.2	144.2	80.92%	6.8	2	29.41%
හායනය වූ පාංශු වැඩි දියුණු කිරීම				12	11	99%
විද්‍යාත්මක සංවර්ධන වැඩසටහන				34	5.08	21%
ජාතික පර්යේෂණ හා සංවර්ධන රාමුව (NRDF)				5.0	1.2	24%
තාක්ෂණ පැවරුම් වැඩසටහන (විද්‍යාතා වැඩසටහන්)	786.07	69051	88.06%	110.90	47.5	42.83%
නවීන තාක්ෂණය පිළිබඳ ආතර් සී. ක්ලාක් ආයතනය (ACCIMT)	188	170	90%	50	21	42%

කාර්මික තාක්ෂණ ආයතනය (ITI)	500	362.9	73%	100	94.87	95%
ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය (NERDC)	322	304	94%	60	57	95%
ජාතික මූලික අධ්‍යයන ආයතනය (NIFS)	275	261	95%	220	72	33%
ජාතික විද්‍යා පදනම (NSF)	168	161	95%	270	84	72%
ජාතික පර්යේෂණ සභාව (NRC)	44	15	36%	130	57	44%
ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව (NASTEC)	41	29	71%	22	6	27%
ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම (SLIC)	52	50	96%	70	23	33%
ශ්‍රී ලංකා ග්‍රහලෝකාගාරය	40	33	84%	106	1.08	1%
ජාතික නවෝත්පාදන නියෝජ්‍යායතනය (NIA)	37	21	57%	41	14	35%
ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය (SLSI)	990.27	889	90%	593.4	79	13%
එකතුව	**3619.54**	**3130.61**	**80.77%**	**1831.1**	**575.73**	**44.14%**
රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව (PED) ප්‍රතිපාදන						
ශ්‍රී ලංකා නිනිති තාක්ෂණ ආයතනය (SLINTEC)				306	226	74%
ශ්‍රී ලංකා ඉන්ස්ටිටියුට් ඔෆ් බයෝටෙක්නොලොජි (SLIBTEC)				850	450.44	53%

2.1.9. 2025 වර්ෂය සඳහා ඉලක්ක

- ජාතික පර්යේෂණ මාර්ග සිතියමක් සකස් කිරීම සහ විද්‍යා හා තාක්ෂණ ප්‍රතිපත්තියට අනුකූලව අදාළ වැඩසටහන් සංවිධානය කිරීම.

- විද්‍යා ඊ නිව්ස් වෙබ් අඩවිය පවත්වාගෙන යාම, විද්‍යා ඊ නිව්ස් ලිපි තරගය සංවිධානය කිරීම සහ පුරවැසි විද්‍යාත්මක සාක්ෂරතාව මැනීම සඳහා ජාතික සමීක්ෂණයක් පැවැත්වීම. විද්‍යා සාක්ෂරතාවය වැඩි දියුණු කිරීම සඳහා ජාතික විද්‍යා දිනය/සතිය ඇතුළුව විද්‍යා ප්‍රවර්ධන වැඩසටහන් අධීක්ෂණය සහ සම්බන්ධීකරණය කිරීම.

- රජයේ අරමුදල් ලබන සහ සහයෝගීතා පර්යේෂණ සඳහා ජාතික පර්යේෂණ කළමනාකරණ තොරතුරු පද්ධතිය ස්ථාපිත කිරීම සහ කළමනාකරණය කිරීම. දැනට ක්‍රියාත්මක පර්යේෂණ ව්‍යාපෘතිවල ප්‍රගතිය නිරීක්ෂණය කිරීම සහ සමාලෝචනය කිරීම, 2025 පර්යේෂණ සැලැස්ම ඇගයීම සහ 2026 සඳහා වාර්ෂික පර්යේෂණ සැලැස්ම සකස් කිරීම. කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 02/2014 අනුව දීමනා ගෙවීම සඳහා පර්යේෂණ යෝජනා සමාලෝචනය කිරීම.

- ඉන්දු-ශ්‍රී ලංකා ඒකාබද්ධ පර්යේෂණ වැඩසටහන (2019 සහ 2024 මූලාරම්භයන්) යටතේ පර්යේෂණ ව්‍යාපෘති සඳහා ප්‍රදාන ලබා දීම සහ ප්‍රගති සමාලෝචන පැවැත්වීම.

- විද්‍යා හා තාක්ෂණ සහයෝගීතාව පිළිබඳ නව අවබෝධතා ගිවිසුම් අත්සන් කිරීම සහ අවබෝධතා ගිවිසුම්වලට එළැඹී රටවල් සමඟ ඒකාබද්ධ කමිටු රැස්වීම් පැවැත්වීම.

- BIMSTEC තාක්ෂණ හුවමාරු පහසුකම, සහ න්‍යෂ්ටික පර්යේෂණ සඳහා වන යුරෝපා සංවිධානය (CERN) සම්බන්ධ ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය කිරීම

- කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරයන් තුළ විද්‍යා හා තාක්‍ෂණ පරිසර පද්ධතියක් පෝෂණය කිරීම සඳහා විශ්වවිද්‍යාල පර්යේෂණ ආයතන සහ අධ්‍යයන ආයතන සමඟ එක්ව දිවයින පුරා තාක්ෂණ බීජෞෂක මධ්‍යස්ථාන ජාලයක් (incubation centers) පිහිටුවීම.

- මානව සම්පත්, භෞතික යටිතල පහසුකම් සහ සංවර්ධන ක්‍රියාකාරකම් ඇතුළත් විද්‍යාතා ඒකක දත්ත ගබඩාව අඛණ්ඩව වැඩිදියුණු කිරීම සහ නඩත්තු කිරීම.

- පාසල් සිසුන් සහ මහජනතාව සඳහා සිදුකෙරෙන ග්‍රහලෝකාගාර දර්ශන සංඛ්‍යාව 450 දක්වා ඉහල නැංවීම

- ග්‍රාමීය ප්‍රදේශයන්හි සිදු කිරීමට නියමිත එළිමහන් වැඩසටහන් සංඛ්‍යාව - 40

- ග්‍රහලෝකාගාර තාරකා විද්‍යා පාඨමාලා සඳහා ඇතුලත් කර ගැනෙන සිසුන් සංඛ්‍යාව - 200

- ග්‍රහලෝකාගාර දර්ශන හරහා උපයා ගැනීමට අපේක්ෂිත වාර්ෂික ආදායම රු. (මිලියන) - 30.00

- මාර්ගගත ක්‍රමය හරහා දර්ශන වාර වෙන්කර ගැනීමේ පද්ධතිය ස්ථාපිත කිරීම

- ග්‍රහලෝකාගාර දර්ශනයන්හිදී භාවිතයට ගනු පිණිස පූර්ණ අර්ධගෝල චිත්‍රපට දත්ත ගබඩාව වැඩිදියුණු කිරීම

- දුරදක්න, Astro කැමරා සහ සූර්ය පෙරහන් භාවිතයෙන් දුරේක්ෂ වැඩිදියුණු කිරීම හා නව ජංගම ග්‍රහලෝකාගාරයක් මිළදී ගැනීම

- ග්‍රහලෝකාගාර ගොඩනැගිල්ල තීන්ත ආලේප කර ප්‍රතිසංස්කරණය කිරීම, පුස්තකාල ගොඩනැගිල්ලේ වහලය සූර්ය නිරීක්ෂණාගාරයක් ලෙස ප්‍රතිසංස්කරණය කිරීම, තාක්ෂණ උද්‍යානය අලුත්වැඩියා කිරීම හා වැසිකිළි පද්ධතිය අළුත්වැඩියා කිරි

3. නවීන තාක්ෂණ පිළිබඳ ආතර් සී ක්ලාක් ආයතනය (ACCIMT)

3.1. හැඳින්වීම

1984 අංක 30 දරන පනත මගින් පිහිටුවන ලද නවීන තාක්ෂණය සඳහා වූ ආතර් සී ක්ලාක් මධ්‍යස්ථානයේ අනුප්‍රාප්තිකයා ලෙස 1994 අංක 11 දරන විද්‍යා හා තාක්ෂණ සංවර්ධන පනත යටතේ 1998 අප්‍රේල් 1 දින නවීන තාක්ෂණය පිළිබඳ ආතර් සී. ක්ලාක් ආයතනය ප්‍රතිසංවිධානය කරන ලද අතර මොරටුව කටුබැද්දේ පිහිටා ඇත. මෙම ආයතනය ජාත්‍යන්තර අභ්‍යවකාශ තාක්‍ෂණය පිළිබඳ සංවිධාන සමඟ සහයෝගයෙන් අභ්‍යවකාශ තාක්‍ෂණය සහ එහි යෙදවුම්වල ජාතික ධාරිතා සංවර්ධනය සඳහා ශ්‍රී ලංකාවේ ප්‍රධාන නියෝජිතායතනය ලෙස විශේෂිත වූ කාර්යයක් ඉටු කරයි.

ආයතනයේ මූලික කාර්යයන්ට පර්යේෂණ සහ සංවර්ධනය, තාක්‍ෂණික හුවමාරුව සහ නවීන තාක්ෂණයන් පිළිබඳ පුහුණුව ඇතුළත් වේ. ආයතනය විසින් සිය දායකත්වය සපයන නවීන තාක්‍ෂණයන්ට සන්නිවේදනය සහ ආශ්‍රිත තාක්‍ෂණික ක්ෂේත්‍ර, තොරතුරු තාක්‍ෂණය, ඉලෙක්ට්‍රොනික සහ ක්ෂුද්‍ර ඉලෙක්ට්‍රොනික තාක්ෂණය, අභ්‍යවකාශ තාක්‍ෂණය සහ එහි යෙදුම්, රොබෝ විද්‍යාව සහ තාරකා විද්‍යාව ආදිය ඇතුළත් වේ.

දැක්ම
නවීන තාක්ෂණය සඳහා කළාපය තුළ ප්‍රමුඛතම නවෝත්පාදන මධ්‍යස්ථානය වීම.

මෙහෙවර
දේශීය පදනමක් සහිත නවීන තාක්ෂණික හැකියාවන් නවොත්පාදන, පර්යේෂණ හා සංවර්ධන කාර්යයන්, පුහුණු, කර්මාන්ත සේවා සහ අන්තර්ජාතික සහයෝගීතා තුලින් සංවර්ධනය හා දිරිමත් කිරීමට පහසුකම් සැලසීම

3.2. ආයතනයේ කාර්යයන්

- අභ්‍යවකාශ, ඉලෙක්ට්‍රොනික හා ක්ෂුද්‍ර ඉලෙක්ට්‍රොනික, සන්නිවේදනය, තොරතුරු සහ රොබෝ සහ ඩ්‍රෝන තාක්‍ෂණයන්, අභ්‍යවකාශ තාක්‍ෂණ යෙදවුම් සහ තාරකා විද්‍යාව වැනි නවීන තාක්‍ෂණික ක්ෂේත්‍රවල පර්යේෂණ සහ සංවර්ධන කටයුතු සිදු කිරීම.

- රජයේ සහ පෞද්ගලික අංශයේ ආයතනවල තාක්ෂණික අවශ්‍යතාවයන් ඉටුකිරීමට අදාල වූ පරීක්ෂණ හා මිණුම්, විද්‍යුත් පරීක්ෂණ උපකරණ ක්‍රමාංකනය සහ ආයතනයට අදාල වූ ක්ෂේත්‍ර වල උපදේශණ සේවාවන් සිදුකිරීම.

- ඉංජිනේරුවන්, කාර්මික තාක්ෂණවේදීන් ඉලක්ක කර ගනිමින් විශේෂිත වූ තාක්ෂණික ක්ෂේත්‍ර වල වෘත්තීය සංවර්ධන පුහුණු වැඩසටහන් පැවැත්වීම සහ සාමාන්‍ය ජනතාව සහ ශිෂ්‍ය ප්‍රජාව ඉලක්ක කොටගෙන තාක්ෂණය ප්‍රවර්ධනය මූලික කරගත් පුහුණු වැඩසටහන් හා දේශන පැවැත්වීම.

3.3. 2024 වර්ෂයේ ජයග්‍රහණයන්

- **ජපානය සමඟ තාක්ෂණික සහයෝගීතාවයෙන් 2U නැනෝ-චන්ද්‍රිකාවක් වැඩිදියුණු කිරීම**

  Kyushu තාක්ෂණ ආයතනය (Kyutech) සමඟ සහයෝගීතා ව්‍යාපෘතියක් හරහා සංවර්ධනය කරන ලද "ඩ්‍රැගන් ෆ්ලයි" නම් 2U නැනෝ චන්ද්‍රිකාව 2025 දී අභ්‍යාවකාශ ගත කිරීමට සැලසුම් කර ඇත. මෙය නවීන තාක්‍ෂණ පිළිබඳ ආතර් සී ක්ලාක් ආයතනයේ (ACCIMT) තාක්‍ෂණික දායකත්වයෙන් සංවර්ධනය කරන ලද තුන්වන නැනෝ චන්ද්‍රිකාව වන අතර ජාත්‍යන්තර අභ්‍යවකාශ මධ්‍යස්ථානය හරහා කිලෝමීටර් 400 ක උන්නතාංශයක මෙහෙයුම් කක්ෂයට මෙය මුදාහරිනු ඇත.

  තවද මෙය BIRDS-X ව්‍යාපෘතියේ කොටසක් වන අතර, කක්ෂගත කිරීමෙන් අනුතුරුව මූලික වශයෙන් සංනිවේදන ඉංජිනේරු විද්‍යාවට සම්බන්ධ විශේෂිත වූ පරීක්ෂණ කිහිපයක් සිදුකිරීමට යෝජිතය.

- **යාන්ත්‍රික තේ අස්වනු නෙළනයක් සංවර්ධනය කිරීම**

තේ වගා කරන ප්‍රදේශවල ශ්‍රම හිඟයට විසඳුමක් ලෙස යාන්ත්‍රිකව තේ දළු නෙලීම සිදුකිරීමේ අවශ්‍යතාවය වර්ධනය වී ඇත. මෙම අවශ්‍යතාවයට පිළියමක් ලෙස ආතර් සී ක්ලාක් ආයතනය සහ තේ පර්යේෂණ ආයතනය (TRISL) විසින් යාන්ත්‍රිකව තේ දළු නෙලන යන්ත්‍රයක් නිපදවීමට තෝරාගන්නා ලදී. මෙම ව්‍යාපෘතියට අදාල පළමු මූලාකෘතිය 70%කට වඩා වැඩි තෝරා ගැනීමේ නිරවද්‍යතාවයක් සහ තුන් ගුණයක ශ්‍රම කාර්යක්ෂමතාවයක් සහිතව සාර්ථකව සංවර්ධනය කරන ලදී. තවද ක්ෂේත්‍ර පරීක්ෂා කළ හැකි යන්ත්‍ර හතරක් නිෂ්පාදනය කර විවිධ ප්‍රදේශ වල ක්ෂේත්‍ර යෝග්‍යතා පරීක්ෂාවට යොදවා ඇත. මෙමගින් එකතු කරන ලද කාර්ය සාධන දත්ත යොදාගෙන තවදුරටත් මෙම උපකරණ වැඩිදියුණු කිරීමටද බලාපොරොත්තුවේ. විශේෂයෙන්ම තේ දළුවල ද්විතියික වර්ධනය හඳුනාගැනීමට හැකිවන පරිදි මෙම උපකරණය නිපදවා ඇති අතර, එම හැකියාව ශ්‍රී ලංකා තේ අනන්‍යතාවය ආරක්ෂා කරගැනීමට අත්‍යාවශ්‍ය සාධකයකි. මෙම වැඩිදියුණු කිරීම් TRISL විසින් දක්වා ඇති අවශ්‍යතාවලට අනුකූලව සිදු කරන ලදී.

- **තේ වගාකරන දිස්ත්‍රික්ක සඳහා කෘෂි කාලගුණ නිරීක්ෂණ පද්ධතියක් නිර්මාණය කිරීම**

කෘෂිකාර්මික යෙදුම් සඳහා විශේෂිත වූ තත් කාලීන ස්වයංක්‍රීය කාලගුණ මධ්‍යස්ථානයක්, විශේෂයෙන් තේ වතු අංශයේ අවශ්‍යතා සපුරාලීම සඳහා ආයතනය විසින් සාර්ථකව වැඩිදියුණු කර ඇත. 2023 දෙසැම්බර් 31 දින දක්වා ආයතනය විසින් මෙවැනි ස්ථාන 12 ක්, විවිධ තේ වගාකරන දිස්ත්‍රික්කයන්හී ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය (TRISL) විසින් නිර්දේශ කරන ලද ස්ථානවල ස්ථාපනය කර ඇත. මෙම පද්ධති මගින් එකතු කරන ලද දත්ත, කාලගුණය ආශ්‍රිත ආකෘති නිර්මාණය සහ කර්මාන්තශාලා වල තේ සැකසීමේ ක්‍රියාවලිය ප්‍රශස්ත කිරීම සඳහා යොදා ගනී. මෙම පද්ධති හරහා රැස්කරන තත් කාලීන කාලගුණ දත්ත අතර වර්ෂාපතනය, හිරු එළිය ලැබෙන වේලාවන් සහ පාංශු තෙතමනය ඇතුළත්ය. මීට අමතරව, මෙම පද්ධති දැනට තේ වතු සහ කර්මාන්තශාලා විසින් දෛනික මෙහෙයුම්, තීරණ ගැනීම සඳහා භාවිතා කරනු ලැබේ.

2024 වර්ෂය තුළ එවැනි ස්ථාන 08ක්, ශ්‍රී ලංකා තේ මණ්ඩලය මගින් අරමුදල් සපයන ලද ව්‍යාපෘතියක් මගින් ස්ථාපිත කර තිබේ. මෙලෙස පද්ධතියට අලුතින් එක් කරන ලද ස්ථාන වනුයේ මන්දාරම්නුවර, තිස්පනේ, නුවරඑළිය, වැලිපැන්න, කොටපොල, සූරියකන්ද, පුණ්ඩළු ඔය සහ ලූල්කඳුර වේ.



- **ශ්‍රී ලංකා දුම්රිය සේවයේ දුම්රිය එන්ජින් ඉලෙක්ට්‍රොනික පද්ධති ප්‍රතිසාධනය**

  2010 වසරේ සිට නවීන තාක්ෂණ පිළිබඳ ආතර් සී ක්ලාක් ආයතනය විසින් ශ්‍රී ලංකා දුම්රිය සේවය සමඟ කටයුතු කරමින් එහි දෝෂ සහිත දුම්රිය එන්ජින් සහ බල මැදිරි නැවත යථා තත්ත්වයට පත් කිරීමට කටයුතු කර ඇති අතර එමඟින් ආවස්ථික පිරිවැය ලෙස රුපියල් බිලියන ගණනක් ඉතිරිකර ගැනීමට දායක වී ඇත. ප්‍රධාන වශයෙන් 2000 වර්ෂයේදී ප්‍රංශයෙන් ආනයනය කරන ලද ශ්‍රී ලංකා දුම්රිය සමූහයේ බලවත්ම Alstom AD 32C දුම්රිය එන්ජිම ප්‍රතිසාධනය දැක්විය හැක. නවීන තාක්ෂණ පිළිබඳ ආතර් සී ක්ලාක් ආයතනයේ ඉංජිනේරුවන් විසින් දුම්රිය එන්ජින් කට්ටල වල දෝෂ සහිත Alstom AD 32C ඉලෙක්ට්‍රෝනික පාලන පද්ධති ගණනාවක් ප්‍රතිසාධනය කරන ලදී.

  ඒ හැරුණු විට දැනට නවීන තාක්ෂණය පිළිබඳ ආතර් සී ක්ලාක් ආයතනය චීනයේ නිෂ්පාදිත *Sefang* බල මැදිරි උප පද්ධති ප්‍රතිසාධනය කිරීමේ නිරතව සිටී. මෑත අතීතයේදී (2023 දී පමණ) ආයතනය විසින් S10 සහ S12 පන්තියේ බල මැදිරිවල රියදුරු කොන්සෝල උප පද්ධති 35 ක් සාර්ථකව ප්‍රතිසාධනය කර ඇත**.**
  2024 දී ශ්‍රී ලංකා දුම්රිය සේවයට විශේෂිත වූ පද්ධති ප්‍රතිසාධන 08 ක් සිදුකරදී ඇති අතර, එම සේවාව ඔවුන්ගේ මහජන සේවාවන් අඛණ්ඩව පවත්වාගැනීමට උපකාරී වී ඇත.

- **ශිෂ්‍ය දත්ත මොඩියුලය සම්පූර්ණ කිරීම – බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය සඳහා කළමනාකරණ තොරතුරු පද්ධතිය**
  සේවාදායකයාගේ අවශ්‍යතාවය අනුව පහත මොඩියුල පද්ධතියට එකතු කර ඇත.
  - ශිෂ්‍ය අයදුම් කිරීමේ ක්‍රියාවලිය
  - ශිෂ්‍ය ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලිය
  - දර්ශක අංකය ජනනය
  - අවශ්‍ය පරිදි නව වාර්තා ලබාගැනීම

- **තේ වතු අධීක්ෂණය සඳහා දුරස්ථ සංවේදක භාවිතය - උඩරට සහ පහතරට ප්‍රදේශයේ නියමු ව්‍යාපෘතිය**
  පරිමාව අනුව ලොව සිව්වන විශාලතම තේ නිෂ්පාදකයා වුවද, රටේ තේ නිෂ්පාදනය, පස පිරිහීම සහ නැවත වගා කිරීමේ අනුපාතය අඩුවීම යන හේතු මත සැලකිය යුතු ලෙස පහල බැස ඇත. දුරස්ථ සංවේදනය (RS), භූගෝලීය තොරතුරු පද්ධතිය (GIS) සහ ගෝලීය නාවික චන්ද්‍රිකා පද්ධතිය (GNSS) උපයෝගී කර ගනිමින් තේ වගා කරන දිස්ත්‍රික්කවල ඉඩම් පරිහරණ කාර්යක්ෂමතාව ප්‍රශස්ත කිරීම මගින් ජාතික ඵලදායිතාව ඉහළ නැංවීම මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණයි. මෙම ව්‍යාපෘතියේ නිශ්චිත අරමුණු වන්නේ ශ්‍රී ලංකාව පුරා තේ වතු නිරීක්ෂණය කිරීම සඳහා චන්ද්‍රිකා සහ UAV ඡායාරූප ඇතුළුව දුරස්ථ සංවේදනය භාවිතා කිරීම, නියමු අධ්‍යයන ක්ෂේත්‍රය සඳහා තේ නිෂ්පාදනය කෙරෙහි අවධානය යොමු කළ GIS දත්ත ගබඩාවක් සංවර්ධනය කිරීම සහ තේ කර්මාන්තයට අදාල ප්‍රතිපත්ති සැලසුම්කරණයට පහසුකම් සැලසීම සහ ශ්‍රී ලංකාවේ වැවිලි කර්මාන්තය තුළ තීරණ ගැනීමේ ක්‍රියාවලියට RS/ GIS තාක්ෂණය භාවිතය ප්‍රවර්ධනය කිරීම. මෙම ප්‍රමුඛ ව්‍යාපෘතිය යටතේ කොටගල තේ වගා භූමි ප්‍රදේශය සඳහා තීරණ සහායට භූගෝලීය සිතියම් නිෂ්පාදනය සිදුකරන කරන ලදී.

- **විදුලිය බෙදාහැරීමේ ජාලයේ භූගෝලීය ආකෘති නිර්මාණය**

  විදුලිය බෙදාහැරීමේ ක්‍රියාවලියට සම්බන්ධ සමාගම් වලට විදුලිය බෙදාහැරීමේ ජාල සහ පාරිභෝගික තොරතුරු භූගෝලීය දත්ත ඇසුරෙන් ලබාගැනීම සේවා කාර්යක්ෂමතාවය වැඩිකිරීමට මහෝපකාරීවේ. තවද ක්ෂේත්‍රයේ පවතින විවිධ ප්‍රායෝගික දුෂ්කරතාවයන් හේතුවෙන් දත්ත යාවත්කාලීන කිරීම තරමක් අභියෝගාත්මකය. එහෙයින් **GIS** තාක්ෂණය යොදාගෙන ඉහත සියලුම දත්ත සිතියම් ගතකල හැකිවන අතර, එමගින් කළමණාකරන ක්‍රියාවලිය පහසු කරන අතරම වඩාත් කාර්යක්ෂම සේවාවක් ලබාදීමටද උපකාරීවේ. මෙම නියමු ව්‍යාපෘතිය මගින් තෝරාගත් ප්‍රදේශය තුල විදුලිය බෙදාහැරීමේ ජාලය ඩිජිටල්කරණය කිරීම, ක්ෂේත්‍ර දත්ත රැස්කිරීමට ජංගම යෙදුමක් සංවර්ධනය සහ තත්කාලීන දත්ත දෘෂ්‍යකරණය සඳහා සිතියම් යෙදුමක් සංවර්ධනය සිදුකර ඇත.

- **GIS සහ Monte Carlo අනුකාරකය භාවිතා කරමින් චන්ද්‍රිකා දත්ත පදනම් විභව ධීවර කලාප අනාවැකි ලබාගැනීම- පුත්තලම වෙරළ තීරය**

ධීවර කර්මාන්තය, ආහාර සුරක්ෂිතතාව සහ ආර්ථික සංවර්ධනය සඳහා ඉතා වැදගත් වේ. විශේෂයෙන් ශ්‍රී ලංකාවේ මෙම ක්ෂේත්‍රය තුළ පුද්ගලයින් 560,000 කට අධික සංඛ්‍යාවක් සේවය කරන අතර මිලියන 2.7 කට අධික වෙරළබඩ ප්‍රජාවන්ගේ ජීවන අවශ්‍යතාවයන් සපුරාගැනීම සඳහා සහාය වේ. දුරස්ථ සංවේදන තාක්ෂණය මගින් ලබාගන්නා (RS) තත් කාලීන සාගර දත්ත අනුසාරයෙන් මත්ස්‍ය එකතුවීම් ප්‍රදේශ පුරෝකථනය කිරීම සිදුකරයි. කෙසේ වෙතත්, කලාපීය පුරෝකථන ක්‍රම වල හිඟයක් පවතින අතර, නියමු ව්‍යාපෘතියක් ලෙස චන්ද්‍රිකා තාක්ෂණය උපයෝගීකර ලබාගන්නා සාගර දත්ත විශ්ලේෂණය කිරීමෙන් පුත්තලම දිස්ත්‍රික්කයට අයත් මුහුදු තීරයේ ධීවර බිම් පුරෝකථනය කිරීම මෙම පර්යේෂණයේ අරමුණයි. පුත්තලම දිස්ත්‍රික්කයේ වෙරළබඩ තීරයේ විභව ධීවර කලාප (PFZ) ව්‍යාප්තිය තීරණය කිරීම සඳහා ලැන්ඩ්සැට් චන්ද්‍රිකාව මගින් ලබාගන්නා ලද දත්ත විශ්ලේෂණය කිරීම මගින් මත්ස්‍ය සම්පත බහුලව පවතින බව පෙන්නුම් කරන ඉහළ විභවයක් ඇති ජල කලාප, ධීවර බිම් ලෙස හඳුනා ගැනීම මෙම ව්‍යාපෘතිය මගින් සිදුකර ඇත.

- **ශ්‍රී ලංකාව සඳහා SRTM සහ ALOS PALSAR දත්ත භාවිතා කරමින් ජල පෝෂක ප්‍රදේශ හඳුනාගැනීමේ සංසන්දනාත්මක විශ්ලේෂණය**

ජල පෝෂක මායිම්, විශේෂිත ජල මූලාශ්‍ර නිර්නය කිරීමට උපකාර වන අතර, මෙම නිර්ණය කිරීම් පාරිසරික කළමණාකරනය සහ ප්‍රතිපත්ති සම්පාදනයට උපකාරීවේ. තවද මෙම නිර්ණය කිරීම් සම්පත් කළමණාකරනය, ඉඩම් පරිහරණ සැළසුම්කරනය, ජල තත්වයන් පාලනය හා උපද්‍රව කළමනාකරණයටද ඉවහල්වේ. මෙම ව්‍යාපෘතිය මගින් SRTM සහ ALOS PALSAR චන්ද්‍රිකා ඡායාරූප භාවිතයෙන් ශ්‍රී ලංකාව සඳහා ජල පෝෂක මායිම් උත්පාදනය කිරීම, සිතියම්කරණ නිරවද්‍යතාවය වැඩි දියුණු කිරීම සඳහා අවිනිශ්චිතතාවයන් සහ විෂමතා ඇති ප්‍රදේශ හඳුනා ගැනීම සිදුකරයි. මෙය GIS සහ දුරස්ථ සංවේදක තාක්ෂණයන් සඳහා ඇති ඉල්ලුම සමඟ සමපාත වන අතර, ජල පෝෂක කළමනාකරණයට සහ පාරිසරික සැලසුම්කරණයට දායක වීමට ආයතනය සතු හැකියාව ප්‍රකට කරයි. නිශ්චිත ජල පෝෂක මායිම් සංවර්ධනය කිරීම, ඒවායේ ලක්ෂණ අවබෝධ කර ගැනීම සහ පාරිසරික අංශවල තීරණ ගැනීම් හැකියාව වැඩි දියුණු කිරීම මෙම ව්‍යාපෘතියේ අරමුණු වේ.

3.4. කාර්යසාධනය

I. පර්යේෂණ යොමුව - පර්යේෂණ සහ සංවර්ධනය

අනු අංකය	පර්යේෂණ ක්ෂේත්‍රය	පර්යේෂණ සංඛ්‍යාව 2023		පර්යේෂණ සංඛ්‍යාව 2024	
		ඉලක්කය	නිම කළ	ඉලක්කය	නිම කළ
1	ඉලෙක්ට්‍රොනික හා අනෙකුත් සම්බන්ධ විෂය ක්ෂේත්‍ර	12	05	09	05
2	දුරස්ථ සංවේදනය සහ GIS	05	05	05	02
3	තාරකා විද්‍යාව පිළිබඳ පර්යේෂණ	01	01	01	1

II. පර්යේෂණ සහ සංවර්ධනය පවරා දෙනු ලැබූ/ වාණිජකරණය කරන ලද

අනු අංකය	පවරාදෙනු ලැබූ / වාණිජකරණය කළ තාක්ෂණ ක්ෂේත්‍රය හෝ ආකාරය	2023		2024	
		සංඛ්‍යාව	කර්මාන්ත අංශයේ හවුල්කරු	සංඛ්‍යාව	කර්මාන්ත අංශයේ හවුල්කරු
1	කාවැද්දූ පාලන පද්ධති Embedded Control Systems	01	ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය (කෘෂි කාලගුණ විද්‍යා කාලගුණ මධ්‍යස්ථාන දහය)	01	ශ්‍රී ලංකා තේ මණ්ඩලය (කෘෂි කාලගුණ විද්‍යා කාලගුණ මධ්‍යස්ථාන 08ක්)
2	මෙකාට්‍රොනික් /ස්වයංක්‍රීයකරණය	01	ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය	-	-
3	ඉලෙක්ට්‍රොනික	01	ලීඩර් බැටරි නිෂ්පාදන පෞද්ගලික සමාගම	-	-
4	දුරස්ථ සංවේදන සහ GIS			01	වැවිලි කර්මාන්තඅමාත්‍යාංශය සහ තේ පර්යේෂණ ආයතනය. කොටගල තේ කර්මාන්තශාලාවට හූ අවකාශ සිතියම් සහ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට හූ භායන දර්ශක සිතියමක් නිර්මාණය

III. ලබාගත් පේටන්ට් බලපත්‍ර

මෙකාට්‍රොනික් /ස්වයංක්‍රීයකරණය සඳහා 2024 වර්ෂයේදී පේටන්ට් බලපත්‍රයක් ලබා ගෙන ඇත.

IV. විද්‍යාව ප්‍රචලිත කිරීම

ප්‍රචලිත කිරීමේ ක්‍රමවේදය	වැඩසටහන් - 2023			වැඩසටහන් - 2024		
	ඉලක්කගත	ප්‍රගතිය	ප්‍රතිලාභීන්	ඉලක්කගත	ප්‍රගතිය	ප්‍රතිලාභීන්
වැඩමුළු (තාරකා විද්‍යා)	2	1	40	1	1	45
ACCIMTවෙත අධ්‍යාපන චාරිකා	1	1	800	1	1	1076
ජල රොකට් වැඩමුළු/තරඟ	1	1	70	1	1	58
සම්මන්ත්‍රණ	1	0	--	1	1	ACCIMT පර්යේෂක යන්

V. විද්‍යාත්මක ප්‍රකාශන/ පර්යේෂණ පත්‍රිකා

අනු අංකය	ක්ෂේත්‍රය	වර්ගය	2023		2024	
			ඉලක්කය	ප්‍රකාශිත	ඉලක්කය	ප්‍රකාශිත
1	තාරකා විද්‍යා පර්යේෂණ	පර්යේෂණ පත්‍රිකා	1	1	1	1
2	දුරස්ථ සංවේදනය / GIS	පර්යේෂණ පත්‍රිකා	4	3	2	5
3	ඉලෙක්ට්‍රොනික	-	-	-	1	2
4	නවෝත්පාදන කළමණාකරණය	-	-	-	1	1

VI. නව නිපැයුම් සහ නවෝත්පාදන ප්‍රවර්ධනය

ක්ෂේත්‍රය	2023			2024		
	ඉලක්කය	සඵල කරගත් සංඛ්‍යාව	කර්මාන්ත හා සබැඳි සංඛ්‍යාව	ඉලක්කය	සඵල කරගත් සංඛ්‍යාව	කර්මාන්ත හා සබැඳි සංඛ්‍යාව
ඉලෙක්ට්‍රොනික සහ අනෙකුත් අදාළ විෂය ක්ෂේත්‍ර	11	05	05	08	02	05
නැනෝ චන්ද්‍රිකා තාක්ෂණය, ගුවන්විදුලි සංඛ්‍යාතය, මෙකට්‍රොනික්ස්, අභ්‍යවකාශ තාක්ෂණය	08	03	05	04	02	04

VII. තාක්ෂණික සේවා

ආයතනය සිය සේවාවන් වන විදුලි හා ඉලෙක්ට්‍රොනික පරීක්ෂණ සහ මිනුම් උපකරණ ක්‍රමාංකනය, උපාංග සහ මොඩියුලවල කාර්ය සාධන පරීක්ෂාව,තෝරාගත් විද්‍යුත් උපකරණ සමූහයක දෘඪාංග ප්‍රතිසාධනය සහ තාක්ෂණ උපදේශන සේවා සාර්ථකව රාජ්‍ය සහ කාර්මික සේවාදායකයින්ට ලබා දී ඇත. 2024 වර්ෂයේ පළමු මාස 10 සඳහා නියමිත ඉලක්ක සපුරා ගනිමින් ආසන්න වශයෙන් එවැනි පැවරුම් 539ක් සම්පූර්ණ කර ඇත. තවද 2024 දී ආයතනය, 112 දෙනෙකු සඳහා අඛණ්ඩ වෘත්තීය සංවර්ධන පුහුණු වැඩසටහන් 05 ක් සහ 171දෙනෙකු සඳහා මූලික සහ අතරමැදි පුහුණු වැඩසටහන් 07 ක් පවත්වන ලදී.

3.5. 2025 වර්ෂය සඳහා ඉලක්ක

- FPGA (ක්ෂේත්‍ර ක්‍රමාංකිත ද්වාර ආරා) භාවිතා කරමින් වඩාත් නම්‍යශීලීව සනක චන්ද්‍රිකා කර්මාන්තය සඳහා පසුතල පරිපථ පුවරුවක් සැලසුම් කිරීම සහ සංවර්ධනය කිරීම සහ OBC (පුවරුව මත පරිගණක) හැකියාවන් ඊට ඇතුළත් කිරීම. මෙමගින් අනාගත සනක චන්ද්‍රිකාවන්ගේ කාර්යක්ෂමතාවය වැඩිකිරීමට හැකිවන අතර පැටවුම් සඳහා අවකාශය ඉතිරිකර ගැනීමට හැකිවේ.

- නිරීක්ෂණ සහ ද්‍රව පොහොර ඉසීම සඳහා VTOL (සිරස් අතට ඉහල නැගීම සහ ගොඩබෑම) වර්ගයේ ඩ්‍රෝන යානයක් සංවර්ධනය කිරීම සහ ශ්‍රී ලංකාව තුළ එයට අදාල ක්ෂේත්‍රයේ සංවර්ධන හා නිෂ්පාදන හැකියාවන් ඉහළ නැංවීම සඳහා ශ්‍රී ලංකා ගුවන් හමුදාව සමඟ සහයෝගීතා ව්‍යාපෘති ආරම්භ කිරීම.

- නිරීක්ෂණ, කෘෂිකර්මය, ආපදා කළමනාකරණය වැනි අංශ සඳහා විශේෂිත වූ ඩ්‍රෝන සංවර්ධනය කිරීම.
- ඉහළ සමාජ-ආර්ථික බලපෑමක් ඇති කාර්මික විසඳුම් සහ ඉලෙක්ට්‍රොනික නිෂ්පාදන සංවර්ධනය සඳහා ඉලෙක්ට්‍රොනික, ක්ෂුද්‍ර ඉලෙක්ට්‍රොනික සහ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ව්‍යාපෘති ඇරඹීම.
- නවීන ඉලෙක්ට්‍රොනික පද්ධතිවල දෘඪාංග ප්‍රතිසාධනය (උදා. දුම්රිය එන්ජින්වල ප්‍රධාන පාලන ඒකක) සහ පරීක්ෂණ, මිනුම් උපකරණ සහ වෛද්‍ය උපකරණ ප්‍රතිසාධනය.
- ශ්‍රී ලංකාවේ තේ කර්මාන්තය ඉලක්ක කර ගනිමින් ඉලෙක්ට්‍රොනික සහ යාන්ත්‍රීය තාක්ෂණ ඇසුරෙන් නිෂ්පාදන වාණිජකරණය කිරීම.
- මෝටර් රථ බැටරි නිෂ්පාදන සහ අපනයන සමාගමක් සඳහා කර්මාන්තශාලා අනුකූලතා පරීක්ෂණය සඳහා උපකාරී වන විශේෂිත උපකරණ සංවර්ධනය කිරීම.
- අකුණු ආරක්ෂණයට අදාළ සේවාවන් වැඩිදියුණු කිරීම.
- ආයතනයේ ප්‍රවීණතා ක්ෂේත්‍රවලට අදාල අඛණ්ඩ වෘත්තීය සංවර්ධන (CPD) සහ මූලික සහ අතරමැදි පුහුණු වැඩසටහන් පැවැත්වීම.
- කර්මාන්ත සඳහා කාර්ය සාධන පරීක්ෂණ සහ ක්‍රමාංකන සේවා සැපයීම.
- කර්මාන්ත සඳහා උපදේශන සේවා සහ උපකරණ පද්ධති ප්‍රතිසාධනය සේවා කටයුතු සිදු කිරීම.
- තාරකා විද්‍යා පර්යේෂණ ව්‍යාපෘති සහ ප්‍රචලිත කිරීමේ ක්‍රියාකාරකම් සිදුකිරීම

4. කාර්මික තාක්ෂණ ආයතනය (ITI)

4.1. හැඳින්වීම

කාර්මික තාක්ෂණ ආයතනය (ITI) යනු 1994 අංක 11 දරන විද්‍යා හා තාක්ෂණ හා සංවර්ධන පනත යටතේ 1998 අප්‍රේල් 01 දින පිහිටුවන ලද ව්‍යවස්ථාපිත මණ්ඩලයකි. කාර්මික තාක්ෂණ ආයතනය යනු 1955 අංක 15 දරණ පාර්ලිමේන්තු පනත (CISIR පනත) යටතේ රටේ කාර්මික සංවර්ධනයට සහාය වීම සඳහා 1955 දී පිහිටුවන ලද ලංකා විද්‍යාත්මක හා කාර්මික පර්යේෂණ ආයතනයේ (CISIR) අනුප්‍රාප්තිකයා වේ. කාර්මික තාක්ෂණ ආයතනය යනු ශ්‍රී ලංකාවේ රජය සතු රටේ ප්‍රමුඛතම සහ විශාලතම විද්‍යාත්මක පර්යේෂණ හා සංවර්ධන සහ සේවා සංවිධානය වන අතර එය බහු විද්‍යාත්මක කාර්ය මණ්ඩලයකින් සමන්විත වේ. ආයතනයේ මූලික කර්තව්‍ය වන්නේ පර්යේෂණ සහ සංවර්ධන, උපදේශන, තාක්ෂණ හුවමාරුව, පුහුණුව, පරීක්ෂණ සහ ක්‍රමාංකන සේවා සැපයීම හරහා කාර්මික සංවර්ධනය ප්‍රවර්ධනය කිරීමයි. ප්‍රවීණතා පරීක්ෂණ (PT) සපයන්නෙකු ලෙස ISO 17025:2017 සහ ISO 17043:2010 විද්‍යාගාර තත්ත්ව කළමනාකරණ පද්ධති පවත්වාගෙන යාමෙන් ඉහළම වෘත්තීය ප්‍රමිතීන්ට අනුකූලව ක්‍රමාංකනය සහ තාක්ෂණික සේවා සැපයීම ITI සහතික කරයි.

දැක්ම

ජාතික සංවර්ධනය උදෙසා විද්‍යාත්මක හා කාර්මික පර්යේෂණවල විශිෂ්ටත්ව මධ්‍යස්ථානයක් වීම

මෙහෙවර

ශ්‍රී ලංකාවේ ජනතාවගේ යහපත සඳහා කාර්මික සංවර්ධනය වේගවත් කිරීමට නව්‍ය පර්යේෂණ හා සංවර්ධන කටයුතු සිදුකිරීම හා ජාත්‍යන්තර වශයෙන් තරගකාරී තාක්ෂණික සේවා සැපයීම

4.2. ආයතනයේ කාර්යයන්

තාක්ෂණ ආයතනය ඉල්ලුම බද්ධගත ආයතනයනක් විය යුතුය. තාක්ෂණ ආයතනයේ අරමුණු වේගවත්ව කාර්මිකකරණය සඳහා අවශ්‍ය මට්ටමට ශ්‍රී ලංකාවේ තාක්ෂණ මට්ටමට උසස් කිරීම විය යුතු අතර මේ අරමුණ වැඩිදියුණු කිරීමෙලා එහි කර්තව්‍යයන් පහත පරිදි වේ ,

- කර්මාන්ත වැඩිදියුණු කිරීමට සහාය වීම
    I. නිෂ්පාදනවල තත්ත්වය, තාක්ෂණික කර්මාන්තවලදී භාවිත කරනු ලබන තාක්ෂණික ක්‍රියාවලිය හා ක්‍රම වැඩිදියුනු කිරීම සඳහා සහ කර්මාන්ත වලදී භාවිතා කිරීම පිණිස අලුත් ක්‍රියාවලියන් හා ක්‍රමෝපායන් සොයා ගැනීම සඳහා පරීක්ෂණ, විමර්ශන හා පර්යේෂණ ගිවිසුම් මත භාරගැනීම
    II. තාක්ෂණ සේවා සහ උපදේශන සේවා සැපයීම.
    III. තාක්ෂණ පැවරුම්, තාක්ෂණ අනුවර්තන සහ නව තාක්ෂණ සංවර්ධනය කිරීම හා සම්බන්ධ කටයුතුවල නිරතවීම
- කාර්මික තාක්ෂණ සංවර්ධනය වේගවත් කිරීමේ අදහසින් පර්යේෂණ පවත්වාගෙන යාම
- කාර්මික සංවර්ධනය වේගවත් කිරීමේ අරමුණින් ප්‍රයෝජනවත් තාක්ෂණික තොරතුරු එකතු කිරීම සහ සකස් කිරීම විශේෂයෙන්ම “Shelf Technology” පිළිබඳ තොරතුරු ප්‍රචලිත කිරීම.
- තාක්ෂණ ආයතනයේ ලබා ඇති පලපුරුද්දට අදාල ක්ෂේත්‍රවල පුද්ගලයන් පුහුණු කිරීමට භාර ගැනීම
- පරිසර දූෂණය පිළිබඳ සමීක්ෂණය සහ අධීක්ෂණය කිරීම, එවැනි දූෂණයන් අවම කිරීම සඳහා ප්‍රතිකර්ම නිර්දේශ කිරීම සඳහා භාර ගැනීම සහ සහයෝගය දැක්වීම
- කාර්මික තාක්ෂණ සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම සඳහා ඉල්ලීම මත පදනම් වූ පර්යේෂණ සඳහා රජයේ දෙපාර්තමේන්තු සහ ආයතන, විශ්ව විද්‍යාල කාර්මික විද්‍යාල සහ අනෙකුත් ආයතන සමග සහයෝගයෙන් කටයුතු කිරීම .

4.3 2024 වර්ෂයේ ජයග්‍රහණයන්

- නව ව්‍යාපාර දියත් කිරීමට ක්ෂුද්‍ර සහ සුළු පරිමාණ කර්මාන්ත බලගැන්වීම සහ පවතින ව්‍යාපාරවල හැකියාවන් සහ විෂය පථය පුළුල් කිරීම සඳහා විවිධ කර්මාන්ත සඳහා තාක්ෂණික හුවමාරු කිරීම් 68 කට වඩා සාර්ථකව සිදු කරන ලදී. මෙම තාක්ෂණයන් ආහාර පාන වර්ග, ඖෂධ පැළෑටි ආශ්‍රිත රූපලාවන්‍ය නිෂ්පාදන සහ ආහාර අතිරේක සහ ගෘහ ආරක්ෂණ නිෂ්පාදන ඇතුළු පුළුල් පරාසයකින් හෙබි කර්මාන්ත අංශ වෙත හුවමාරු විය.

- රටේ පර්යේෂණ සහ සංවර්ධන සහ නවෝත්පාදයන් පෝෂණය කිරීමේ අරමුණින් පර්යේෂණ සහ සංවර්ධන ව්‍යාපෘති 50 කට වැඩි ප්‍රමාණයක් ක්‍රියාත්මක වෙමින් පවතී. මෙම පර්යේෂණ සහ සංවර්ධන මුලපිරීම් නව නිෂ්පාදන, ක්‍රියාවලි සහ විද්‍යාත්මක ක්‍රමවේද සංවර්ධනය කෙරෙහි අවධානය යොමු කර ඇත.
- කුඩා හා මධ්‍යපරිමාණ ව්‍යවසායකයින් සඳහා තාක්ෂණික සහාය ලබාදීම සඳහා විදාතා සහ ග්‍රාමීය ආධාරක මුලපිරීම් ඇතුළු වැඩ සටහන් 100 කට වැඩි සංඛ්‍යාවක් ක්‍රියාත්මක කරන ලදී.
- කාර්මික කුසලතා සහ ධාරිතාව ශක්තිමත් කිරීම සඳහා විවිධ කර්මාන්තවලින් සහාභාගී වූවන් 500ක් ආකර්ශනය කර ගනිමින් පුහුණු වැඩසටහන් 100කට වැඩි සංඛ්‍යාවක් පවත්වන ලදී .
- තාක්ෂණික සේවා අංශයේ ප්‍රතිතනය ලත් රසායනාගාර විසින් අපනයනය ඉලක්ක කරගත් අංශ සහ රාජ්‍ය ආයතන ඇතුළු කර්මාන්ත සඳහා පරීක්ෂණ සහ ක්‍රමාංකන වාර්තා 17857 ක් සාර්ථකව නිකුත් කර ඇත.
- ITI විසින් පුළුල් පරාසයක පාරිසරික තාක්ෂණය සහ අපද්‍රව්‍ය කළමනාකරණ විෂයයන් හරහා උපදේශන සේවා 1000 ක් පවත්වන ලදී. අවට වායු තත්ත්ව තක්සේරුව, සමුච්චිත විමෝචන අධීක්ෂණය, වායු දූෂණය පාලනය සහ අවම කිරීම, අපජල පවිත්‍රකරණය, ඝන අපද්‍රව්‍ය කළමනාකරණ,ජල තත්ත්ව අධ්‍යයන, අන්තරායකර අපද්‍රව්‍ය කළමනාකරණය සහ මූලික සමීක්ෂණ සිදු කරන ලදී.
- ITI විසින් විවිධ විෂය ක්ෂේත්‍රයන්හි කොන්ත්‍රාත් ව්‍යාපෘති 138 ක් සාර්ථකව සිදු කරන ලදී.
- පර්යේෂණ ලිපි 20ක් පමණ ඉහල බලපෑමක් සහිත/සමාලෝචිත සඟරාවල ප්‍රකාශයට පත් කරන ලද අතර දේශීය හා ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ක්‍රියාදාමයන් තුල සාරාංශ 52 ක් ප්‍රකාශයට පත් කරන ලදි.
- දේශීය පේටන්ට් බලපත්‍ර 6 ක් පමණ ඉදිරිපත් කරන ලදී.
- ජනාධිපති සම්මාන ඇතුළු විද්‍යාත්මක සම්මාන 10 ක් පමණ ලැබී ඇත.

4.3. කාර්යසාධනය

I. පර්යේෂණ හා සංවර්ධනය

අනු අංක	පර්යේෂණ ක්ෂේත්‍ර	2023 පර්යේෂණ සංඛ්‍යාව		2024 පර්යේෂණ සංඛ්‍යාව	
		ඉලක්කය	නිමකල සංඛ්‍යාව	ඉලක්කය	නිමකල සංඛ්‍යාව
1.	ආහාර තාක්ෂණ	12	05	15	-
2.	ශාකසාර තාක්ෂණ	12	06	10	-
3.	ද්‍රව්‍ය තාක්ෂණ	10	03	11	02
4.	ජෛව තාක්ෂණය	03	01	04	-
5.	භෞතික / රසායනික තාක්ෂණය	-	-	01	-
6.	පරිසර තාක්ෂණය	02	01	03	-

II. පර්යේෂණ සහ සංවර්ධන ප්‍රතිඵල/ තාක්‍ෂණික හුවමාරු /වානිජකරනය වූ තාක්ෂණ

අනු අංකය	පර්යේෂණ ක්ෂේත්‍රය	2023		2024	
		සංඛ්‍යාව	කර්මාන්ත අංශයේ හවුල්කරු	සංඛ්‍යාව	කර්මාන්ත අංශයේ හවුල්කරු
1.	ආහාර තාක්ෂණ	27	හරිශ්වන්ද්‍ර මිල්ස්, මෙන්ටේ, පුද්ගලික. ලිමිටඩ් ලංකා පොල් පුද්ගලික. ලිමිටඩ්, Jwellex Agri, විද්‍යාතා etc.	39	සීරෙන්ඩිබ් ග්ලෝබල් ට්‍රේඩින් (පුද්ගලික) සමාගම, ලිබර්ටි රීට් (පුද්ගලික) මෙන්ටේ (පුද්ගලික) සමාගම,Cee Green Engineering (Pvt) Limited,
2.	ශාකසාර තාක්ෂණය / තාක්ෂණ ව්‍යවසායකත්වය	10	K&M Herbals, Challenge Lanka Agro Products, Blue Earth Pvt. Ltd, විද්‍යාතා ව්‍යවසායකයින්	16	WaterFront Properties (Pvt) Limited, Artigala Ayurvedic (Pvt) Limited
3.	ද්‍රව්‍ය තාක්ෂණ	11	විද්‍යාතා, කණ්ඩායම් තාක්ෂණ පැවරුම් වැඩසටහන	13	Sakura Graphite (Pvt) Limited,ශ්‍රී ලංකා රතු කුරුස සමාජය , Taprobane International (Pvt) Limited

III. ගොනු කරන ලද / ලබා ගත් පේටන්ට් බලපත්‍ර සංඛ්‍යාව

අංකය	ක්‍රමය	2023		2024	
		ඉලක්කය	නිමකළ සංඛ්‍යාව	ඉලක්කය	නිමකළ සංඛ්‍යාව
1	ඉල්ලුම් කර ඇති පේටන්ට් සංඛ්‍යාව	3	1	6	10
2	ප්‍රදානය කරන ලද පේටන්ට් සංඛ්‍යාව		4		3

IV. විද්‍යාව ප්‍රචලිතකිරීම

2023 වර්ෂයේදී කාර්මික තාක්ෂණ ආයතනයේ කාර්යභාරය පිළිබඳව මහජනතාවගේ දැනුම්වත් භාවය ඉහල නැංවීම සඳහා- පාර්ශවකරුවන් සඳහා වැඩමුළු, ආරාධිත දේශන, දැනුවත්කිරීමේ වැඩමුළු, ප්‍රදර්ශන, තාක්ෂණික සායනයන්, විවෘත දිනයන්, පුවත්පත් ලිපි, රූපවාහිනී, ගුවන්විදුලි වැඩසටහන් 20ක් ඉලක්කකොට 110ක් වැනි විශාල සංඛ්‍යාවක් පැවැත්වීමට හැකි වූ අතර 2024 දී 30ක් ඉලක්කකොට 100ක් සාර්ථකව නිම කරන ලදී.

V. විද්‍යාත්මක ප්‍රකාශන

අනු අංකය	ක්ෂේත්‍රය	2023		2024	
		ඉලක්ක	ප්‍රකාශිත	ඉලක්ක	ප්‍රකාශිත
1	ආහාර තාක්ෂණ, ශාකසාර තාක්ෂණ, ද්‍රව්‍ය තාක්ෂණය, භෞතික රසායනික තාක්ෂණය/ පරිසර තාක්ෂණය	10	40	40	22

VI. නවෝත්පාදන සහ නවෝත්පාදන ප්‍රවර්ධනය

අංකය	ක්ෂේත්‍රය	**2023 නවෝත්පාදන ගණන**			**2024 නවෝත්පාදන ගණන**		
		ඉලක්ක	**ප්‍රකාශිත**	**කර්මාන්ත හා සබැඳි සංඛ්‍යාව**	**ඉලක්ක**	**ප්‍රකාශිත**	**කර්මාන්ත හා සබැඳි සංඛ්‍යාව**
1	ආහාර තාක්ෂණ	20	34	10	20	44	12
2	ශාකසාර තාක්ෂණ						
3	ද්‍රව්‍ය තාක්ෂණ						

VII. වෙනත් විශේෂ වැඩසටහන්

- නව පරීක්ෂණ පරාමිතීන් 67 ක් සඳහා ශ්‍රීලංකා ප්‍රතිතන මණ්ඩලය වෙතින් ප්‍රතීතන සහතික ලබා ගන්නා ලදී .
- පරීක්ෂණාගාර සහ පහසුකම් 07ක් ස්ථාපිත කිරීමෙන් අනතුරුව වැඩිදියුණු කර කර්මාන්ත ක්ෂේත්‍රයේ භාවිතය සඳහා විවෘත කර ඇත. ක්ෂුද්‍ර ප්ලාස්ටික් පරීක්ෂණ රසායනාගාරය, ඖෂධ රසායනාගාරය, ඛනිජ තෙල් සහ ලිහිසි තෙල් පරීක්ෂණ රසායනාගාරය, කාබනික පොහොර පරීක්ෂණාගාරය, ඇසුරුම් පරීක්ෂණ රසායනාගාරය, ජාන නවීකරණය කල ජීවීන් හඳුනාගැනීමේ රසායනාගාරය සහ ITI ව්‍යාපාරික මධ්‍යස්ථානය.
- ද්විවාර්ෂික (6 වැනි) පර්යේෂණ සම්මන්ත්‍රණය සහ පළමු ජාත්‍යන්තර සම්මන්ත්‍රණය 2023 නොවැම්බර් මාසයේදී පැවැත්විණි.
- කර්මාන්ත අමාත්‍යාංශය සමඟ ආයෝජක සංසද 03ක් සංවිධානය කිරීමට ITI ක්‍රියාකාරීව සම්බන්ධ වූ අතර ආයෝජකයින් ආකර්ෂණය කර ගැනීම සඳහා ITI විසින් දියුණු කරන ලද තාක්ෂණයන් ප්‍රදර්ශනය කිරීමට හැකි විය.
- ජාත්‍යන්තර උපදේශනය - ඉන්දුනීසියාව මධ්‍යම සුලවෙසිහි PT SALS and Sons (පෞද්) සමාගම සඳහා තාප ක්‍රියාවලි සත්‍යාපනය

4.4. 2025 වර්ෂය සඳහා ඉලක්ක

- ව්‍යාපාර විවිධාංගීකරණය: සමස්ත මූල්‍ය ස්ථාවරත්වය ඉහළ නැංවීම සඳහා ආයතනයේ ආදායම් මූලාශ්‍ර සහ නව ආදායම් අවස්ථා විවිධාංගීකරණය කිරීම,උදා. නව LC/MS/MS පද්ධතිය සමඟ අවශේෂ විශ්ලේෂණ රසායනාගාරය වැඩිදියුණු කිරීම, වෘත්තීය ආරක්ෂණ අධීක්ෂණ පහසුකම ස්ථාපිත කිරීම, රසායනික විමර්ශන රසායනාගාරයක් පිහිටුවීම, ආහාර සුරක්ෂිතතා කළමනාකරණ මධ්‍යස්ථානයක් ඇති කිරීම
- නව නිෂ්පාදන, ක්‍රියාවලි සංවර්ධනය ඉලක්ක කර ගනිමින් ජාතික ප්‍රතිපත්ති / පර්යේෂණ සහ සංවර්ධන ප්‍රතිපත්තියට අනුකූලව අවම වශයෙන් විශාල පරිමාණයේ පර්යේෂණ සහ සංවර්ධන ව්‍යාපෘති 3ක් ආරම්භ කිරීම උදා. සිලිකා / මැටි වලට අගය එකතු කිරීම
- කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ආශ්‍රිත මධ්‍ය පහසුකම් ස්ථාපිත කිරීම සඳහා ව්‍යාපෘති දෙකක් ආරම්භ කිරීම: අපද්‍රව්‍ය ශුන්‍ය සංකල්පයක් සහිත කරන්දෙණියේ කුරුඳු සඳහා මධ්‍යම සැකසුම් පහසුකම සහ නිසි වටිනාකම් දාම සංකල්පය හඳුන්වාදීමත් සමඟ බණ්ඩාරවෙලදී නැවුම් එළවළු සඳහා ආදර්ශ පැක් හවුස් පහසුකම
- S&T ව්‍යාපාරික මධ්‍යස්ථානය හරහා තාක්ෂණ බැංකුවෙන් අවම වශයෙන් තාක්‍ෂණ 10ක් (> LKR Mn 2.0) වාණිජකරණය කිරීම
- ව්‍යාපාර ආරම්භයන් සඳහා සහාය වීම උදෙසා නිෂ්පාදන ක්‍රි යාවලි ඉන්කියුබේටර් සහ ඇක්සලරේටර් ස්ථාපනය කිරීම ආරම්භ කිරීම
- ITI තාක්ෂණික පුස්තකාලය ඩිජිටල්කරණය සහ පුහුණු මධ්‍යස්ථානයක් පිහිටුවීම

5. ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව (NASTEC)

5.1. හැඳින්වීම

ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව 1994 අංක 11 දරන විද්‍යා හා තාක්ෂණ සංවර්ධන පනත මගින් ස්ථාපනය කරන ලද ආයතනයකි. 1998 දෙසැම්බර් මස 06 වන දින විධිමත් පරිදි අරඹන ලද එය 1999 ජනවාරි මාසයේ දී සක්‍රීය කොමිෂන් සභාවක් බවට පත්විය. දැනට බත්තරමුල්ල පිහිටි සෙත්සිරිපාය දෙවන අදියරෙහි 6 වන මහලෙහි පිහිටුවා ඇත. ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව ශ්‍රී ලංකා රජය වෙත විද්‍යා හා තාක්ෂණ කරුණු සම්බන්ධයෙන් ප්‍රතිපත්ති සකස් කිරීමේ හා උපදෙස් ලබාදීමේ ප්‍රමුඛතම ආයතනය ලෙස නම් කොට ඇත. කොමිෂන් සභාව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපතිතුමා විසින් පත්කරනු ලබන සාමාජිකයන් සත් දෙනෙකුගෙන් සමන්විත වේ.

දැක්ම

ශ්‍රී ලාංකික ජනතාවගේ යහපත හා සමෘද්ධිය නංවාලනු පිණිස වූ විභවතාව හා ඒ සඳහා විද්‍යාව හා තාක්ෂණය යොදා ගැනීම සඳහා රජයට උපදෙස් ලබාදෙන අති විශිෂ්ට උපදේශනායතනයක් බවට පත්වීම.

මෙහෙවර

තිරසර සංවර්ධනය උදෙසා යොදාගනු පිණිස විද්‍යා හා තාක්ෂණ අංශයන්ගේ උසස් ජාතික හැකියාවන් ගොඩනැගීම උදෙසා රජය වෙත ප්‍රතිපත්ති, ක්‍රමෝපාය හා සැලසුම් සම්පාදනය

5.2. ආයතනයේ කාර්යයන්

- පහත සඳහන් ක්ෂේත්‍රයන්ට අදාළ ප්‍රතිපත්ති හා සැලසුම් ද ඇතුළත්ව විද්‍යා හා තාක්ෂණ සංවර්ධනය සඳහා අවශ්‍ය ප්‍රතිපත්ති හා සැලසුම් සම්බන්ධයෙන් රජයට උපදෙස් ලබා දීම:
    - ආර්ථික අභිවෘද්ධිය උත්තේජනය කරනු පිණිස විද්‍යාව හා තාක්ෂණය යොදා ගැනීම;
    - කර්මාන්ත, කෘෂිකර්ම, සේවා හා ආර්ථික ක්ෂේත්‍රයනට අදාළ කාර්යක්ෂමතාවය හා තරගකාරිත්වය සම්බන්ධයෙන් විද්‍යා හා තාක්ෂණ අංශයේ බලපෑම;
    - ජනතාවගේ ජීවන තත්ත්වය නගා සිටුවනු පිණිස සෞඛ්‍ය, පෝෂණ හා දුගීබව දුරුලීම යන ක්ෂේත්‍රයන් මත විද්‍යාවේ හා තාක්ෂණයේ බලපෑම;
    - අධ්‍යාපන, පුහුණු හා පර්යේෂණ සඳහා වගකිව යුතු වන බලධාරීන්ගේ උපදේශනය සමග විද්‍යාව හා තාක්ෂණය සඳහා අවශ්‍ය මානව හා සෙසු සම්පත් සංවර්ධනය;
    - ශ්‍රී ලංකාවේ ස්වභාවික සම්පත් සංවර්ධනය හා කළමනාකරණය;
    - ජාතික වැදගත්කමකින් යුතු විය හැකි විද්‍යා හා තාක්ෂණ ක්ෂේත්‍රයන් හඳුනා ගැනීම හා ප්‍රමුඛතාගතකරණය;
    - විද්‍යා හා තාක්ෂණ ප්‍රවීණත්වය ගොඩනැගීම, පවත්වා ගැනීම හා ආකර්ශනය සඳහා තුඩු දෙන පරිසරයක් නිර්මාණය කිරීම;
    - විද්‍යාව හා තාක්ෂණය ඵලදායක ලෙස යෙදාගැනීම සඳහා තුඩුදෙන කළමනාකරණ ක්‍රමෝපායන් ස්ථාපනය;
    - විද්‍යා හා තාක්ෂණ ආයතනයන්හි පර්යේෂණ සඳහා අවශ්‍ය අරමුදල්කරණය සඳහා ප්‍රමුඛත්වය ලබාදීම ඇතුළත්ව විද්‍යාව හා තාක්ෂණය සඳහා අරමුදල් වෙන් කිරීම.

- පෙර වසරේ ශ්‍රී ලංකාවේ විද්‍යා හා තාක්ෂණ කටයුතු සමාලෝචනය කරමින් මානව සම්පත් සංවර්ධනය සඳහා වූ ක්‍රියාමාර්ගයන්හි ඵලදායකත්වය, විද්‍යා හා තාක්ෂණ ආයතනයන්හි කාර්ය සාධනය, විද්‍යාව හා තාක්ෂණය සඳහා වූ රජයේ වියදම්හි ඵලදායකත්වය හා රාජ්‍ය අංශය විසින් විද්‍යාව හා තාක්ෂණය යොදා ගැනීම සම්බන්ධයෙන් රජයට වාර්ෂිකව වාර්තාවක් ඉදිරිපත් කිරීම;
- විද්‍යා හා තාක්ෂණ සංවර්ධන පනතේ 2වන කොටස තුළ දක්වා ඇති අරමුණු සම්බන්ධයෙන් විද්‍යා හා තාක්ෂණ ආයතනයන්හි ප්‍රගතිය සමාලෝචනය;

- විද්‍යා හා තාක්ෂණික ආයතනයන්ට අදාළ ප්‍රතිපත්ති හා සැලසුම් පිළිබඳව රජයට උපදෙස් ලබා දීමට ප්‍රථම අදාළ එවන් ආයතනයන්හි අදහස් විමසීම;
- අමාත්‍යවරයාගේ පූර්ව අනුමැතිය සහිතව වසර දෙකකට වරක් ශ්‍රී ලංකා විද්‍යා හා තාක්ෂණ සමුළුව කැඳවා පනතේ 2වන කොටස තුළ දක්වා ඇති අරමුණු හා සම්බන්ධව ශ්‍රී ලංකාවේ විද්‍යාව හා තාක්ෂණය සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමේ සංසදයක් ඇති කිරීම ; හා එම සාකච්ඡාවන් සම්බන්ධ වාර්තාවක් අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කිරීම.

5.3. 2024 වර්ෂයේ ජයග්‍රහණයන්

- බෙන්ගාල බොක්ක ආශ්‍රිත රටවල බහු ආංශික තාක්ෂණික සහයෝගිතාව සඳහා වන එකමුතුව (BIMSTEC) යටතේ විද්‍යාව, තාක්ෂණය සහ නවෝත්පාදනය (STI) පිළිබඳ දෙවන විශේෂඥ සමුළුව පැවැත්වීම.
- 2021 සහ 2022 S&T තත්ත්ව වාර්තා ප්‍රකාශයට පත් කරන ලදී.
- විද්‍යා හා S&T ආයතනික සමාලෝචන ක්‍රියාත්මක කිරීමේ වැඩමුළුව පැවැත්වීම සහ පාර්ශවකාර රජයේ ආයතන සමග රැස්වීමක් පැවැත්වීම
- BICOST X සඳහා ක්‍රියාකාරී කමිටු පත් කිරීම
- 12 වන තරුණ විද්‍යාඥයන්ගේ සංසදය (YSF) පර්යේෂණ සම්මන්ත්‍රණය පැවැත්වීම
- ජාතික පොහොර ලේකම් කාර්යාලය (NFS), අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව (DEA), ආයතනික සමාලෝචනය ආරම්භ කිරීම සහ ජාතික පර්යේෂණ සභාව (NRC), ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම (SLIC) සඳහා ආයතනික සමාලෝචනය නිම කිරීම
- විද්‍යා තාක්ෂණ (S&T) දත්ත රැස් කිරීමේ පද්ධතිය සංවර්ධනය කිරීම (β අනුවාදය)
- නවසීලන්තය, දකුණු කොරියාව, කියුබාව, ඕස්ට්‍රේලියාව සහ තායිලන්තය සමඟ විදේශ සහයෝගීතා ව්‍යාපෘති මුලපිරීම
- ශ්‍රී ලංකා තරුණ විද්‍යාඥයන්ගේ සංගමයේ 2024 වාර්ෂික සමුළුවේ කොටස්කරුවෙකු වීම

5.4. කාර්යසාධනය

I. විද්‍යාව ප්‍රචලිත කිරීම

ප්‍රචලිත කිරීමේ ක්‍රමවේදය	2023 වැඩසටහන්			2024 වැඩසටහන්		
	ඉලක්කගත	ප්‍රගතිය	ප්‍රතිලාභීන් සංඛ්‍යාව	ඉලක්කගත	ප්‍රගතිය	ප්‍රතිලාභීන් සංඛ්‍යාව
1. 9 වන BICOST සම්මන්ත්‍රණය	01	01	500	-	-	-
2. BICOST පශ්චාත් සම්මන්ත්‍රණ ක්‍රියාකාරකම් (ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාකාරකම්)	-	-	-	6	4	300
3. තරුණ විද්‍යාඥයින්ගේ සංසදයේ පර්යේෂණ සම්මන්ත්‍රණය	01	01	90	1	1	80
4. නැගී එන විද්‍යා හා තාක්ෂණ කාරණා පිළිබඳ දැනුම්වත් කිරීමේ මාර්ගගත සම්මන්ත්‍රණ	04	01	110	8	8	800
5. විද්‍යා හා තාක්ෂණ වැඩමුළු	02	01	150	4	4	350

II. විද්‍යාත්මක ප්‍රකාශන

අනු අංකය	ක්ෂේත්‍රය	වර්ගය	2023 ප්‍රකාශන සංඛ්‍යාව		2024 ප්‍රකාශන සංඛ්‍යාව	
			ඉලක්කය	ප්‍රකාශිත	ඉලක්කය	ප්‍රකාශිත
1	කෘෂිකර්මය	ප්‍රතිපත්ති නිර්දේශ වාර්තාව	01	01	01	01
2	බලශක්තිය	ප්‍රතිපත්ති නිර්දේශ වාර්තාව	01	01	01	01
3	සෞඛ්‍යය	ප්‍රතිපත්ති නිර්දේශ වාර්තාව	01	01	01	01
4	ඛනිජ සම්පත්	ප්‍රතිපත්ති නිර්දේශ වාර්තාව	01	01	01	-
5	විද්‍යා හා තාක්ෂණ	තත්ත්ව වාර්තාව	04	02	02	02
6		සමාලෝචන වාර්තා	06	06	04	02
7		සම්මන්ත්‍රණ පත්‍රිකා ප්‍රකාශනය	01	01	01	01
8		තේමාත්මක විද්‍යුත් ග්‍රන්ථ	01	01	01	01
9		අන්තර්ජාලය/ඊ-පුවත්පත් ලිපි	10	07	02	-
10		විද්‍යාත්මක සාරාංශ/ සඟරා ලිපි	04	02	06	06
11		ඇගයීම් කළමණාකරණ වාර්තාව	-	-	01	01

III. වෙනත් විශේෂ වැඩසටහන්

ක්ෂේත්‍රය	2023 වෙනත් වැඩසටහන්		2024 වෙනත් වැඩසටහන්	
	ඉලක්කය	සඵල කර ගත් සංඛ්‍යාව	ඉලක්කය	සඵල කර ගත් සංඛ්‍යාව
ප්‍රතිපත්ති අධ්‍යයනය/ උපදේශනය	09	06	03	01
ජාත්‍යන්තරසබඳතා - සම්මන්ත්‍රණ	03	02	02	01
ජාත්‍යන්තරසබඳතා පුහුණු වැඩමුළු - සම්බන්ධීකරණය	05	03	06	04

5.5. 2025 වර්ෂය සඳහා ඉලක්ක

- විද්‍යා හා තාක්ෂණ (S&T) තත්ත්ව වාර්තා 2023 ප්‍රකාශයට පත් කිරීම සහ පාර්ලිමේන්තු සභාගත කිරීම සහ විද්‍යා හා තාක්ෂණ (S&T) තත්ත්ව වාර්තා 2024 දත්ත රැස් කිරීම
- 10 වන ද්විවාර්ෂික සමුළුව (BICOST) පැවැත්වීම සහ දහවන ද්විවාර්ෂික සමුළුවේ (BICOST X) තාක්ෂණික නිමැවුම් සඳහා ක්‍රියාත්මක කිරීමේ සැලැස්මක් සකස් කිරීම
- විද්‍යා හා තාක්ෂණ (S&T) ආයතන සඳහා ඩිජිටල් දත්ත පද්ධතියක් සැකසීම
- 13 වැනි තරුණ විද්‍යාඥයන්ගේ සංසදය (YSF) සම්මන්ත්‍රණය කැඳවීම
- විද්‍යාව, තාක්ෂණය, නවෝත්පාදනය (STI) සංවර්ධනයට අදාළ රජයේ ප්‍රමුඛතා ක්ෂේත්‍ර සඳහා මාර්ග සිතියමක් සකස් කිරීම
- ව්‍යාපෘති යෝජනා ඉදිරිපත් කිරීම පිළිබඳව විද්‍යා හා තාක්ෂණ (S&T) ආයතනවල විද්‍යාත්මක සේවක සංඛ්‍යාව පුහුණු කිරීම
- විද්‍යා හා තාක්ෂණ (S&T) ආයතන 10 ක සමාලෝචනය සම්පූර්ණ කිරීම: GSMB, ACCMIT, MRI, SEA, කාලගුණ දෙපාර්තමේන්තුව, NIHS, SLSI, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව, DMS, ජල සම්පත් මණ්ඩලය, වාරිමාර්ග දෙපාර්තමේන්තුව සහ නව ආයතන 10ක සමාලෝචන ආරම්භ කිරීම
- විද්‍යා ප්‍රතිපත්තියේ විදේශීය සහයෝගීතා ව්‍යාපෘති 2ක් පැවැත්වීම
- NASTEC ප්‍රතිපත්ති පුස්තකාලය ස්ථාපනය කිරීම

6. ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය (NERDC)

6.1. හැඳින්වීම

ශ්‍රී ලංකා ප්‍රමුඛතම ඉංජිනේරු පර්යේෂණ ආයතනය වන ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය 1957 අංක 49 දරණ රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ ප්‍රතිපාදන අනුව 1974 දී ආරම්භ කරන ලද අතර, වර්තමානයේදී විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වේ. 2024 ජනවාරි සිට දෙසැම්බර් දක්වා කාල පරිච්ඡේදය තුළ ජාතික ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය සිදු කළ පර්යේෂණ හා සංවර්ධන ව්‍යාපෘති සම්පූර්ණ කිරීම, වාණිජකරණය, පේටන්ට් බලපත්‍රය ලබාගැනීම හා ප්‍රචලිත කිරීම සහ ආයතනය ලැබූ විශේෂ ජයග්‍රහණ පිළිබඳ දත්ත මෙම වාර්තාවෙන් ඉදිරිපත් කරයි. නර්ඩ් ආයතනය ජාතික වැදගත්කමකින් යුත් ක්ෂේත්‍ර ගණනාවක් ඔස්සේ නවතම ඉංජිනේරු සොයාගැනීම් සඳහා විවිධ පර්යේෂණ ව්‍යාපෘති කරගෙන යනු ලබයි. එසේම හඳුන්වාදුන් තාක්ෂණයන් පදනම් කරගෙන නියමු ව්‍යාපෘති ආරම්භ කිරීම කර්මාන්ත ක්ෂේත්‍රයේ පවතින ගැටළු සඳහා විසඳුම් ලබා දීම, කර්මාන්ත සඳහා අවශ්‍ය සේවාවන් සැපයීම, නව තාක්ෂණයන් ජනතාව අතර ප්‍රචලිත කිරීම සහ පාසල් ළමුන් අතර හා සාමාන්‍ය ජනතාව අතර විද්‍යා දැනුම වැඩි දියුණු කිරීම ආදි කටයුතු ද නර්ඩ් ආයතනයේ ප්‍රධාන කාර්යයන් වේ.

දැක්ම

දකුණු ආසියාවේ ප්‍රමුඛතම ඉංජිනේරු පර්යේෂණ මධ්‍යස්ථානය බවට පත්වීම

මෙහෙවර

නව නිපැයුම් හා ආයතනයේ කාර්ය මණ්ඩලය මෙන්ම ආයතනය පිළිබඳ උනන්දුවක් දක්වන සියලු පාර්ශවයන්ගේ නිර්මාණශීලීත්වය ප්‍රවර්ධනය වන සංස්කෘතියක් ආයතනය තුළ ඇති කරමින් ශ්‍රී ලංකාවේ සමාජ ආර්ථික සංවර්ධනය සඳහා සෘජුව බලපෑමක් කළ හැකි ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන කටයුතු සිදුකරමින් ඉංජිනේරු තාක්ෂණයන් සංවර්ධනය, අත්පත්කරගැනීම, භාවිතා කිරීම සහ පැවරීම

6.2. ආයතනයේ කාර්යයන්

- ජාතික අවශ්‍යතාවයන් සඳහා ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධනයන් හී දායකත්වය සහතික කිරීම.
- කර්මාන්ත කේන්ද්‍රීය මධ්‍යස්ථානයක් බවට නර්ඩ් ආයතනය පත් කිරීම.
- ඉංජිනේරුමය යෙදවීම් හා විසඳුම් හරහා දේශීය අපනයන කර්මාන්ත වැඩිදියුණු කිරීම හා ප්‍රවර්ධනය කිරීම.
- බලශක්ති සංරක්ෂණය හා පාරිසරික තිරසාර බව සඳහා ඉංජිනේරුමය මැදිහත්වීමක් සිදු කිරීම.
- ජාත්‍යන්තර පර්යේෂණ, නිර්මාණ හා සංවර්ධන ක්ෂේත්‍රයන් හී දියුණු වන ඉංජිනේරුමය දැනුමට සමගාමීව නර්ඩ් ආයතනය තරඟකාරී පර්යේෂණ සහ සංවර්ධන ආයතනයක් බවට පත් කිරීම.

6.3. 2024 වර්ෂයේ ජයග්‍රහණයන්

- ගොඩනැගිලි ඉදිකිරීමේදී භාවිතා කිරීම සඳහා වියදම් පිරිමැසුම්දායක සැහැල්ලු බ්ලොක් ගලක් නිෂ්පාදනය කිරීමේ ව්‍යාපෘතිය සහ එහි නිෂ්පාදන ප්‍රවර්ධනය ව්‍යාපෘතියද අවසන් කරන ලදී. සාමාන්‍ය බ්ලොක් ගල් හා සැසඳීමේදී සැහැල්ලු ගලක 42% ක බර අඩුවීමක් ඇති අතර කපරාදු කිරීමක් ද අවශ්‍ය නොවන බැවින් 22%ක වියදම් අඩුවීමක් ද ඇත.

- ජාතික ජලසම්පාදන හා ජලාපවාහන මණ්ඩලය සමග ඒකාබද්ධව සිදු කෙරුණු ජල පිරිපහදුවේදී ඇතිවන රොන්මඩ (Sludge) භාවිතාකර සම්පින්ඩිත ස්ථායි පස්ගල් (Compressed Stabilized Block) සෑදීම සඳහා ආරම්භ කරන ලද ව්‍යාපෘතිය සාර්ථකව නිම කරන ලදී. ඉවතලන රොන්මඩ ප්‍රයෝජනවත් කාර්යයන් සඳහා භාවිතා කිරීමට පිණිස ආරම්භ කරන ලද මෙම ව්‍යාපෘතිය පිළිබඳව තාක්ෂණය පැවරීමට බලාපොරොත්තු වන පාර්ශ්වයන් හට දැනුවත් කිරීමේ වැඩසටහන් ජාතික ජලසම්පාදන හා ජලාපවාහන මණ්ඩලය හා ඒකාබද්ධව පවත්වන ලදී.

- නර්ඩ් ආයතනය, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය, මොරටුව විශ්ව විද්‍යාලය සහ විවෘත විශ්ව විද්‍යාලය යන බාහිර පර්යේෂකයන් හා ඒකාබද්ධව සිදු කරන ලද ඉවත ලද ජීව පදාර්ථ මගින් ජීව අඟුරු නිෂ්පාදනය සඳහා මුලාකෘති යන්ත්‍රයක් නිෂ්පාදනය කිරීමේ ව්‍යාපෘතිය සාර්ථකව නිම කරන ලදී. නර්ඩ් ආයතනය මගින් නිෂ්පාදන කරන ලද මෙම යන්ත්‍රය බස්නාහිර පළාත් අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරියට අයත් කරදියාන කොම්පොස්ට් අංගනයේ සවිකර පරික්ෂා කරන ලදී.

- 2023 වසරේදී ආරම්භ කරන ලද ගොඩනැගිලි ඉදිකිරීමේදී භාවිතා කිරීම සඳහා නව පෙරසවි සහ පෙරනිමි ස්ලැබ් තාක්ෂණයක් හඳුන්වාදීමේ ව්‍යාපෘතියක් සාර්ථකව අවසන් කරන ලදී. සාමාන්‍ය කොන්ක්‍රීට් ස්ලැබ් හා සැසඳීමේදී මේ මගින් ඉදිකිරීම් කාලය සැලකිය යුතු ලෙස අඩුවන අතර 20%ක පමණ වියදම් ඉතිරියක් සිදුවේ.

- දේසිංහ පතිරගේ මෝටර් සමාගම සමඟ නර්ඩ් ආයතනය ඒකාබද්ධව සිදු කරන දේශීය අගය වැඩි කිරීම සහිත ත්‍රීවීලර් රථයක් නිර්මාණය කිරීමේ ව්‍යාපෘතිය සඳහා නර්ඩ් ආයතනය මගින් නව චැසියක් නිර්මාණය කරන ලදී. මෙහි පේටන්ට් බලපත්‍රයක් සඳහා අයදුම් කර ඇත. මෙම චැසිය නිර්මාණය කිරීම, ත්‍රී වීලර් රථයේ දේශීයව එක්කරන අගය වැඩි කිරීම සඳහා බෙහෙවින් ඉවහල් වන අතර, මෙම වසරේ අවසාන කාර්තුවේදී මෙම රථයේ මුලාකෘතියක් එළි දැක්වීමට කටයුතු සුදානම්කර ඇත.

- නැනෝ විෂන් අනුරාධපුර පුද්ගලික කර්මාන්තකරු හා ඒකාබද්ධව අලින් පලවාහැරීම සඳහා අධි වොල්ටීයතා සහිත අලි වැට සඳහා විදුලිය සපයන විදුලි පද්ධතියේ ගුණාත්මක බව වැඩි දියුණු කිරීම සඳහා ව්‍යාපෘතියක් ආරම්භ කරන ලදී. මෙම විදුලි පද්ධතියේ මුලික වැඩි දියුණු කිරීම් අවසන්කර ප්‍රායෝගික භාවිතය සඳහා කර්මාන්තකරුවා හට භාර දීමට හා ක්ෂේත්‍ර පරික්ෂාවන් සඳහා යෙදවීමට කටයුතු සුදානම්කර ඇත.

6.4. කාර්යසාධනය

I. පර්යේෂණ යොමුව - පර්යේෂණ සහ සංවර්ධන

අනු අංක	පර්යේෂණ ක්ෂේත්‍රය	2023 පර්යේෂණ සංඛ්‍යාව		2024 පර්යේෂණ සංඛ්‍යාව	
		ඉලක්ක	නිමකළ	ඉලක්ක	නිමකළ
1.	සිවිල් ඉංජිනේරු	4	3	2	2
2.	යාන්ත්‍රික ඉංජිනේරු	4	1	7	2
4.	මෙකාට්‍රොනික් හා රොබෝ තාක්ෂණය	5	2	3	1
5.	විදුලි හා විද්‍යුත් ඉංජිනේරු	5		6	2

II. පර්යේෂණ හා සංවර්ධන පවරා දෙනු ලැබූ/ වානිජකරණය කරන ලද

අනු අංක	පවරා දෙනු ලැබූ/ වානිජකරණය කළ තාක්ෂණ ක්ෂේත්‍රය	2023		2024	
		සංඛ්‍යාව	කර්මාන්ත අංශයේ හවුල්කරු	සංඛ්‍යාව	කර්මාන්ත අංශයේ හවුල්කරු
1.	සිවිල් ඉංජිනේරු	6	6	03	08
2.	යාන්ත්‍රික ඉංජිනේරු	3	3	03	03
3.	බලශක්ති සහ පාරිසරික ඉංජිනේරු	1	1	04	05

III. ගොනුකරන ලද / ලබාගත් පේටන්ට් බලපත්‍ර

ක්ෂේත්‍රය	ආකාරය	2023 වර්ෂය		2024 වර්ෂය	
		ඉලක්ක	ප්‍රගතිය	ඉලක්ක	ප්‍රගතිය
සිවිල් ඉංජිනේරු	ගොනුකරන ලද පේටන්ට් බලපත්‍ර	-	1		2
	ලබාගත් පේටන්ට් බලපත්‍ර	1	1		
යාන්ත්‍රික ඉංජිනේරු	ගොනුකරන ලද පේටන්ට් බලපත්‍ර	-	1		
	ලබාගත් පේටන්ට් බලපත්‍ර	-	1	1	
මෙකාට්‍රොනික් හා රොබෝ තාක්ෂණය	ගොනුකරන ලද පේටන්ට් බලපත්‍ර	4	1		
	ලබාගත් පේටන්ට් බලපත්‍ර	-	-	2	
විදුලි හා විද්‍යුත් ඉංජිනේරු	ලබාගත් පේටන්ට් බලපත්‍ර	-	-	1	

IV. විද්‍යාව ප්‍රචලිත කිරීම

ප්‍රචලිත කිරීමේ ක්‍රමවේදය	2023 වැඩසටහන් සංඛ්‍යාව			2024 වැඩසටහන් සංඛ්‍යාව		
	ඉලක්කගත	සම්පූර්ණ කරන ලද	ප්‍රතිලාභීන්	ඉලක්කගත	සම්පූර්ණ කරන ලද	ප්‍රතිලාභීන්
1.දැනුවත් කිරීමේ/පුහුණු වැඩසටහන්	17	**11**	1302	18	22	1330
2. තාක්ෂණ උද්‍යානය සහ කෞතුකාගාරය නරඹන්නන්	7500	5104	5104	10000	4488	4488
3.මාධ්‍ය වැඩසටහන්	3	5	**-**	4	12	-
4. ප්‍රදර්ශන	2	8	**-**	5	9	-
5. පාසල් ගුරුවරුන් සඳහා ගණිත පුහුණු වැඩසටහන්	2	**2**	**66**	4	5	360
6.පර්යේෂණ වැඩමුළු	-	01	200	1	01	200

V. විද්‍යා ප්‍රකාශන (පුවත්පත්/ සඟරා ලිපි)

අනු අංකය	ක්ෂේත්‍රය	2023 ප්‍රකාශන		2024 ප්‍රකාශන	
		ඉලක්කය	ප්‍රකාශිත	ඉලක්කය	ප්‍රකාශිත
1	සිවිල් ඉංජිනේරු		1		
2	නර්ඩ් පුවත් පත (NERDC newsletter)	**3**	4	4	2
3	වෙනත් (පර්යේෂණ පත්‍රිකා)		2	10	12

VI. නව නිපැයුම් හා නවෝත්පාදන ප්‍රවර්ධනය

ක්ෂේත්‍රය	2023 නව නිපැයුම් හා නවෝත්පාදන		2024 නව නිපැයුම් හා නවෝත්පාදන		
	ඉලක්ක	සඵලකර ගත් සංඛ්‍යාව	ඉලක්ක	සඵලකර ගත් සංඛ්‍යාව	කර්මාන්ත හා සබැඳි සංඛ්‍යාව
යාන්ත්‍රික ඉංජිනේරු		3	-	-	-
විදුලි හා විද්‍යුත් ඉංජිනේරු		7	-	-	-

VII. වෙනත් විශේෂ වැඩසටහන්

අනිකුත් විශේෂිත වැඩසටහන්

- නර්ඩ් ආයතනයේ 50 වන සංවත්සරය සැමරීමට සමගාමීව 2024 ජාත්‍යන්තර කර්මාන්ත ප්‍රදර්ශනය (IDB International EXPO) හා සම්බන්ධව පවත්වන ලද ප්‍රදර්ශනය 2024 ජුනි 19 සිට 23 දක්වා පැවැත්වීම.
- ඉංජිනේරු සහ කර්මාන්ත අංශයට අදාල පාර්ශ්වකරුවන් සමඟ සංසදයක් පැවැත්වීම.
- නර්ඩ් ආයතනය විසින් නිර්මාණය කරන ලද හා වැඩිදියුණු කරන ලද තාක්ෂණයන් පිළිබඳව ජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් BMICH හිදි පැවැත්වීම.
- පිරිපහදු කරන ලද රොන් මඩ භාවිතයෙන් Eco Blocks නිෂ්පාදනය සම්බන්ධයෙන් ජනතාව දැනුවත් කිරීමේ වැඩසටහනක් පැවැත්වීම.
- ජාත්‍යන්තර ඉංජිනේරු සමුළුව නෙළුම් කුළුනේ දී පැවැත්වීම.
    - 'Building the Future', NERDC's 50-year journey: A retrospective on the technological milestones යන පොත් පිංච එළි දැක්වීම
    - NERDC ජ්‍යෙෂ්ඨ සේවකයන් අගයනු වස් උත්සවයක් සංවිධානය
- ලෝක විද්‍යා දිනය හා සමගාමීව NERDC open-day වැඩසටහන පැවැත්වීම
- ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ ඉල්ලීම මත කර්මාන්තයට හා දේශීය පොම්ප නිෂ්පාදකයන් සඳහා ජල පොම්ප පරීක්ෂණ පහසුකමක් හඳුන්වා දීම

6.5. 2025 වර්ෂය සඳහා ඉලක්ක

- කර්මාන්ත සඳහා සපයනු ලබන සේවාවන්හි ප්‍රමාණය සහ ගුණාත්මකභාවය යන දෙකම වැඩි කිරීම.
- බලශක්ති සංරක්ෂණය සහ පරිසර දූෂණය අවම කිරීම තුළින් ආයතනවලට මූල්‍යමය වාසි ලබාදීම හා පරිසර හිතකාමී සංවර්ධනය සඳහා අවශ්‍ය මාර්ගෝපදේශ ලබා දීම.
- මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවට සහාය වීම සඳහා විද්‍යුත් වාහන පරීක්ෂණ රසායනාගාරයේ පහසුකම් වැඩිදියුණු කිරීම
- නිෂ්පාදනයේ ගුණාත්මකභාවය සහතික කිරීම සඳහා කර්මාන්තයට සහාය වීමට පොම්ප සහ මෝටර පරීක්ෂා කිරීම සඳහා නව පහසුකමක් ස්ථාපිත කිරීම
- කුඩා හා මධ්‍යම පරිමාණ කර්මාන්තකරුවන් ආර්ථික සංවර්ධනය සඳහා දක්වන සුවිශේෂී දායකත්වය හඳුනාගනිමින් ඔවුන් සමග තාක්ෂණික සහයෝගීතාවය ඇතිකර ගැනීම තුළින් උසස් තාක්ෂණය හා විශේෂඥ දැනුම ඔවුන්ට ලබාදී තරඟකාරී ගෝලීය වෙළඳපොල සඳහා බලගැන්වීම
- අභියෝගාත්මක ව්‍යාපෘතිවල නියැලීම සඳහා විශ්ව විද්‍යාල සමඟ ඒකාබද්ධතාවය ඇතිකරගැනීම හා දක්ෂ පර්යේෂකයින් පර්යේෂණ හා සංවර්ධන කටයුතු සඳහා දායක කර ගැනීම
- දේශීය අගය එකතු කරමින් සිදු කරන ආනයන අදේශ නිෂ්පාදන තුළින් දේශීය ව්‍යවසායකයින් ගොඩනැගීම.

7. ජාතික නවෝත්පාදන නියෝජ්‍යායතනය (NIA)

7.1. හැඳින්වීම

සමාජීය, විද්‍යා හා තාක්ෂණ, ආරක්ෂාව, පරිසර හා සේවා යන ක්ෂේත්‍රයන්හි නවෝත්පාදනයන් සහ රටෙහි ආර්ථිකය මත ඒවායේ බලපෑම පිළිබඳ මනා අවබෝධයක් ප්‍රවර්ධනය කිරීමේ නිශ්චිත අරමුණ සහිතව 2019 අංක 22 දරන පනත යටතේ ජාතික නවෝත්පාදන නියෝජ්‍යායතනය ස්ථාපනය කරන ලදී.

දැක්ම
නවෝත්පාදන හරහා වඩා හොඳ ශ්‍රී ලංකාවක්

මෙහෙවර
ශ්‍රී ලංකාවේ නවෝත්පාදන පරිසර පද්ධතිය දිරිගැන්වීම සහ සංවර්ධනය

7.2. ආයතනයෙහි කාර්යයන්

- නියෝජ්‍යායතනයේ අරමුණු හා සබැඳි වැදගත් අංග හා අදාළ රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ආයතන සමඟ සම්බන්ධතා පවත්වා ගැනීම;
- නිර්මාණශීලී ආර්ථිකයක් සඳහා සහාය වීමේ අරමුණින් ජාතික නවෝත්පාදන වැඩසටහන් ආරම්භ කිරීම සහ ඒ සඳහා අරමුදල් සපයනු පිණිස රජය වෙත නිර්දේශ ලබාදීම ;
- අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලත් ශ්‍රී ලංකා නවෝත්පාදන සහ ව්‍යවසායකත්ව ක්‍රමෝපාය සමඟ අනුකූලත්වය දක්වමින් ජාතික නවෝත්පාදන පරිසර පද්ධතියක් වැඩිදියුණු කිරීම සහ පවත්වා ගැනීම ;
- පර්යේෂණ සහ තාක්ෂණ පැවරුම් තුලින් මතු වූ උසස් තාක්ෂණ ව්‍යාපාර සඳහා පහසුකම් සලසා දීම හරහා ජාතික නවෝත්පාදන සහ ව්‍යවසායකත්ව ක්‍රමෝපාය යටතේ දක්වා ඇති අරමුණු සඳහා සහාය වීම ;
- නවෝත්පාදන හා ව්‍යවසායකත්වය පිළිබඳ ආයෝජන, ප්‍රතිපත්ති සහ ක්‍රමෝපායයන්හි ඵලදායීතාවය පිළිබඳ සුපරීක්ෂණය සහ ඇගයීම ;
- නවෝත්පාදන ක්‍රියාකාරකම්හි ප්‍රතිඵලයන් වාණිජකරණය දිරිගැන්වීම අරමුණු කර ගනිමින් ශ්‍රී ලංකාවේ අදාළ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ අනෙකුත් නවෝත්පාදන ආයතන සහ ජාත්‍යන්තර ආයතන සමඟ නවෝත්පාදන ක්ෂේත්‍රයේ ජාත්‍යන්තර ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය සහ සුසංගත කිරීම
- අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලත් ශ්‍රී ලංකා නවෝත්පාදන සහ ව්‍යවසායකත්ව ක්‍රමෝපාය සමඟ අනුකූලත්වය දක්වමින් ශක්තිමත් ආර්ථික තත්ත්වයක් සහතික කරනු පිණිස ගෝලීය නවෝත්පාදන දර්ශකයන්හි ඉහල මට්ටම් කරා ශ්‍රී ලංකාවේ ප්‍රගතිය ඉහල නැංවීමට ක්‍රියා කිරීම ;
- ජාත්‍යන්තර සම්බන්ධතා සහ පැවැත්ම පිළිබඳ අවධානය යොමු කරමින්, පරිසර පද්ධතිය ආවරණය කරමින් ශ්‍රී ලංකා වාර්ෂික නවෝත්පාදන සහ ව්‍යවසායකත්ව වාර්තා ලබාගැනීම, ඒකරාශී කිරීම, ඇගයීමට ලක් කිරීම සහ ප්‍රකාශයට පත්කිරීම;

7.3. 2024 වසරේදී ලබාගත් ජයග්‍රහණ

- ශ්‍රී ලංකාවේ ආරක්ෂක නවෝත්පාදන පරිසර පද්ධතිය ශක්තිමත් කිරීම සඳහා NIA සහ ආරක්ෂක අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක ආරක්ෂක පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය) CDRD) විසින් NIA ආරක්ෂක නවෝත්පාදන ස්ථම්භය සක්‍රීය කිරීම අරමුණු කරගත් සහයෝගීතාවයක් පිළිබඳ අවබෝධතා ගිවිසුමකට නිල වශයෙන් අත්සන් තැබිණි.
- සාම්ප්‍රදායික දැනුම සහ නවෝත්පාදන බද්ධ කිරීමේ අරමුණෙන් NIA සහ බණ්ඩාරනායක අනුස්මරණ ආයුර්වේද පර්යේෂණ ආයතනය (BMARI) එක්ව සාම්ප්‍රදායික ආයුර්වේද දැනුම අති නවීන විද්‍යාත්මක පර්යේෂණ සහ නවෝත්පාදන සමඟ ඒකාබද්ධ කිරීම අරමුණු කරගත් නවොත්පාදක සහයෝගීතාවයක් ආරම්භ කර ඇත.
- ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය (SLIDA) විසින් සංවිධානය කරන ලද රාජ්‍ය පරිපාලනයේ සහ පාලනයේ හොඳම භාවිතයන් සහ නවෝත්පාදන පිළිබඳ සම්මන්ත්‍රණයේදී NIA විසින් සිය මූලාරම්භයන් සහ සේවාවන් ප්‍රදර්ශනය කරන ලදී.

- පර්යේෂණ වාණිජකරණ මූලාරම්භයන් ඉදිරියට ගෙන යාම කෙරෙහි අවධානය යොමු කරමින් ජාතික නවෝත්පාදන නියෝජ්‍යායතනය විසින් Deutsche Bank AG, ශ්‍රී ලංකා ශාඛාවේ නියෝජිතයන් සමඟ ඵලදායී හමුවක් පවත්වන ලදී. මෙම උපායමාර්ගික සංවාදයෙහි අරමුණ වූයේ සහයෝගීතා අවස්ථා ගවේෂණය කිරීම සහ වෙළඳපොළ හා අදහස් අතර පරතරය පියවීම සඳහා නිර්මාණය කර ඇති NIA අතථ්‍ය වේදිකාව හා Business to People Sri Lanka (www.b2p.nia.gov.lk) හඳුන්වාදීමයි.නව නිපැයුම්කරුවන් සහ පර්යේෂකයන්ග සොයාගැනීම් වාණිජකරණයේදී ආයෝජකයින් ,සහ කර්මාන්ත හවුල්කරුවන් සමඟ සම්බන්ධ වීමට ශක්තිමත් රාමුවක් සපයා දෙමින් ඒ සඳහා ඔවුන්ට සහය වීම උදෙසා මෙම වේදිකාව නිර්මාණය කර ඇත.
- ආයතනික ව්‍යාපාර සම්බන්ධතා ඒකකයක් (IBLC) පිහිටුවීම සහ අංග සම්පූර්ණ ආයතනික බුද්ධිමය දේපළ සහ වාණිජකරණ ප්‍රතිපත්තියක් (IICP) කෙටුම්පත් කිරීම අරමුණු කර ගනිමින් ජාතික නවෝත්පාදන නියෝජ්‍යායතනය සහ මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ සහ පුහුණු ආයතනය (GJRTI) අතර හමුවක් පැවැත්විණි.
- ශ්‍රී ලංකාව සඳහා නවෝත්පාදන ආර්ථිකයක් වෙනුවෙන් සහාය පල කිරීම සඳහා සහයෝගීතාවයක් ස්ථාපනය කර ගැනීමේ අරමුණෙන් ජාතික අයවැය දෙපාර්තමේන්තුව විසින් ශ්‍රී ලංකාවේ ආර්ථිකයේ අනාගතය පිලිබඳ නව්‍ය ප්‍රවේශයක් සඳහා මුදල් අමාත්‍යාංශයේදී උත්සවයක් පවත්වන ලදී.
- IEEE Innovation Nation Sri Lanka (INSL) යනු IEEE Young Professionals Sri Lanka විසින් ස්වේච්ඡා මූලිකත්වයෙන් දියත් කරන ලද මූලාරම්භයක් වන අතර එය නැගී එන ව්‍යවසායකයින් සඳහා පුහුණු , මාර්ගෝපදේශ සහ මූල්‍යමය පහසුකම් සපයාදීම හා ලාංකේය තරුණ ප්‍රජාව අතර නවෝත්පාදන සහ ව්‍යවසායකත්වය දිරිමත් කිරීම අරමුණු කර ගනිමින් ක්‍රියාත්මක වේ. මේ යටතේ 2024 වසර සඳහා ජාතික හවුල්කරුවා ලෙස NIA හඳුනා ගනු ලැබ ඇත .මෙම වැඩසටහන දිස්ත්‍රික්ක 25ම ආවරණය වන පරිදි පවත්වන ලද අතර, තරුණ නව නිපැයුම්කරුවන් තෝරා, උපදෙස් හා මාර්ගෝපදේශ ලබාදීමෙන් අනතුරුව දිස්ත්‍රික් සහ පළාත් මට්ටමින් අවසන් වටය වෙත යොමු කරන ලදී. අවසන් තරගය Dialog Axiata ශ්‍රවණාගාරයේදී පැවැත්විණි.

- "නව නිපැයුම් වාණිජ්‍යය හමුවන "ආයතනික ව්‍යාපාර සම්බන්ධක ඒකක නිර්මාණය සඳහා NIA විසින් ආයතනික ව්‍යාපාර සම්බන්ධක ඒකක (IBLCs) නමින් පුරෝගාමී මූලාරම්භයක් දියත් කර ඇත. අමාත්‍යාංශ, ආයතන සහ පෞද්ගලික අංශය අතර සහයෝගීතාවය උත්ප්‍රේරණය කෙරෙන අයුරින් සැලසුම් කර ඇති මෙම ඒකක ,ව්‍යාපාර අදහස ආරම්භයේ සිට වෙළඳපල සාක්ෂාත් කර ගැනීම දක්වා ශක්තිමත් ජාතික නවෝත්පාදන පරිසර පද්ධතියක් ගොඩනැගීම අරමුණු කර ගෙන ඇත
- 2018 සිට 2023 දක්වා වානිජකරණය වූ නවෝත්පාදන 108ක් පිළිබඳ විස්තර ඇතුළත් වාර්තාවක් පිළියෙළ කරන ලදී.
- IP into Rupees දෙවන වෙළුම සහ වානිජකරණ මාර්ගෝපදේශය 2024 වර්ෂයේදී එළිදැක්වීම
- ශ්‍රී ලංකාව ගෝලීය නවෝත්පාදන දර්ශකයෙහි (GII) ඉහළ ස්ථානයකට ගෙන ඒමට කටයුතු කිරීම.
- දෙවන Dolphin Tech Pitch වැඩසටහන ප්‍රතිසර්ප විෂ නිපදවීම සම්බන්ධයෙන් පැවැත්වීම.
- ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව සඳහා ආයතනික කාර්යසාධනය අරමුණු කර ගනිමින් නවෝත්පාදන වැඩමුළුවක් ජනාධිපති ලේකම් කාර්යාලයේදී පැවැත්වීම.

7.4. 2025 වර්ෂය සඳහා ඉලක්ක

- ව්‍යාපාර ආරම්භයන් සඳහා ආයෝජකයන් සොයා ගනු පිණිස Dolphin Tech Pitch Events 4ක් පැවැත්වීම
- 2024 වර්ෂයේදී සොයාගත් සාර්ථක නවෝත්පාදන 50ක් ඇතුළුව වාර්ෂික නවෝත්පාදන වාර්තාව ප්‍රකාශයට පත් කිරීම
- NIA මෙහෙයුම් කවුන්සිලය හරහා රජයට උපදේශන යෝජනා 6ක් ඉදිරිපත් කිරීම.
- ජාතික තාක්ෂණ පැවරුම් ජාලය ශක්තිමත් කිරීම
- B2P, Solve Sri Lanka සහ විශ්ලේෂණ මෙවලම් ඇතුළු සුහුරු සම්බන්ධතා සඳහා ඩිජිටල් වේදිකා ක්‍රියාත්මක කිරීම
- නවෝත්පාදන වවුචර වැඩසටහන යටතේ නවෝත්පාදන මට්ටම් (innovation pillars) 05ක් සඳහා ව්‍යාපෘතිය බැගින් ක්‍රියාත්මක කිරීම

8. ජාතික මූලික අධ්‍යයන ආයතනය (NIFS)

8.1. හැඳින්වීම

ජාතික මූලික අධ්‍යයන ආයතනය මූලික හා උසස් අධ්‍යයනය සඳහා උනන්දුවක් ඇති කිරීම හා ඒ සඳහා පහසුකම් සැලසීමේ අරමුණින් 1981 අංක 55 දරණ පාර්ලිමේන්තු පනත මඟින් ස්ථාපනය කර ඇත. මූලික අධ්‍යයන ආයතනය, ජාතික සංවර්ධනය උදෙසා පුළුල් ලෙස දායක කර ගැනීමේ අරමුණින්, කරනු ලබන කාර්යභාරයන් තවත් පුළුල් කිරීමට අවකාශය සලසමින් 1997 අංක 05 දරණ පාර්ලිමේන්තු සංශෝධනය මගින් හා 2014 අංක 25 දරණ පාර්ලිමේන්තු සංශෝධනය මගින් උක්ත පනත සංශෝධනය කර ඇත. මෙම ආයතනයේ ජාතික අවශ්‍යතාවය සැලකිල්ලට ගනිමින් 2014 වර්ෂයේදී ඉහත සඳහන් පාර්ලිමේන්තු සංශෝධනය හරහා මූලික අධ්‍යයන ආයතනයේ නම, ජාතික මූලික අධ්‍යයන ආයතනය ලෙස සංශෝධනය කරන ලදී.

දැක්ම
ජාතික සහ ගෝලීය ප්‍රජාවට සේවය කරන මූලික අධ්‍යයනයන්හි පර්යේෂණ සඳහා ආදර්ශ ආයතනයක් වීම

මෙහෙවර
ජාතික සංවර්ධනය සහ සමාජ යහපැවැත්ම ඵලදායි හා කාර්යක්ෂම ලෙස ප්‍රවර්ධනය කරන අතරම විද්‍යාත්මක දැනුමේ දියුණුව සහ මානව ප්‍රාග්ධන සංවර්ධනය සඳහා දායක වීම

8.2. ආයතනයේ කාර්යයන්

- ගණිතය, භෞතික හා රසායන විද්‍යාව, ජීව විද්‍යාව, සමාජ විද්‍යාව සහ කායික විද්‍යාව කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් පොදුවේ මූලික අධ්‍යයනයන්හි පර්යේෂණ සහ මුල් විමර්ශන ආරම්භ කිරීම, ප්‍රවර්ධනය කිරීම සහ පැවැත්වීම සහ සිදු කරන ලද අධ්‍යයනවලට අදාල යෙදුම් සංවර්ධනය කිරීමට අවශ්‍ය විය හැකි පරිදි රාජ්‍ය හා පොද්ගලික ආයතන සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම.

- තම පර්යේෂණ කාර්යයන් ක්‍රියාත්මක කිරීමට සහ විද්‍යාත්මක දැනුම ව්‍යාප්තිය සඳහා දේශන, රැස්වීම්, සම්මන්ත්‍රණ හා සම්භාෂණ සූදානම් කිරීම.

- නිර්මාණාත්මක කාර්යයන්හී සක්‍රියව නියැලී සිටින ශ්‍රී ලාංකික හා විදේශීය විද්‍යාඥයන්ට දේශන පැවැත්වීමට සහ පර්යේෂණ ක්‍රියාකාරකම් සඳහා සහභාගී වීමට ආරාධනා කිරීම.

- ආයතනයෙහි ඉලක්ක, අරමුණු සහ ජාතික අවශ්‍යතාවයන් සඳහා විසඳුම් ලබා දීම වෙනුවෙන් විදේශීය විද්‍යාඥයින් සහ විද්‍යාත්මක ආයතන සමඟ සම්බන්ධීකරණය සිදු කිරීම සහ අදාළ කාර්යයන්හී දී අන්තර්ජාතික සහයෝගිතාව ප්‍රවර්ධනය කිරීම.

- 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනත මඟින් පිහිටුවන ලැබූ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසම විසින් පිළිගනු ලබන ආයතනයන්හි පශ්චාත් උපාධි පිරිනැමීමට සුදුසු වන පර්යේෂණ සඳහා පුහුණුව, මාර්ගෝපදේශ සහ සහාය සැපයීම.

- පවත්වනු ලබන අධ්‍යයන කටයුතු තවදුරටත් වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය පරිදි රාජ්‍ය සහ පෞද්ගලික ආයතන සමග සහයෝගයෙන් කටයුතු කිරීම.

- ආයතනයෙහි ඉලක්ක සහ අරමුණු ප්‍රවර්ධනය කිරීමට අවශ්‍ය යැයි සැලකෙන අනෙකුත් කාර්යයන් සහ ක්‍රියාකාරකම් සිදුකිරීම

8.3. 2024 වර්ෂයේ ජයග්‍රහණයන්

I. පර්යේෂණ යොමුව - පර්යේෂණ හා සංවර්ධන

අනු අංකය	පර්යේෂණ ක්ෂේත්‍රය	2023 පර්යේෂණ සංඛ්‍යාව			2024 පර්යේෂණ සංඛ්‍යාව		
		ඉලක්කය	නිම කළ	ක්‍රියාත්මක වෙමින් පවතින	ඉලක්කය	නිම කළ	ක්‍රියාත්මක වෙමින් පවතින
01	ඝණ ද්‍රව්‍ය භෞතික විද්‍යා සහ ඝණ ද්‍රව්‍ය රසායන විද්‍යාව පිළිබඳ පර්යේෂණ ව්‍යාපෘතිය	02	-	02	02	01	01
02	බලශක්ති සහ උසස් ද්‍රව්‍ය රසායන විද්‍යා පර්යේෂණ ව්‍යාපෘතිය	04	-	04	04	-	04
03	පාරිසරික විද්‍යා පර්යේෂණ ව්‍යාපෘතිය: ජල තත්ත්ව පර්යේෂණ	04	-	04	04	-	04
04	ආහාර රසායන විද්‍යා පර්යේෂණ ව්‍යාපෘතිය	04	01	03	04	-	04
05	ද්‍රව්‍ය සැකසුම්කරණය සහ උපාංග පිරිසැකසුම්කරණ පිළිබඳ සැකසීම සහ උපාංග නිෂ්පාදන පර්යේෂණ ව්‍යාපෘතිය	04	-	04	04	01	03
06	ක්ෂුද්‍රජීවී ජෛව තාක්‍ෂණ පර්යේෂණ ව්‍යාපෘතිය	03	-	03	03	-	02
07	ක්ෂුද්‍රජීව විද්‍යාව සහ පාංශු පරිසර පද්ධති පර්යේෂණ ව්‍යාපෘතිය	03	01	02	05	-	05
08	අණුක ක්ෂුද්‍ර ජීව විද්‍යාව සහ මානව රෝග පර්යේෂණ ව්‍යාපෘතිය	07	01	06	09	04	04
09	ස්වභාවික නිෂ්පාදන පර්යේෂණ ව්‍යාපෘතිය	04	02	02	03	-	03
10	නැනෝ තාක්‍ෂණය සහ උසස් ද්‍රව්‍ය පිළිබඳ භෞතික විද්‍යාව පර්යේෂණ ව්‍යාපෘතිය	02	-	02	02	-	02
11	පරිණාමය, පරිසර විද්‍යාව සහ ජෛව විවිධත්ව පර්යේෂණ ව්‍යාපෘතිය	04	-	04	04	-	04
12	ශාක වර්ගීකරණය සහ සංරක්ෂණ පර්යේෂණ	03	-	03	03	-	03
13	ඍජීවී සම්පත් සහ පුනර්ජනනීය බලශක්ති පර්යේෂණ ව්‍යාපෘතිය	02	-	02	02	01	02
14	පෝෂණ ජෛව රසායන පර්යේෂණ ව්‍යාපෘතිය	03	01	02	04	01	03
15	පාරිසරික විද්‍යා පර්යේෂණ ව්‍යාපෘතිය: ද්‍රව්‍ය සංවර්ධනය සහ දූෂක ප්‍රතිකර්ම	03	01	02	03	01	02
16	පරිගණක විද්‍යාව, සංඛ්‍යාලේඛන සහ ගණිතය	02	-	02	02	-	02

II. ගොනු කරන ලද/ ලබා ගත් පේටන්ට් බලපත්‍ර

පාරිසරික විද්‍යා පර්යේෂණ ව්‍යාපෘතිය: ජල තත්ත්ව පර්යේෂණය සඳහා 2023 වර්ෂයේදී පේටන්ට් බලපත්‍ර 03ක් ඉලක්ක කළ අතර ද්‍රව් සැකසුම්කරණය සහ උපාංග පිරිසැකසුම්කරණ පිළිබඳ සැකසීම සහ උපාංග නිෂ්පාදන පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ 2024 වර්ෂයේදී පේටන්ට් 02 ක් ඉලක්ක කරන ලදී.

III. විද්‍යාව ප්‍රචලිත කිරීමේ වැඩසටහන්

ප්‍රචලිත කිරීමේ ක්‍රමවේදය	2023 සංඛ්‍යාව			2024 සංඛ්‍යාව		
	ඉලක්කගත	නිම කළ	ප්‍රතිලාභීන්	ඉලක්කගත	නිම කළ	ප්‍රතිලාභීන්
අන්තර් ජාතික සමුළු/ සම්මන්ත්‍රණ	02	01	189	02	02	370
දේශන	12	04	358	08	10	486
වැඩමුළු	05	-	-	05	04	392
විද්‍යාත්මක වීඩියෝ	-	-	-	04	09	13,436
පාසැල් පුහුණු වැඩසටහන්	02	-	-	05	05	472
රසායනාගාර නැරඹුම්	ඉල්ලුම අනුව	-	-	ඉල්ලුම අනුව	05	196
විද්‍යාත්මක ප්‍රදර්ශන	01	01	-	01	-	-
විද්‍යාත්මක තරගාවලිය	-	-	-	01	-	-
ඉ - වැඩසටහන්	03	03	106,675	03	සිදුවෙමින් පවතී	181,814

IV. විද්‍යාත්මක ප්‍රකාශන

අනු අංකය	පර්යේෂණ ව්‍යාපෘතිය	2023				2024			
		පර්යේෂණ පත්‍රිකා		වෙනත්		පර්යේෂණ පත්‍රිකා		වෙනත්	
		ඉලක්කය	ප්‍රකාශිත	ඉලක්කය	ප්‍රකාශිත	ඉලක්කය	ප්‍රකාශිත	ඉලක්කය	ප්‍රකාශිත
01	ඝණ ද්‍රව්‍ය භෞතික විද්‍යා සහ ඝණ ද්‍රව්‍ය රසායන විද්‍යාව පිළිබඳ පර්යේෂණ ව්‍යාපෘතිය	03	09	04	02	04	07	04	09
02	ජෛවීය සම්පත් සහ පුනර්ජනනීය බලශක්ති පර්යේෂණ ව්‍යාපෘතිය	05	01	05	02	03	-	05	03
03	බලශක්ති සහ උසස් ද්‍රව්‍ය රසායන විද්‍යා පර්යේෂණ ව්‍යාපෘතිය	04	04	03	01	04	-	03	03
04	පාරිසරික විද්‍යා පර්යේෂණ ව්‍යාපෘතිය ජල තත්ත්ව පර්යේෂණ	02	13	06	03	03	04	05	15
05	පරිණාමය, පරිසර විද්‍යාව සහ ජෛව විවිධත්ව පර්යේෂණ ව්‍යාපෘතිය	10	02	01	-	12	02	03	03

06	ආහාර රසායන විද්‍යා පර්යේෂණ ව්‍යාපෘතිය	05	04	04	08	04	06	03	15
07	ද්‍රව්‍ය සැකසුම්කරණය සහ උපාංග පිරිසැකසුම්කරණ පිළිබඳ සැකසීම සහ උපාංග නිෂ්පාදන පර්යේෂණ ව්‍යාපෘතිය	03	04	06	04	04	03	05	09
08	ක්ෂුද්‍රජීවී ජෛව තාක්ෂණ පර්යේෂණ ව්‍යාපෘතිය	02	09	05	07	04	05	08	17
09	ක්ෂුද්‍රජීව විද්‍යාව සහ පාංශු පරිසර පද්ධති පර්යේෂණ ව්‍යාපෘතිය	03	04	04	07	03	01	03	06
10	අණුක ක්ෂුද්‍ර ජීව විද්‍යාව සහ මානව රෝග පර්යේෂණ ව්‍යාපෘතිය	06	12	07	16	04	01	08	06
11	නැනෝ තාක්ෂණය සහ උසස් ද්‍රව්‍ය පිළිබඳ භෞතික විද්‍යාව පර්යේෂණ ව්‍යාපෘතිය	03	-	06	10	04	-	12	04
12	ස්වභාවික නිෂ්පාදන පර්යේෂණ ව්‍යාපෘතිය	06	08	12	13	08	05	16	21
13	පෝෂණ ජෛව රසායන පර්යේෂණ ව්‍යාපෘතිය	02	06	05	03	03	01	04	04
14	ශාක වර්ගීකරණය සහ සංරක්ෂණ පර්යේෂණ	04	08	02	05	04	05	02	05
15	ද්‍රව්‍ය සංවර්ධනය සහ දූෂක ප්‍රතිකර්ම පර්යේෂණ ව්‍යාපෘතිය	02	01	04	06	04	01	08	04
16	පරිගණක විද්‍යාව, සංඛ්‍යාලේඛන සහ ගණිතය	-	01	-	-	02	-	04	01

V. නව නිෂ්පාදන හා නවෝත්පාදන ප්‍රවර්ධනය

- පාරිසරික විද්‍යා පර්යේෂණ ව්‍යාපෘතිය: ජලයේ ගුණාත්මක බව පරීක්ෂා කරන පර්යේෂණ ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණු 02 ක් වන අතර 2024 වර්ෂයේදී ඒවා සඵල කර ගෙන ඇති අතර කර්මාන්ත සඳහාද සම්බන්ධ වී ඇත.
- නැවත ආරෝපිත බැටරි යෙදවුම සංවර්ධනය සඳහා ශ්‍රී ලංකා Vein Graphite පිරිපහදු කිරීම.

- Dye-Sensitized Solar Cells සඳහා අඩු වියදම් Activated Carbon-Coated Stainless-Steel Counter Electrode සංවර්ධනය කිරීම

8.4. 2025 වර්ෂය සඳහා ඉලක්ක

- නැවත ආරෝපණය කල හැකි බැටරි නිෂ්පාදනය සහ අඟුරු භාවිතයෙන් සුපිරි සන්නායක නිෂ්පාදනය යන ව්‍යාපෘතීන් වල ප්‍රතිඵල වාණිජකරණය කිරීමට කටයුතු කිරීම.

- භූ තාප ශක්තිය, ජෛව ඩීසල් නිෂ්පාදනය සහ ද්‍රව්‍ය සැකසුම් ව්‍යාපෘතිය පිළිබඳ විමර්ශන, ව්‍යාපෘති අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා කාර්මික හවුල්කරුවන් සමඟ සහයෝගයෙන් කටයුතු කිරීමට සැලසුම් කර ඇත.

- රටට පරිසර හිතකාමී පොහොර ප්‍රතිපත්තියක් සකස් කිරීම සඳහා සහාය වීම සහ ජෛව පටල ජෛව පොහොර මත පදනම් වූ කාබනික පොහොර භාවිතයන් පරීක්ෂා කිරීම සඳහා පර්යේෂණ කටයුතු සිදු කිරීම

9. ජාතික පර්යේෂණ සභාව (NRC)

9.1. හැඳින්වීම

ජාතික පර්යේෂණ සභාව (NRC) යනු පර්යේෂණ සඳහා අරමුදල් සපයන ආයතනයකි. එය විශ්වවිද්‍යාල සහ රජයේ පර්යේෂණ හා සංවර්ධන (R & D) ආයතනවලට අනුබද්ධ රාජ්‍ය අංශයේ විද්‍යාඥයින්ට මූලා ආධාර සපයයි. එය 1999 දී ආරම්භ කරන ලද අතර ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ 2016 අංක 11 දරන පනත මගින් ව්‍යවස්ථාපිත මණ්ඩලයක් ලෙස ස්ථාපිත කර ඇත. එහි ප්‍රධාන කාර්යය වන්නේ රට තුළ උද්දීප්ත විද්‍යාත්මක හා තාක්‍ෂණික ප්‍රජාවක් ගොඩනැගීම සඳහා විද්‍යාව හා තාක්‍ෂණය පිළිබඳ පර්යේෂණ සැලසුම් කිරීම, සම්බන්ධීකරණය කිරීම සහ පහසුකම් සැලසීම උදෙසා රජයට සහාය වීමයි.

දැක්ම

විද්‍යාව සහ දැනුම පදනම් කරගත් සංවර්ධිත රටක තත්ත්වය ලබා ගැනීමට ශ්‍රී ලංකාවට හැකියාව ලබා දීම.

මෙහෙවර

විද්‍යාව සහ දැනුම පදනම් කරගත් සංවර්ධිත රටක තත්ත්වය ළඟා කර ගැනීම සඳහා ශ්‍රී ලංකාවේ මූලික සහ ව්‍යවහාරික පර්යේෂණ ප්‍රවර්ධනය කිරීම, අරමුදල් සැපයීම, පහසුකම් සැලසීම, අධීක්ෂණය කිරීම සහ මානව සම්පත සංවර්ධනය කිරීම.

අරමුණු

1. රට තුළ උද්දීප්ත විද්‍යා හා තාක්‍ෂණික ප්‍රජාවක් ගොඩනැගීම සඳහා විද්‍යාවට සහ තාක්‍ෂණයට අදාළ පර්යේෂණ පහසුකිරීම සඳහා ආණ්ඩුවට සහාය වීම.

2. ජාතික අවශ්‍යතාවලට දායක වන පර්යේෂණ පදනමක් සංවර්ධනය කිරීමට හැකිවන පරිදි උසස් අධ්‍යාපන ආයතනවල, රාජ්‍ය අංශයේ පර්යේෂණ ආයතනවල සහ වෙනත් රාජ්‍ය ආයතනවල විද්‍යාව සහ තාක්ෂණයට අදාළ පර්යේෂණ ප්‍රවර්ධනය කිරීම සහ ඊට පහසුකම් සැලසීම.

3. විද්‍යාව සහ තාක්ෂණයට අදාළ පර්යේෂණ වැඩිදියුණු කිරීම සඳහා පෞද්ගලික අංශයේ සහයෝග ඉල්ලා සිටීම.

9.2. ආයතනයේ කාර්යයන්

- විද්‍යාව හා තාක්‍ෂණයට අදාළ පර්යේෂණ පැවැත්වීම සඳහා ප්‍රදාන ලබා දීම.
- පර්යේෂණ සඳහා වූ රජයේ ආයෝජන කාර්යක්ෂම ලෙස උපයෝගී කිරීම සහතික කිරීම පිණිස උසස් අධ්‍යාපන ආයතන, රාජ්‍ය අංශයේ පර්යේෂණ ආයතන සහ වෙනත් රාජ්‍ය ආයතන වලට සපයනු ලබන ප්‍රදාන සම්බන්ධයෙන් විද්‍යාව හා තාක්‍ෂණයට අදාළ පර්යේෂණ පහසුකරලීම, සම්බන්ධීකරණය, අධීක්ෂණය සහ නියාමනය කිරීම.
- සභාවේ කාර්යය සඳහා අවශ්‍ය පිරියත, යන්ත්‍රෝපකරණ සහ උපකරණ ආනයනය කිරීම සහ සභාවේ කාර්ය කාර්යක්‍ෂම ලෙස පවත්වාගෙන යාම සඳහා පිළිගත් දේශීය හෝ විදේශීය මූලාශ්‍රවලින් උපකරණ, අරමුදල් සහ වෙනත් සහාය ලබා ගැනීම.
- විද්‍යාව සහ තාක්‍ෂණය සහ ඒ ආශ්‍රිත අදාළ විෂයයන්ට අදාළ පර්යේෂණ පිළිබඳ වාර්තා, වාර සඟරා සහ පත්‍රිකා එකතු කිරීම, මුද්‍රණය කිරීම සහ ප්‍රකාශයට පත් කිරීම.
- දේශීය හෝ විදේශීය විද්‍යා හා තාක්ෂණ ආයතනවලදී විද්‍යාත්මක අධ්‍යයනය හෝ විද්‍යාත්මක කටයුතු සඳහා ශිෂ්‍යත්ව සහ එම ක්ෂේත්‍රය පිලිබඳ අත්දැකීම් ලැබීමට දෙනු ලබන ශිෂ්‍යත්ව පිරිනැමීම.
- විද්‍යාව හා තාක්‍ෂණයට අදාළ පර්යේෂණ සහ නව නිපැයුම් පිළිගැනීම සඳහා සහ සම්මාන ප්‍රදානය කිරීම සඳහා ජාතික ක්‍රමවේදයක් සකස් කිරීම.
- විද්‍යාව සහ තාක්‍ෂණය සහ ආශ්‍රිත විෂයයන්ට අදාළ පර්යේෂණ පිළිබඳ දේශන, සම්මන්ත්‍රණ සහ වැඩමුළු පැවැත්වීම.

9.3. 2024 වර්ෂයේ ජයග්‍රහණයන්

- භෞතික හා මූල්‍ය ඉලක්ක වඩා සාර්ථක ලෙස සාක්ෂාත් කර ගැනීම සඳහා ආයතනයේ පර්යේෂණ ප්‍රදාන මාර්ගෝපදේශ යාවත්කාලීන කරන ලදී.
- කර්මාන්ත පර්යේෂණ අවශ්‍යතා ලබා ගැනීම සඳහා පුද්ගලික අංශයෙන් උනන්දුව ප්‍රකාශ කිරීමේ පත්‍රිකා (EOI) කැඳවනු ලැබීය. ලැබුණු EOI 15 ක් ඇගයීමට ලක් කරන ලද අතර ඉන් 05ක් පර්යේෂණ යෝජනා කැඳවීම සඳහා තෝරා ගන්නා ලදී. ඉන් පසු ලැබුණු සම්පූර්ණ පර්යේෂණ යෝජනා 04න් මේ වන විට එක් යෝජනාවක ඇගයීම සම්පූර්ණ කර ඇත.
- රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්ව වැඩසටහනේ නවීකරණයෙන් පසුව ප්‍රදානය කල ප්‍රදාන පහක (05) ප්‍රථම සමාසික අධීක්ෂණය අවසන් කර ඇත.

- පර්යේෂණ ව්‍යාපෘතිවල භෞතික හා මූල්‍ය ඉලක්කවල සුමට ප්‍රගතියක් සහතික කිරීම සඳහා NRC පර්යේෂණ මාර්ගෝපදේශ යාවත්කාලීන කර ඇත
- රටේ ආර්ථිකයට ප්‍රතිලාභ සැලසෙන පර්යේෂණ නිමැවුම් ලබා දීම සඳහා IDG අරමුදල් යාන්ත්‍රණය නැවත සමාලෝචනය කර වෙනස් කරන ලදී.
- ඉලක්කගත බහුවිධ (TO) ව්‍යාපෘති 03ක් සඳහා ප්‍රගති සමාලෝචන රැස්වීම පවත්වන ලද අතර නව ව්‍යාපෘති දෙකක් පර්යේෂණ ප්‍රදාන සඳහා සුදුසුකම් ලැබ ඇත. මේ වන විට ඉන් එක් යෝජනාවක් සඳහා මූල්‍ය ප්‍රදාන ලබා දී ඇත.
- අරමුදල් සහිත පර්යේෂණ ව්‍යාපෘතිවල බලපෑම් තක්සේරු කිරීම් 04ක් සම්පූර්ණ කර ඇත.

ප්‍රදාන අධීක්ෂණය සහ ඇගයීම:

- IDG ව්‍යාපෘතිවල වාර්ෂික ප්‍රගති වාර්තා 26ක් එකතු කර ඇගයීමට ලක් කරන ලදී.
- TO ව්‍යාපෘතිවල වාර්ෂික ප්‍රගති වාර්තා 3ක් එකතු කර ඇගයීමට ලක් කරන ලදී.
- IDG ව්‍යාපෘතිවල අවසාන වාර්තා 32ක් ඇගයීමට ලක් කරන ලදී.
- ක්‍රියාත්මක තත්වයේ පවතින රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්ව ව්‍යාපෘති 05 ක ස්ථානීය අධීක්ෂණ චාරිකා අවසන් කර ඇත.
- වසරේ පළමු සහ දෙවන කාර්තුව සඳහා NRC පුවත් පත්‍රිකා සම්පූර්ණ කර සාමාන්‍ය ජනතාව වෙත නිකුත් කරණ ලදී.
- විද්‍යාත්මක පර්යේෂණ සඳහා ජනාධිපති සම්මාන වැඩසටහනේ වර්ෂ 2021 ට අදාල SCOPUS දත්ත ගබඩාව ELSEVIER ආයතනයෙන් නොමිලේ ලබාගත් අතර, සම්මානලාභීන්ගේ පාර්ශවයෙන් තොරතුරු සත්‍යාපනය කර ගැනීම (Verification) අවසන් කර ඇත.
- පහත සඳහන් ව්‍යාපෘති ඉලක්ක කරන ලද නිමවුම් සහිතව අවසන් කරන ලදී.
  - TO 18-21 (Autothermal pyrolizer plant to convert compost residues into biochar)
  - IDG 18-012 (Low-cost controlling method for Rough Bark Disease in Cinnamon)
  - PPP 20-01 (A genetic test to identify Maturity Onset Diabetes of the Young).

9.4. කාර්යසාධනය

I. පර්යේෂණ යොමුව - පර්යේෂණ හා සංවර්ධන

අනු අංක	පර්යේෂණ ක්ෂේත්‍රය	2023 පර්යේෂණ සංඛ්‍යාව		2024 පර්යේෂණ සංඛ්‍යාව	
		ඉලක්කය	නිම කළ	ඉලක්කය	නිම කළ
1	අන්වේෂක මත පදනම් වූ ප්‍රදාන	10	4	10	10
2	රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්ව ප්‍රදාන	02	6	02	01
3	ඉලක්කගත බහුවිෂයයික ප්‍රදාන	01	-	01	01
4	සම්පූර්ණ කරන ලද ප්‍රදානවල බලපෑම තක්සේරු කිරීම	04	3	4	04

II. R&D තාක්ෂණය මාරු කරන ලද වාණිජකරණ වැඩසටහන්

අනු අංකය	පවරා දෙනු ලැබූ/ වාණිජකරණය කළ තාක්ෂණ ක්ෂේත්‍රය හෝ ආකාරය	2023		2024	
		සංඛ්‍යාව	කර්මාන්ත අංශයේ හවුල්කරු	සංඛ්‍යාව	කර්මාන්ත අංශයේ හවුල්කරු
	වෛද්‍ය විද්‍යාත්මක	1	හෙට්ටිගොඩ සමූහ ව්‍යාපාරය	2	පුද්ගලික අංශය
	ඉංජිනේරු විද්‍යාත්මක	3	i. දයිකි ඇක්සිස් (පුද්) සමාගම ii. සිනජී බයෝ (පුද්) සමාගම iii. ජරෝසමිනෝ ජාත්‍යන්තර සමාගම	2	පුද්ගලික අංශය
	පරිසර විද්‍යාත්මක	1	ලලාන් රබර් (පුද්) සමාගම	11	පුද්ගලික අංශය

III. ගොනු කරන ලද/ ලබා ගත් පේටන්ට් බලපත්‍ර

ක්ෂේත්‍රය	පේටන්ට්	2023 වර්ෂය		2024 වර්ෂය	
		ඉලක්කය	ප්‍රගතිය	ඉලක්කය	ප්‍රගතිය
ජලය පිලිබඳ පර්යේෂණ	ගොනු කරනු ලැබූ	4	4	4	2
	පේටන්ට් ලබාගැනීම	2	1	2	0

IV. විද්‍යාව ජනප්‍රිය කිරීමේ වැඩසටහන

ප්‍රචලිත කිරීමේ ක්‍රමවේදය	2023 වැඩසටහන්			2024 වැඩසටහන්		
	ඉලක්කගත	නිම කළ	ප්‍රතිලාභීන්	ඉලක්කගත	නිම කළ	ප්‍රතිලාභීන්
1. මාර්ගගත වැඩමුළු හා සම්මන්ත්‍රණ පැවැත්වීම	04	04	300	(04)	04	420
2. NRC වෙබ් අඩවිය යාවත්කාලීන කිරීම	04	04	ගණනය කර නොමැත	(04)	02	ගණනය කර නොමැත
3. NRC YouTube නාලිකාවට උඩුගත කිරීම්	04	-	-	4		-

4. NRC කාර්තුමය පුවත් පත්‍රිකාව	(04)	(04)	ගණනය කර නොමැත	(04)	(03)	ගණනය කර නොමැත
5. මූල්‍ය ආධාර සපයන වෙනත් සිදුවීම් / වැඩසටහන්	අවස්ථානුකූලව	(04) ප්‍රදර්ශන දෙකකට සහභාගී විය	ප්‍රදර්ශන කුටි සඳහා 1500 කට ආසන්න පිරිසක් සහභාගී විය.	අවස්ථානුකූලව	-	-
			ගණනය කර නොමැත			
		විද්‍යා -ඊ නිවුස් සඳහා පත්‍රිකා 04 ක් ලබා දීම.	ගණනය කර නොමැත			

V. විද්‍යාත්මක ප්‍රකාශන

ප්‍රකාශන	2023 ප්‍රකාශන සංඛ්‍යාව			2024 ප්‍රකාශන සංඛ්‍යාව		
	පර්යේෂණ ව්‍යාපෘති ගණන	පර්යේෂණ ප්‍රකාශන	පුවත්පත් ලිපි/පොත් පරිච්ඡේද	පර්යේෂණ ව්‍යාපෘති ගණන	පර්යේෂණ ප්‍රකාශන	පුවත්පත් ලිපි/පොත් පරිච්ඡේද
වෛද්‍ය විද්‍යාව / ආහාර සහ පෝෂණය	9	28	-	4	23	1
කෘෂිකර්මය / වැවිලි / පශු සම්පත් සහ ධීවර කටයුතු	4	6	4	9	34	5
ඉංජිනේරු තාක්ෂණය / තොරතුරු තාක්ෂණය / භෞතික විද්‍යාව සහ ඉලෙක්ට්‍රොනික විද්‍යාව	13	63	4	2	12	-
පරිසර විද්‍යාව සහ පරිසරය / භූ විද්‍යාව / රසායන විද්‍යාව / වෙනත් / ජීව විද්‍යාව / අණුක ජීව විද්‍යාව	13	61	2	11	53	4

VI. නව නිපැයුම් සහ නවෝත්පාදන

ක්ෂේත්‍රය	2023 නව නිපැයුම් හා නවෝත්පාදන			2024 නව නිපැයුම් හා නවෝත්පාදන		
	ඉලක්කය	සඵල කර ගත් සංඛ්‍යාව	කර්මාන්ත හා සබැඳි සංඛ්‍යාව	ඉලක්කය	සඵල කර ගත් සංඛ්‍යාව	කර්මාන්ත හා සබැඳි සංඛ්‍යාව
රසායන විද්‍යාව / වෙනත් / ජීව විද්‍යාව / අණුක ජීව විද්‍යාව	-	2 (IDG16-138, TO16-18)	1	-	1 (PPP23-22)	1
වෛද්‍ය විද්‍යාව / ආහාර සහ පෝෂණය	-		-	-	1 (IDG18-80)	
කෘෂිකර්මය / වැවිලි / පශු සම්පත් සහ ධීවර කටයුතු	-	1 (TO16-07)	-	-	1 (PPP19-04)	1
ඉංජිනේරු තාක්ෂණය / තොරතුරු තාක්ෂණය / භෞතික විද්‍යාව සහ ඉලෙක්ට්‍රොනික විද්‍යාව	-	1 (IDG17-19)	-	-		
පරිසර විද්‍යාව සහ පරිසරය / භූ විද්‍යාව	-		-	-	1 (TO18-21)	1

9.5. 2025 වර්ෂය සඳහා ඉලක්ක

- පර්යේෂණවල ඵලදායිතාව වැඩි කිරීම:

  ප්‍රදාන සඳහා පවතින නෛතික ගිවිසුම් (Grant Legal Agreements) ශක්තිමත් කිරීම හරහා රාජ්‍ය මූල්‍ය උපයෝජනය ප්‍රශස්ත තත්වයකට ගෙන ඒම, ඒ පිලිබඳ පර්යේෂකයාගේ ආයතනය සතු වගකීම නෛතිකව තහවුරු කිරීම සහ ක්‍රියාත්මක වන සියලුම පර්යේෂණ ප්‍රදාන ඒවායේ අපේක්ෂිත ප්‍රතිදාන (outputs) ලබා දෙමින් අවසන් වීම සඳහා අවශ්‍ය උපාය මාර්ග ක්‍රියාත්මක කිරීම.

- විද්‍යාත්මක ප්‍රකාශන ඉලක්ක කරගත් පර්යේෂණ ප්‍රදාන සංස්කෘතිය විද්‍යාත්මක නවෝත්පාදන ඉලක්ක කරගත් සංස්කෘතියක් බවට පරිවර්තනය කිරීම.
- ජාතික පර්යේෂණ සභාවේ රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්ව වැඩසටහන විවිධාංගිකරණය තුලින් වඩවඩාත් ප්‍රචලිත කිරීම.
- පුහුණු වැඩසටහන් පැවැත්වීම හා යූටියුබ් නාලිකාව හරහා ආදායම් උත්පාදන සැලසුම් ක්‍රියාත්මක කිරීම.
- විකල්ප අරමුදල් මූලාශ්‍ර තුලින් පර්යේෂණ ප්‍රදාන ලබාදීමේ හැකියාව අධ්‍යනය කර ඒ සඳහා ක්‍රියාත්මක වීම.

10. ජාතික විද්‍යා පදනම (NSF)

10.1. හැඳින්වීම

ජාතික විද්‍යා පදනම (NSF) යනු 1994 අංක 11 දරන විද්‍යා හා තාක්ෂණ සංවර්ධන පනත මගින් 1998 දී පිහිටුවන ලද ව්‍යවස්ථාපිත ආයතනයකි. එය 1981 දී පිහිටුවන ලද ශ්‍රී ලංකා ස්වභාවික සම්පත්, බලශක්ති සහ විද්‍යා අධිකාරියේ අනුප්‍රාප්තිකයා (NARESA) ලෙස ස්ථාපිත විය. 1968 දී ස්ථාපිත කරනලද ජාතික විද්‍යා සභාවේ (NSC) අනුප්‍රාප්තිකයා ලෙස NARESA බිහිවිය. විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශයේ විෂය පථය යටතේ ක්‍රියාත්මක වන රට තුළ විද්‍යාව, තාක්‍ෂණය සහ නවෝත්පාදන ප්‍රවර්ධනය කිරීමේ ප්‍රමුඛ කාර්යභාරය NSF විසින් ඉටුකරයි. එය අංක 47/5, විද්‍යා මාවත, කොළඹ 7 හි පිහිටා ඇත.

දැක්ම

ශ්‍රී ලංකාවේ ආර්ථික හා සමාජීය සමෘද්ධිය සඳහා විද්‍යාව, තාක්ෂණය සහ නවෝත්පාදන ප්‍රවර්ධනය කිරීමේ ජාතියේ ප්‍රමුඛතම ගාමක බලවේගය බවට පත්වීම.

මෙහෙවර

පහත දෑ ඉටු කිරීම මගින් ශ්‍රී ලංකාවේ පුරවැසියන්ගේ යහපැවැත්ම සහතික කිරීම සඳහා විද්‍යාව, තාක්ෂණය සහ නවෝත්පාදන පරිසර පද්ධතියේ ප්‍රගතිශීලී දියුණුව ප්‍රවර්ධනය කිරීම

- සමාජ විද්‍යාව ඇතුළු සියලුම විද්‍යා ක්ෂේත්‍රයන්හි පර්යේෂණ, සංවර්ධන සහ නවෝත්පාදන සහ ධාරිතා ගොඩනැගීම,
- තොරතුරු බෙදා හැරීම සහ දැනුම බලමුලු ගැන්වීම,
- ගෝලීය වටිනාකම් දාමය සමඟ හොඳින් සම්බන්ධ වූ ජාත්‍යන්තර සහයෝගීතාවය සහ හවුල්කාරිත්වය,
- විද්‍යාව ප්‍රචලිත කිරීම සහ විද්‍යා අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීම,
- විද්‍යාව, තාක්ෂණය සහ අනෙකුත් ක්ෂේත්‍ර පිළිබඳ ප්‍රතිපත්ති සම්පාදනය සඳහා ප්‍රතිපත්ති පර්යේෂණ සහ සාක්ෂි පදනම් කරගත් තොරතුරු සැපයීම

පාර්ශවකරුවන්ගේ අපේක්ෂාවන් සපුරාලන අතරම, දක්ෂ කාර්ය මණ්ඩලයක් පෝෂණය කිරීම, තිරසාරත්වයේ මූලික වටිනාකම් සහ මූලධර්ම සහතික කිරීම.

10.2. ආයතනයේ කාර්යයන්

- ජාතික නවෝත්පාදන පරිසර පද්ධතියේ ප්‍රගතිශීලී ප්‍රගමනය සඳහා මූලා ප්‍රදාන යෝජනා ක්‍රම හරහා පර්යේෂණ, සංවර්ධනය සහ නවෝත්පාදන පෝෂණය කිරීම එමඟින් පර්යේෂණ සහ සංවර්ධන නිමැවුම්, නව දැනුම නිර්මාණය සහ බලමුලු ගැන්වීම, වැඩිදියුණු කිරීමට දායකවීම, පර්යේෂණ සහ සංවර්ධන වාණිජකරණය සහ තාක්ෂණික හුවමාරුව සමාජ-ආර්ථික සංවර්ධනයට දායකවීම.
- විද්‍යා හා තාක්ෂණ හා නවෝත්පාදන ක්ෂේත්‍රයේ නියැලෙන්නන්ගේ ප්‍රයෝජනය සඳහා විද්‍යුත් දත්ත ගබඩාවන්, මාර්ගගත වේදිකා, ජාතික විද්‍යා පදනමේ (JNSF) සඟරාව සහ ශ්‍රී ලංකා සමාජ විද්‍යා සඟරාව හරහා විද්‍යා, තාක්ෂණ හා නවෝත්පාදන තොරතුරු රැස් කිරීම, සැකසීම සහ බෙදා හැරීම.
- පර්යේෂණ හා සංවර්ධන නිමැවුම් උත්තේජනය කිරීම සහ ශ්‍රී ලංකාවේ විද්‍යා,තාක්ෂණ හා නවෝත්පාදන භූ දර්ශනයේ ගෝලීය දෘශ්‍යතාව වැඩි දියුණු කිරීම අරමුණු කර ගනිමින්, ගෝලීය කුසලතා යොදාගැනීම හරහා අති නවීන දැනුම, පර්යේෂණ සහයෝගීතාව, තාක්ෂණික සහයෝගීතාවයන් දේශසීමා හරහා හුවමාරු කිරීමට පහසුකම් සැලසීම.

- ඉහළ ප්‍රමුඛතා සහිත ජාතික අවශ්‍යතා ආමන්ත්‍රණය කරමින් පර්යේෂණ ශිෂ්‍යත්ව සහ අධිශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම හරහා ජාතික නවෝත්පාදන පරිසර පද්ධතියේ අභිවෘද්ධිය සඳහා පර්යේෂණ සහ සංවර්ධන ශ්‍රම බලකායේ (R&D workforce) ධාරිතා වර්ධනය
- විද්‍යා හා තාක්ෂණ කළමනාකරණ තොරතුරු පද්ධතියක් පවත්වාගෙන යාම, විද්‍යා, තාක්ෂණ හා නවෝත්පාදන ප්‍රතිපත්ති දර්ශක උත්පාදනය කිරීම සඳහා ජාතික පර්යේෂණ සහ සංවර්ධන සමීක්ෂණ සහ ප්‍රතිපත්ති පර්යේෂණ සිදු කිරීම
- ජාතියේ විද්‍යා සාක්ෂරතාවය (Science Literacy) ඉහළ නැංවීම සඳහා විද්‍යාව ප්‍රචලිත කිරීම සහ නිර්මාණශීලීත්වය හා නවෝත්පාදන හැකියාවන් වර්ධනය කරනු පිණිස STEAM වෙත විශේෂ අවධානයක් යොමු කරමින් විද්‍යා අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීම.

10.3. 2024 වර්ෂයේ ජයග්‍රහණ

- ජාතික විද්‍යා පදනම නොකඩවා දෙවන වරටත් වාර්ෂික වාර්තා 2024 ට රන් සම්මානය පිදුම් ලැබිණි.
- දැනට ක්‍රියාත්මක වන පර්යේෂණ සහ සංවර්ධන ව්‍යාපෘති සහ තාක්ෂණ සංවර්ධන ව්‍යාපෘති 28 ක් කළමනාකරණය සහ ප්‍රගති අධීක්ෂණයකිරීම.
- වැඩි සමාජ-ආර්ථික ප්‍රතිලාභ ලබා දීම සඳහා තාක්‍ෂණ සංවර්ධනය, පවරාදීම සහ වාණිජකරණය සඳහා 60% අරමුදල් වෙන්කරමින් 'විද්‍යාගාරයේ සිට වෙළඳපොල දක්වා' හා 'පර්යේෂණ තුලින් ප්‍රායෝගිකත්වයට'නමින් නව ආකෘතීන් ජාතික විද්‍යා පදනම විසින් හඳුන්වා දී ඇත.
- කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්තවල (SMEs) හි නවෝත්පාදන ධාරිතාව සහ තරඟකාරිත්වය ඉහළ නැංවීම සඳහා විශේෂ විධිවිධාන සලසා ඇති අතර ඒ අනුව "Partnerships for SME development Grants" සඳහා අයදුම්පත් විශේෂ කැඳවීමක් විවෘත කර ඇත. එමගින් කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ගේ දළ දේශීය නිෂ්පාදිතයට දායකත්වය ඉහළ නැංවීම අපෙක්ෂා කෙරේ.
- පර්යේෂණ සහ සංවර්ධන ක්‍රියාවලියේ අභිවෘද්ධිය උදෙසා කැපී පෙනෙන දායකත්වයක් දැක් වූ පර්යේෂකයන් ඇගයීම සඳහා උපාධි අධීක්ෂණය සහ ජාතික පර්යේෂණ,සංවර්ධන ශ්‍රම බලකාය වැඩිදියුණු කිරීම වෙනුවෙන් NSF SUSRED සම්මාන පර්යේෂකයින් 98 දෙනෙකු සඳහා පිරිනමන ලදී.
- පර්යේෂණ සහ සංවර්ධන නිමැවුම් වඩාත් සඵලදායී කරනුවස් සහ ශ්‍රී ලංකාවේ පර්යේෂණ සහ සංවර්ධන භූ දර්ශනයේ ගෝලීය දෘශ්‍යතාව වැඩිදියුණු කිරීම සඳහා චීනයේ ජාතික ස්වාභාවික විද්‍යා පදනම (NSFC) සමඟ එක්ව ජාත්‍යන්තර සහයෝගීතා පර්යේෂණ වැඩසටහනක් ආරම්භ කරන ලදී.
- පාසල් මට්ටමින් STEM අධ්‍යාපනය සඳහා පහසුකම් සැලසීම සහ ප්‍රවර්ධනය කිරීමෙහිලා ප්‍රමුඛ කාර්යභාරයක් NSF ඉටු කළ අතර එමගින් ගෝලීය වෙළෙඳපොළේ ඉල්ලුමට සරිලන අනාගත ශ්‍රම බලකාය සූදානම් කිරීම.
- පාසල් මට්ටමින් නවෝත්පාදන සංස්කෘතියක් ඇති කිරීම සහ අනාගත පර්යේෂණ නායකයින් බිහිකිරීම සඳහා, විද්‍යා ප්‍රචලිත කිරීම සඳහා වූ NSF සම්මාන ප්‍රදානෝත්සවයේදී කැපී පෙනෙන සිසුන් 167 දෙනෙකු සහ ගුරුවරුන් 31 දෙනෙකු ඇගයීමට ලක් කරන ලදී.

- ජාතික මට්ටමේ පර්යේෂණ සහ සංවර්ධන සංඛ්‍යාලේඛන උත්පාදනය කිරීම, තොරතුරු රැස් කිරීම හා ඒවා යුනෙස්කෝ සංඛ්‍යාලේඛන ආයතනය (UNESCO Institute of Statistics) වෙත ඉදිරිපත් කිරීම, එමගින් ශ්‍රී ලංකාවේ විද්‍යාව, තාක්‍ෂණය සහ නවෝත්පාදන හු දර්ශනයේ ගෝලීය දෘශ්‍යතාව වැඩිදියුණු කිරීම සහ ගෝලීය නවෝත්පාදන දර්ශකයේ (The Global Innovation Index) ශ්‍රේණිගත කිරීම වැඩිදියුණු කිරීමට දායක වීම සඳහා ජාතික පර්යේෂණ සහ සංවර්ධන සමීක්ෂණය (National R&D survey) සිදු කරන ලදී.
- ජාත්‍යන්තර තලයේ SCIE හි සුචිගත කර ඇති ශ්‍රී ලංකාවේ එකම සඟරාව වන ජාතික විද්‍යා පදනමේ සඟරා වෙලුම් දෙකක් (JNSF) ප්‍රකාශයට පත් කර ඇත. එමගින් ශ්‍රී ලංකාවේ පර්යේෂණ සහ සංවර්ධන හු දර්ශනයේ ගෝලීය දෘශ්‍යතාව වැඩිදියුණු කිරීම අපේක්ෂා කෙරේ.
- විද්‍යාව, තාක්‍ෂණය සහ නවෝත්පාදන අංශයේ ගෝලීය වර්ධනයන් සහ ප්‍රවණතා ආමන්ත්‍රණය කරමින් විද්‍යාව, තාක්‍ෂණය සහ නවෝත්පාදන හරහා දළ දේශීය නිෂ්පාදිතයට සැලකිය යුතු දායකත්වයක් ලබා දීම සඳහා NSF ඉදිරි වසර පහ සඳහා (2024-2028) සිය උපායමාර්ගික සැලැස්ම සකස් කර ඇත.
- ඵලදායී පුස්තකාල කළමනාකරණයක් සඳහා නවීන තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය ඒකාබද්ධ කිරීම තුළින් S&T පුස්තකාල ඩිජිටල්කරණය කිරීමට NSF ප්‍රමුඛ කාර්යභාරයක් ඉටු කර ඇති අතර එමගින් ඩිජිටල් ආර්ථිකයට දායකවීම.
- නවීන තාක්ෂණයන් කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් NSF Global Digital Platform හරහා විදේශගත ශ්‍රී ලාංකික විද්වතුන් සහභාගි කර ගැනීම තුළින් විද්‍යා තාක්ෂණ සහ නවෝත්පාදන අංශයේ ශ්‍රම බලකායේ ධාරිතාව ගොඩනැගීම.
- ජාතියේ විද්‍යා සාක්ෂරතාවය වැඩි දියුණු කිරීම සඳහා නිවැරදි සහ සත්‍ය විද්‍යාත්මක තොරතුරු සහ පර්යේෂණ සොයාගැනීම් සාමාන්‍ය ජනතාව අතර බෙදා හැරීමේ අරමුණින් NSF සිය ‘Objective Science Reporting’ වැඩසටහන දියත් කර ඇත.
- ශ්‍රී ලංකාවේ උක් සහ කිරි ක්ෂේත්‍ර (Sugarcane and dairy sectors) වැඩිදියුණු කිරීම සඳහා බ්‍රසීලයේ බ්‍රසීල සහයෝගිතා නියෝජිතායතනය (Brazilian Cooperation Agency) සමඟ තාක්ෂණික සහයෝගීතාව සම්බන්ධීකරණය කිරීමේදී NSF ප්‍රමුඛ කාර්යභාරයක් ඉටු කරයි.

10.4. කාර්යසාධනය

I. පර්යේෂණ ප්‍රදාන

අනු අංකය	පර්යේෂණ ක්ෂේත්‍රය	2023 පර්යේෂණ සංඛ්‍යාව		2024 පර්යේෂණ සංඛ්‍යාව	
		ඉලක්කය	නිම කළ සංඛ්‍යාව	ඉලක්කය	නිම කළ සංඛ්‍යාව
1	කෘෂිකර්මය	නව ප්‍රදාන 15ක් ප්‍රධානය කිරීම දැනට ක්‍රියාත්මක ප්‍රදාන 49ක් නිරීක්ෂණය	5	පර්යේෂණ ප්‍රදාන 40ක් ශිෂ්‍යත්ව 05ක් අමතර කොටස් ප්‍රදාන 18ක්	
2	මූලික හා ව්‍යවහාරික විද්‍යා		6		01
3	ජෛව තාක්ෂණය		2		04
4	පාරිසරික හා ජෛව විවිධත්ව		2		0
5	ඉංජිනේරු, ගෘහ නිර්මාණ ශිල්පය සහ ICT		4		01
6	සෞඛ්‍යය විද්‍යා		5		06
7	සමාජ විද්‍යා		1		01

II. පර්යේෂණ හා සංවර්ධන පවරා දෙනු ලැබූ/ වාණිජකරණය කරන ලද

අනු අංකය	පවරා දෙනු ලැබූ/ වාණිජකරණය කළ තාක්ෂණ	2023		2024	
		සංඛ්‍යාව	කර්මාන්ත අංශයේ හවුල්කරු	සංඛ්‍යාව	කර්මාන්ත අංශයේ හවුල්කරු
01	ඉහළ අගය එකතු කිරීමක් ලෙස ශ්‍රී ලංකාවේ ග්‍රැෆයිට් භෞතික පිරිසිදු කිරීම	1	රාගෙදර ග්‍රැෆයිට් පුද්ගලික සමාගම		
02	පරිසර හිතකාමී කෘෂිකර්මාන්තය හරහා එළවළු නිෂ්පාදනය සඳහා ජෛව පොහොර	1	සාර භූමි ලංකා පුද්ගලික සමාගම		
03	කොළඹ විශ්වවිද්‍යාලය විසින් සංවර්ධනය කරන ලද ක්‍රියාකාරී ඩෙංගු කළමනාකරණ පද්ධතිය (Pro-DMS).			1	සෞඛ්‍ය අමාත්‍යාංශයේ ඩෙංගු මර්දන ඒකකය
04	CKDU ප්‍රදේශයේ ජල පිරිපහදුවට අදාළ තාක්ෂණය			1	ජල සම්පාදන හා ජලප්‍රවාහන මණ්ඩලය
05	PV සූර්යබල තාක්ෂණය විදුලි රැහැන් සම්ප්‍රේෂණය හා ඒකාබද්ධ කිරීම සඳහා නව තාක්ෂණයන් හඳුන්වා දීම			1	CEB & LECO

III. ගොනු කරන ලද/ලබා ගත් පේටන්ට් බලපත්‍ර

ක්ෂේත්‍රය	ආකාරය	2023 වර්ෂය		2024 වර්ෂය	
		ඉලක්කය	ප්‍රගතිය	ඉලක්කය	ප්‍රගතිය
සෞඛ්‍ය විද්‍යාව	ගොනු කළ	4	4	4	2
	ලබා ගත්	2	1	1	1

IV. විද්‍යාව ප්‍රචලිත කිරීම

ප්‍රචලිත කිරීමේ ක්‍රමවේදය	2023 වැඩසටහන්			2024 වැඩසටහන්		
	ඉලක්කගත	ප්‍රගතිය	ප්‍රතිලාභීන්	ඉලක්කගත	ප්‍රගතිය	ප්‍රතිලාභීන්
විද්‍යා පර්යේෂණ ව්‍යාපෘති පුහුණුව සහ තරඟය	SRPC 2023	100%	372	SRPC 2024	1. SRPC 100% 2. SRPC 2024 තරඟය ආරම්භ	837
Kid Naturalist වැඩසටහන	100%	100%	1200	2024 ජූනි - 2025 ජනවාරි	90%	4995

විද්‍යා තරඟ	8	100%	2552	සියලුම තරඟ පවත්වා අවසන් කිරීම	20%	2552
ප්‍රජා වැඩසටහන	01 ප්‍රජා පදනම	2	150	01 ක් අඛණ්ඩව පවත්වාගන යාම	ක්‍රියාත්මකව පවතී	150
SEPP ප්‍රදානය - යටිතල පහසුකම්	පාසල් 02කට සහාය	(50%)	1500	02ක් අඛණ්ඩව පවත්වාගන යාම	ක්‍රියාත්මකව පවතී	සිසුන් 78500 ක්
STEAM වෘත්තීය වැඩසටහන	01	02 පුහුණු වැඩසටහන ආරම්භ කර ඇත	1600	01	පුහුණු වැඩසටහන් 01ක් අවසන් කර ඇත.	600
සිසුන් තුල උනන්දුවක් නිර්මාණය කිරීම අරමුණු කරගත් සංචාරය	එක් සංචාරයකට සිසුන් 450 ක් සහ ගුරුවරුන් 50 ක්	100%	500		-	-
STEM දියත් කිරීම	සියලුම පළාත් ආවරණය වන පරිදි STEM දියත් කිරීම	100%	3000		-	-
ජාතික විද්‍යා දිනය	නොවැම්බර් 10	100%	1500	ලෝක විද්‍යා දිනයට සමගාමීව විශේෂ උත්සවයක් පැවැත්වීම	පාසල් පර්යේෂණ සම්මේලනය සාර්ථකව අවසන් කරන ලදී	450
විද්‍යාව ප්‍රචලිත කිරීම උදෙසා NSF සම්මාන ප්‍රදානෝත්සවය				සම්මාන ප්‍රදානෝත්සවය	සම්පූර්ණ කර ඇත	ඍජු ප්‍රතිලාභීන් 230 ක් සහ වක්‍ර ප්‍රතිලාභීන් 750 ක්
ජාත්‍යන්තර වැඩසටහන් වලට සහභාගී වීම	01 වැඩසටහන චීන තරුණ කඳවුර	100%	සිසුන් 12 දෙනෙක් ගුරුවරු 3 දෙනෙක් සම්මාන 10ක් ලැබී ඇත	02 වැඩසටහන සහභාගී විය ISEF -SA - සහ චීන තරුණ කඳවුර		ISEF = සිසුන් 3; චීන තරුණ කඳවුර = සිසුන් 04 ගුරුවරු 02
ගුරු පුහුණුව				02		ගුරුවරුන් 775

V. විද්‍යාත්මක ප්‍රකාශන

අනු අංකය	ක්ෂේත්‍රය	වර්ගය	2023 ප්‍රකාශන සංඛ්‍යාව		2024 ප්‍රකාශන සංඛ්‍යාව	
			ඉලක්කය	ප්‍රකාශිත	ඉලක්කය	ප්‍රකාශිත
1	කෘෂිකර්මය සහ ආහාර විද්‍යාව, මූලික විද්‍යාව, ජෛව තාක්ෂණය, පරිසරය සහ ජෛව විවිධත්ව ඉංජිනේරු, ගෘහ නිර්මාණ ශිල්පය සහ ICT, සෞඛ්‍ය විද්‍යාව, සමාජ විද්‍යා, දේශගුණික විපර්යාස සහ ස්වභාවික විපත්	SCIE සුචිගත ප්‍රකාශන	25	21	55	13
		සමාලෝචිත ජර්නල ප්‍රකාශන (SCIE සුචිගත නොවන)		07		04
		සන්නිවේදනය		44		15

VI. වෙනත් විශේෂ වැඩසටහන්

- ජාතික නිර්මාණ මධ්‍යස්ථානය (NDC), ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය (SLSI) සහ ජාතික අත්කම් කවුන්සිලය (NCC) සමඟ එක්ව ශ්‍රී ලාංකේය බතික් කර්මාන්තයේ ගුණාත්මකභාවය සහ තරගකාරිත්වය ඉහළ නැංවීම සඳහා යහපත් නිෂ්පාදන පිළිවෙත් (Good Manufacturing Practices) සංවර්ධනය කරනු පිණිස NSF විසින් ප්‍රමුඛ කාර්යභාරයක් සිදුකරන ලදී. ජාතික ආර්ථිකයට වැඩි දායකත්වයක් දැක්වීමට අවස්ථාව සැලසෙන පරිදි නිෂ්පාදන ක්‍රියාවලිය තිරසාර, බව සහ බතික් නිෂ්පාදනවල ගුණාත්මක භාවය වැඩිදියුණු කිරීම තුළින් ශ්‍රී ලාංකේය බතික් කර්මාන්තය ඉහල නැංවීම මෙහි අරමුණ විය.
- රටේ විද්‍යා හා තාක්ෂණ අංශයේ ප්‍රමුඛතම කේන්ද්‍රස්ථානය ලෙස ජාතික විද්‍යා පදනම විසින් ජාතික උපකරණ දත්ත ගබඩාව සංවර්ධනය කර ඇත - ආයතනවල පවතින උපකරණ පිළිබඳ නවීනතම ඩිජිටල් දත්ත ගබඩාවකි. සාධාරණීකරණය සහතික කිරීම සහ ඉහළ මට්ටමේ උපකරණ අනවශ්‍ය ලෙස ද්විකරණය වීම වැළැක්වීමට අමතරව, එය ශාස්ත්‍රීය අංශයේ විද්වතුන් විශේෂයෙන් අවශ්‍ය රසායනාගාර පහසුකම් සහ , ,තාක්ෂණික නිපුණතා නොමැති MSME ඇතුළු පර්යේෂණ සහ සංවර්ධන ආයතන සහ කර්මාන්ත, සඳහා පරිශීලකහිතකාමී-, ලාභදායී, විශ්ලේෂණාත්මක සහ පරීක්ෂණ සේවාවක් සහ පර්යේෂණ සහාය ලබා දෙනු ඇත.
- Univotec හි ඉල්ලීම පරිදි, එහි ICT කථිකාචාර්යවරුන් සඳහා IoT පිළිබඳ ධාරිතා ගොඩනැගීමේ වැඩසටහනක් NSF Global Digital Platform හරහා පවත්වන ලදී. එහිදී සම්පත් දායකයා ලෙස කටයුතු සිදු කරනුයේ ක්ෂේත්‍රයේ ශාස්ත්‍රීය සහ කර්මාන්ත යන දෙඅංශයෙන්ම විශේෂඥ දැනුමක් ඇති ඕස්ට්‍රේලියාවේ වෙසෙන කීර්තිමත් ශ්‍රී ලාංකික විද්වතෙකි.
- අධ්‍යාපන අමාත්‍යාංශයේ නිර්දේශ සහ සහයෝගීතාව සහිතව තෝරාගත් කාර්ය සාධනය දුර්වල පාසල්වල කාර්ය සාධනය ඉහළ නැංවීම සඳහා කොමර්ෂල් බැංකුව සමඟ එක්ව විශේෂ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කරන ලදී.
- OSTP ප්‍රදානයක් තව දුරටත් ඉදිරියට ගෙනයමින් NSFහි මූල්‍ය සහාය ඇතිව රබර් වැවිලි කර්මාන්ත ක්ෂේත්‍රයේ ඵලදායිතාව ඉහළ නැංවීම සඳහා රබර් ශාකයේ පූර්ණ ආර්ථික ආයු කාලය ප්‍රයෝජනයට ගැනීම සහතික කිරීම සඳහා තිරසාර පොත්ත කළමනාකරණය (sustainable bark management) පිළිබඳ නව විදේශ දැනුම රබර් පර්යේෂණ ආයතනය සමග එක්ව රබර් කර්මාන්තයේ නියැලෙන්නන් හට ලබාදීමට කටයුතු කරනලදී.

10.5. 2025 වර්ෂය සඳහා ඉලක්ක

- අපනයනය ඉලක්ක කරගත් වැවිලි කර්මාන්ත අංශයට අවශ්‍ය පර්යේෂණ හා තාක්ෂණික සංවර්ධනයට දායකවීම තුලින් ආර්ථික සංවර්ධනයට දායක වීම.
- විද්‍යාගාරයේ සිට වෙළඳපොල දක්වා' හා 'පර්යේෂණ තුලින් ප්‍රායෝගිකත්වයට'ආකෘතීන් අඛණ්ඩව පවත්වාගෙන යාම.
- නව දැනුම නිර්මාණය කිරීම ඉලක්ක කරගත් පර්යේෂණ ව්‍යාපෘති 15ක් සඳහා මුල්‍යාධාර සැපයීම.
- තාක්ෂණ සංවර්ධනය, තාක්ෂණ පැවරුම් , පර්යේෂණ සහ සංවර්ධන නිමැවුම් වාණිජකරණයහා ව්‍යාපාර ආරම්භය සිදු කිරීම සඳහා නව මුල්‍ය ප්‍රදාන 20ක් ප්‍රදානය කිරීම.
- අපනයනය ඉලක්ක කරගත් කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ගේ නවෝත්පාදන ධාරිතාව ඉහළ නැංවීම සඳහා මුල්‍ය ප්‍රදාන 5ක් ප්‍රදානය කිරීම
- පර්යේෂණ සහ සංවර්ධන ක්ෂේත්‍රයේ නියැලෙන පුද්ගලයින්ගේ ධාරිතාව වර්ධනය කිරීම ඉලක්ක කරගත් නව පර්යේෂණ ශිෂ්‍යත්ව 10ක් ප්‍රදානය කිරීම.
- පර්යේෂණ සහ සංවර්ධන නිමැවුම් වැඩිදියුණු කිරීම සහ ගෝලීය දෘශ්‍යතාව වැඩි දියුණු කිරීම සඳහා ජාත්‍යන්තර සහයෝගීතා 05 ක් ස්ථාපිත කිරීම.
- නව උපකරණ 2000ක් එකතු කරමින් ජාතික උපකරණ දත්ත ගබඩාව යාවත්කාලීන කිරීම.
- JNSF සඟරාවේ කලාප 4ක් ප්‍රකාශයට පත් කිරීම.
- NSF ගෝලීය ඩිජිටල් වේදිකාව හරහා විදේශගත ශ්‍රී ලාංකීය විද්වතුන්ගේ සහයෝගය ලබා ගැනීම.
- නවෝත්පාදන පරිසර පද්ධතියේ ප්‍රගමනය උදෙසා ගෝලීය විද්‍යා,තාක්ෂණ හා නවෝත්පාදන සංවිධාන සමඟ ජාලකරණය ශක්තිමත් කිරීම.
- ශ්‍රී ලංකා ජර්නල් ඔන්ලයින් වේදිකාව හරහා පර්යේෂණ ප්‍රකාශන සඳහා පුළුල් සහ පහසු ප්‍රවේශයක් ලබා දීම තුලින් ඩිජිටල් ආර්ථිකයට දායක වීම.
- ඩිජිටල් පුස්තකාල ප්‍රවර්ධනය කිරීම සහ පුස්තකාල වෘත්තිකයන්ගේ ධාරිතා ගොඩනැගීම.
- ජාතික පර්යේෂණ සහ සංවර්ධන සමීක්ෂණය සිදු කිරීම, සංඛ්‍යාලේඛන අත්පොත ප්‍රකාශයට පත් කිරීම සහ ජාතික පර්යේෂණ සහ සංවර්ධන සංඛ්‍යාලේඛන යුනෙස්කෝ ආයතනය වෙත ඉදිරිපත් කිරීම
- පාසල් ප්‍රජාවගේ ප්‍රයෝජනය සඳහා පාසල් විද්‍යා සමිති ජාලය පුළුල් කිරීම.

11. ශ්‍රී ලංකා ඉන්ස්ටිටියුට් ඔෆ් බයෝටෙක්නොලොජි (SLIBTEC)

11.1. හැඳින්වීම

ශ්‍රී ලංකා රජය විසින් ගනු ලැබූ ප්‍රතිපත්තිමය තීරණයක් පදනම් කර ගනිමින් 2020 ඔක්තෝබර් 12 වැනි දින භාණ්ඩාගාර ලේකම්ගේ පූර්ණ කොටස් හිමිකාරිත්වය යටතේ රජයට අයත් සමාගමක් ලෙස ශ්‍රී ලංකා ඉන්ස්ටිටියුට් ඔෆ් බයෝටෙක්නොලොජි ප්‍රයිවට් ලිමිටඩ් (SLIBTEC Pvt Ltd) සංස්ථාපනය කෙරිණි. 2021 නොවැම්බර් මස සිට ශ්‍රී ලංකා ඉන්ස්ටිටියුට් ඔෆ් බයෝටෙක්නොලොජි ආයතනය හෝමාගම,පිටිපන පිහිටුවා ඇති අතර වත්මන වනවිට ශ්‍රී ලංකා ඉන්ස්ටිටියුට් ඔෆ් බයෝටෙක්නොලොජි ආයතනය විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වේ. ශ්‍රී ලංකා ඉන්ස්ටිටියුට් ඔෆ් බයෝටෙක්නොලොජි ආයතනය සංරචක දෙකකින් සමන්විත වේ. ඒවා නම් SLIBTEC උද්‍යානය සහ SLIBTEC පර්යේෂණ ලෙස සංරචක දෙකකින් සමන්විත වේ. අමාත්‍ය මණ්ඩල තීරණයක් මගින් සම්පූර්ණ SLINTEC දෙවන ෂඩාස්‍ර ගොඩනැගිල්ල සහ එහි පහසුකම් 2024 මාර්තු මාසයේ සිට SLIBTEC වෙත පවරා ඇති අතර අමාත්‍යාංශය විසින් මෙය SLIBTEC වෙත පැවරීමට කටයුතු සිදු කෙරෙමින් පවතී. නාගරික සංවර්ධන අධිකාරිය මගින් ඉඩම් වෙන් කිරීම විධිමත්ව සිදු කර ඇති අතර උද්‍යාන සංවර්ධන ක්‍රියාවලිය සිදුවෙමින් පවතී.

දැක්ම

ජෛව තාක්ෂණය හා සබැඳි කාර්යයන් උදෙසා ජාත්‍යන්තර වශයෙන් පිලිගැනුමට ලක්වූ ගමනාන්තයක් ලෙස ක්‍රියාකරමින් ශ්‍රී ලංකාව තුල නවෝත්පාදන මත පදනම් වූ ජෛව-ආර්ථිකයක් ස්ථාපනය සඳහා ප්‍රමුඛත්වය ගැනීම

මෙහෙවර

ශ්‍රී ලංකාවේ ආර්ථිකය සැලකිය යුතු මට්ටමින් ඉහල නැංවීමට සමත් නව්‍ය ජෛවතාක්ෂණ නිෂ්පාදන සහ සේවාවන් වර්ධනය කරනු පිණිස අනෙකුත් අති නවීන තාක්ෂණික අංශ සමඟ සහජීවනයෙන් කටයුතු කරමින් සහ ශ්‍රී ලංකාව ගෝලීය ජෛවතාක්ෂණ මධ්‍යස්ථානයක් ලෙස ස්ථානගත කරනු පිණිස නිපුනතා සපිරි මානව සම්පත් සංචිතයක් වැඩිදියුණු කිරීම සහ රඳවා තබා ගැනීමට ක්‍රියා කරමින් භෞතික වශයෙන් එක ස්ථානයක අති නවීන ජෛවතාක්ෂණ නවෝත්පාදන පරිසර පද්ධතියක් නිර්මාණය කිරීම

11.2. ආයතනයෙහි කාර්යයන්

ගෝලීය ප්‍රශස්ත භාවිතයන් හා අනුකූලත්වය දක්වමින් සියලු ක්ෂේත්‍රයන්හි තිරසාර බව ඉහල නංවමින්, භෞතිකව පිහිටුවා ඇති එක ස්ථානයක උසස් තාක්ෂණික නිෂ්පාදන පිලිබඳ පර්යේෂණ සහ නවෝත්පාදන, නියමු බලාගාර සහ වැඩිදියුණු කිරීම් සිදු කිරීමේ හැකියාව ලබාදෙනු පිණිස උපයෝගීතාවන්, කාර්ය සම්පාදනය සහ සියලු සහායක පද්ධතීන් සපයාදීම හරහා හෝමාගම, පිටිපන පිහිටුවා ඇති ජාතික මට්ටමේ මධ්‍යගත ජෛවතාක්ෂණ නවෝත්පාදන පහසුකමක් ආශ්‍රිතව උසස් මට්ටමේ ජෛව තාක්ෂණ නවෝත්පාදන සඳහා හිතකර පරිසර පද්ධතියක් නිර්මාණය කිරීම

- අති නවීන ජෛවතාක්ෂණ නවෝත්පාදන උදෙසා ප්‍රශස්ත භාවිතයන් යොදාගනිමින් හිතකර අති නවීන පරිසර පද්ධතියක් ස්ථාපනය,ඒ සඳහා පහසුකම් සැලසීම සහ සහය ලබාදීම
- උසස් මට්ටමේ ජෛවතාක්ෂණ කර්මාන්තයන්හි සංවර්ධනය කඩිනම් කරවනු පිණිස නවෝත්පාදන සංස්කෘතියක් වැඩිදියුණු කිරීම
- විශේෂිත ක්ෂේත්‍ර තුල ගෝලීය වෙළඳපල අවශ්‍යතාවන් සපුරාලීම උදෙසා නව්‍ය ජෛවතාක්ෂණ කර්මාන්ත වැඩිදියුණු කිරීම
- රටතුල විචිත්‍රවත් ඉහල මට්ටමේ ජෛව තාක්ෂණ ව්‍යාපාර ආරම්භයන් සහ කුඩා සහ මාධ්‍ය පරිමාන ව්‍යවසායක සංස්කෘතියක් වැඩිදියුණු කිරීම
- ජෛව තාක්ෂණික මෙවලම් භාවිතයෙන් ධාරිතා ගොඩනැංවීම, ගුණාත්මක අධ්‍යාපනය, පර්යේෂණ සහ සුභසාධන ක්‍රියාකාරකම් වැඩිදියුණු කිරීම හරහා රටෙහි ආර්ථික සංවර්ධනය දිරිගැන්වීම
- විශ්වවිද්‍යාල,රාජ්‍ය පර්යේෂණ ආයතන,පෞද්ගලික අංශය සහ ගෝලීය විශිෂ්ටත්ව ජෛවතාක්ෂණ මධ්‍යස්ථාන සමඟ උපායමාර්ගික හවුල්කාරිත්වයන් වැඩිදියුණු කිරීම

- 2025 වසරේදී 1% කින් අපනයන වෙළඳපල ඉහල නැංවීම අරමුණු කර ගනිමින් ශ්‍රී ලාංකීය උසස් තාක්ෂණික ජෛව තාක්ෂණ නිෂ්පාදන සඳහා ඇති පෙළඹවීම සඳහා සහායය ලබා දීම

11.3. 2024 වර්ෂයේ ජයග්‍රහණයන්

- අණුක රෝග විනිශ්ච සහ එන්නත් ජෛව චිකිත්සක, කෘෂි ජෛව තාක්ෂණ (පටක රෝපණ පහසුකම් ඇතුළුව) රසායනාගාර විසින් විද්‍යාගාර තුල සිදුකෙරෙන සංවර්ධන කාර්යයන් සම්පූර්ණ කරමින් සිටින අතර උපකරණ ලැබෙමින් පවතී.
- ප්‍රවේණි විද්‍යා පහසුකම සහ ප්‍රවාහ සෛලමිතික විශ්ලේෂණය යටතේ සේවාවන් පිරිනැමීමේ කටයුතු සිදුකෙරේ.
- රෝග විනිශ්ච සේවා රසායනාගාර යටිතල පහසුකම් නවීකරණය කිරීම සම්පූර්ණ කර ඇති අතර මෙහෙයුම් සම්බන්ධ කාරණයක් හේතුවෙන් සේවා ලබා දිය නොහැක.
- ICGEB යටතේ පළමු ජාත්‍යන්තර රැස්වීම සාර්ථකව නිමාව දැකීය.
- මොනෑෂ් විශ්ව විද්‍යාලය සහ ඔහායෝ ප්‍රාන්ත විශ්ව විද්‍යාලය සමඟ අවබෝධතා ගිවිසුම් (MoU) 2ක් අත්සන් කරන ලදී
- ජාත්‍යන්තර පර්යේෂණ ප්‍රදාන 3ක් ලැබී ඇත.
  ICGEB CRP - යූරෝ 30,000
  NIH R21 - ඇ.ඩො. 76,255
  UNESCO TWAS - ඇ.ඩො. 41,000
- ප්‍රකාශන දෙකක් ලැබී ඇත.
- වාණිජකරණය කරනු ලැබූ නිෂ්පාදන සංවර්ධනය කිරීම සඳහා පුද්ගලික අංශයේ කොන්ත්‍රාත් පර්යේෂණ දෙකක් ක්‍රියාත්මකව පවතී.
- ව්‍යාපාර ආරම්භක (RIVOLTA) සමාගම ඔවුන්ගේ නිෂ්පාදන සඳහා NMRA අනුමැතිය ලබා ගැනීමේ ක්‍රියාවලියේ නියුක්තව සිටී.
- නාගරික සංවර්ධන අධිකාරිය විසින් උද්‍යාන ඉඩම් නීත්‍යානුකූලව නිරවුල් කර දීමේ ක්‍රියාවලිය අවසන් කිරීමට ආසන්නව පවතින අතර වාස්තු විද්‍යාත්මක සැලසුම් නිර්මාණය සහ උද්‍යාන සංවර්ධන කටයුතු ඉදිරියට කරගෙන යාමට සැලසුම් කර ඇත.
- දැනට සිටින ගොඩනැගිල්ල 2024 මාර්තු මාසයේදී අමාත්‍ය මණ්ඩලය විසින් SLIBTEC වෙත ලබා දී ඇති අතර අමාත්‍යාංශය විසින් එම කටයුතු අවසන් කිරීම අපේක්ෂිතය.

11.4. කාර්යසාධනය

I. පර්යේෂණ හා සංවර්ධන

	පර්යේෂණ ක්ෂේත්‍රය	2023 පර්යේෂණ සංඛ්‍යාව		2024 පර්යේෂණ සංඛ්‍යාව	
		ඉලක්කය	ප්‍රගතිය	ඉලක්කය	ප්‍රගතිය
01	අණුක රෝගවිනිශ්චය සහ එන්නත්	02	01	08	-
02	ජෛව තොරතුරු විද්‍යාව	03	-	03	-
03	කෘෂි ජෛව තාක්ෂණය	03	-	03	-

II. පවරා දෙනු ලැබූ/ වානිජකරණය කරනු ලැබූ පර්යේෂණ සහ සංවර්ධන තාක්ෂණ

අනු අංකය	පවරා දෙනු ලැබූ/වානිජකරණය කරනු ලැබූ තාක්ෂණ (පර්යේෂණ ක්ෂේත්‍රය)	2024	
		ඉලක්කය	කර්මාන්ත අංශයේ හවුල්කරු
01	දිලීර විද්‍යාව	01	පෞද්ගලික අංශය
02	ජෛව ඖෂධ	01	පෞද්ගලික අංශය
03	ජෛව ද්‍රව්‍ය	01	පෞද්ගලික අංශය
04	එන්සයිම පිලිබඳ විද්‍යාව	01	පෞද්ගලික අංශය

III. විද්‍යාව ප්‍රචලිත කිරීම

ප්‍රචලිත කිරීමේ ක්‍රමවේදය	2023			2024		
	ඉලක්කගත වැඩසටහන් සංඛ්‍යාව	සම්පූර්ණ කරනු ලැබූ සංඛ්‍යාව	ප්‍රතිලාභීන් සංඛ්‍යාව	ඉලක්කගත වැඩසටහන් සංඛ්‍යාව	සම්පූර්ණ කරනු ලැබූ සංඛ්‍යාව	ප්‍රතිලාභීන් සංඛ්‍යාව
වැඩමුළු	05	01	75	03		

IV. විද්‍යාත්මක ප්‍රකාශන

අනු අංකය	ක්ෂේත්‍රය	2024	
		ඉලක්කය	ප්‍රකාශිත
01	කෘෂි ජෛව තාක්ෂණය	03	00
02	අණුක රෝගවිනිශ්චය සහ එන්නත්	02	01
03	ජෛව ඖෂධ	01	01
04	දිලීර විද්‍යාව	02	02

11.5. 2025 වර්ෂය සඳහා ඉලක්ක

- ආයෝජකයින් ඒකරාශිකිරීම සඳහා උද්‍යානය වැඩිදියුණු කිරීම
- ගොඩනැගිලි සම්බන්ධ ගැටළු නිරාකරණය කිරීමෙන් පසු ආයෝජකයින් ගෙන්වාගනිමින් SLIBTEC හි ව්‍යාපාර ආරම්භ කිරීමේ තාක්ෂණ බීජෞෂක මධ්‍යස්ථානයෙහි කාර්යයන් සම්පූර්ණ කිරීම
- NDA හරහා වානිජකරණය කිරීම සඳහා නිෂ්පාදන වැඩිදියුණු කිරීම පිළිබඳ අවධානය යොමු කරමින් ගිවිසුම්ගත පර්යේෂණ සිදු කිරීම සඳහා ආයෝජකයින් ආකර්ෂණය කර ගැනීම
- ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව විසින් SLIBTEC සඳහා අනුමත කරනු ලැබූ සියලු උපකරණ HSEP ආසියානු සංවර්ධන බැංකු ප්‍රතිපාදන හරහා ලබාගැනීම
- ගෝලීය ප්‍රමිතීන් ලබාගනිමින් පර්යේෂණ සහ සේවා සඳහා විද්‍යාගාර ස්ථාපනය කිරීම
- බාහිර පාර්ශ්වයන්ගේ සහායයෙන් බුද්ධිමය දේපල ප්‍රතිපත්තියක් වැඩිදියුණු කිරීම

12. ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම (SLIC)

12.1. හැඳින්වීම

ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම දේශීය නව නිපැයුම්කරුවන්ගේ නව නිපැයුම් දිරිගැන්වීම, ප්‍රවර්ධනය සහ නිෂ්පාදනයන් දිරි ගැන්වීමත්, ඒවාට සම්බන්ධ අනුශාංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීමත් වෙනුවෙන් 1979 අංක 53 දරන ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන් දිරිගැන්වීමේ පනත යටතේ පිහිටුවා ඇති ව්‍යවස්ථාපිත ආයතනයකි.

දැක්ම

නව නිපැයුම් සහ නවෝත්පාදන තුලින් සෞභාග්‍ය උදා කිරීම

මෙහෙවර

ශ්‍රී ලාංකිකයන් ගේ නවෝත්පාදන හැකියාවන් ප්‍රවර්ධනය කරවීමේ ප්‍රධාන උත්ප්‍රේරකය ලෙස ක්‍රියා කරමින්, අදහස් ප්‍රායෝගික යෙදවුම් බවට පරිවර්තනය කිරීමේ ක්‍රියාවලිය සඳහා පහසුකම් සැලසීමේ පුරෝගාමියා ලෙස කටයුතු කිරීම

12.2. ආයතනයේ කාර්යයන්

- කොමිසමේ නියමයන්ට හා කොන්දේසීන්ට යටත්ව, නව නිපැයුම් සඳහා පේටන්ට් බලපත්‍ර අයදුම්කිරීමේදී අදාල කරුණු පරීක්ෂා කර බලා ඒ ඒ නව නිපැයුම්කරුවන්ට අවශ්‍ය තාක්ෂණික ආධාර ලබාදීම සහ පේටන්ට් අයදුම් පත පිළියෙල කිරීම වෙනුවෙන් උපකාර කිරීම.

- පේටන්ට් බලපත්‍ර නිකුත් කර ඇති නව නිපැයුම් හෝ පේටන්ට් අපේක්ෂිත නව නිපැයුම් වැඩි දියුණු කිරීම, පරිපූර්ණ කිරීම හා නිෂ්පාදනය කිරීම සඳහා කොමිසමේ නියමයන්ට යටත්ව මුදල් ආධාර ලබා දීම.

- නව නිපැයුම්කරුවන්ගේ පේටන්ට් බලපත්‍ර දේශීයව හෝ විදේශීයව ඉදිරිපත් කිරීමේ දී ඔවුන් නියෝජනය කිරීමෙන් සහ පේටන්ට් අයිතීන් උල්ලංඝනය කිරීම්වලදී මෙන්ම පේටන්ට් අයිතිය පිළිබඳ නඩු වල දී ඔවුන් ආරක්ෂා කිරීම සඳහා නීති ආධාර දීම.

- නව නිපැයුම්වල ගුණාත්මකභාවය මත පදනම්ව එම පේටන්ට් අයිතීන් පමණක් ඇපයට තබාගනිමින් රාජ්‍ය ණය දෙන ආයතන වෙතින් නව නිපැයුම්කරුවන්ට දීර්ඝ කාලීන ණය ලබාගැනීමට හැකි වන පරිදි නිර්දේශයන් ඉදිරිපත් කිරීම .නව නිපැයුමෙහි වැදගත්කම සහ අලෙවිය පිළිබඳව කොමිසම විසින් දෙනු ලබන තීරණය මත රඳා පවතිමින් ණය මුදලේ ප්‍රමාණය නිර්ණය කරනු ලැබේ.

- දේශීය නව නිපැයුම් ශ්‍රී ලංකාවේ සහ විදේශයන්හි අලෙවි කිරීම සඳහා නව නිපැයුම්කරුවන්ට උපකාර කිරීම.

- කෘෂිකර්මය, රසායන විද්‍යාව, වෛද්‍ය විද්‍යාව හා ඖෂධවේදය, භෞතික විද්‍යාව, මහජන ආරක්ෂා,සුභ සාධනය හා ජාතික ආරක්ෂාව, පොදු කර්මාන්ත හා යටිතල පහසුකම්, ප්‍රවාහනය යන ක්ෂේත්‍ර වල සහ වෙනත් එවැනි විද්‍යාත්මක හා තාක්ෂණ විද්‍යාත්මක ක්ෂේත්‍ර වල එක් එක් වර්ෂයන්හි ශ්‍රී ලංකාවේ දී පේටන්ට් බලපත්‍ර දෙන ලද සියළු ශ්‍රී ලාංකික නව නිපැයුම්කරුවන්ගේ නිපැයුම් සඳහා වාර්ෂිකව ජනාධිපති සම්මාන පිරිනැමීම හරහා දේශීය නව නිපැයුම් ප්‍රකට කිරීම වෙනුවෙන් ඔවුන් ඇගයීම හා ධෛර්ය දීම.

- බලය දෙන ලද නව නිපැයුම්කරුවනට සහ පර්යේෂකයන්ට ස්වකීය අනුමත කළ නව නිපැයුම් සහ පර්යේෂණ කරගෙන යාම සඳහා හෝ ඒවා පරිපූර්ණ කිරීම සඳහා පර්යේෂණ රසායනාගාර හෝ අත්හදා බැලීමේ මධ්‍යස්ථාන පහසුකම් හා සේවා ලබා ගත හැකි වන පරිදි පොදු පර්යේෂණ රසායනාගාරයක් සහ අත්හදා බැලීම් මධ්‍යස්ථානයක් පිහිටුවීම හා පවත්වාගෙන යාම.

- "නව නිපැයුම් පිළිබඳ ජනාධිපති ප්‍රදාන "තරඟවල ඒ ඒ විනිශ්චයකරුවන් විසින් තෝරාගනු ලබන ජයග්‍රාහකයන්ට මුදල් ත්‍යාග හා පදක්කම් පිරිනැමෙන" නිර්මාණාත්මක පර්යේෂණ තරඟයක්" වාර්ෂිකව පැවැත්වීමෙන් ශ්‍රී ලංකාවේ ජනතාව අතර නව නිපැයුම් කිරීම, නිර්මාණශීලීත්වය වැඩි දියුණු කිරීම, ඊට ධෛර්ය දීම සහ කෘෂිකර්මය, රසායන විද්‍යාව, වෛද්‍ය විද්‍යාව ආදී වූ විද්‍යාත්මක හා තාක්ෂණ විද්‍යාත්මක ක්ෂේත්‍රවල නව නිපැයුම් නිර්මිත කිරීමට ඔවුන්ට සහාය දීම.

- නව නිපැයුම් සහ පර්යේෂණ පිළිබඳවත් පොදුවේ විද්‍යාව පිළිබඳවත් තොරතුරු පළකිරීම සහ පතල කර හැරීම

- නව නිපැයුම් සහ පර්යේෂණ සඳහා පැවැත්වෙන අන්තර්ජාතික තරඟවලට සහභාගීවීමට ශ්‍රී ලාංකික නව නිපැයුම්කරුවන්ට උපකාරීවීම හෝ එවැනි තරඟවලට ඔවුන් නිර්දේශ කිරීම.

- ශ්‍රී ලාංකික යෞවනයන් අතර නිර්මාණශීලීත්වය වැඩිදියුණු කිරීම සහ ඊට ධෛර්යදීම සඳහා පාසල්වල, විශ්වවිද්‍යාල වල නව නිපැයුම් සමාජ ඇති කිරීම.

12.3. 2024 වර්ෂයේ ජයග්‍රහණයන්

- දේශීය නව නිපැයුම් සඳහා පිදෙන ජනාධිපති සම්මාන (2017 සිට 2020 වර්ෂය දක්වා)

  අතිගරු ජනාධිපතිතුමන් විසින් අනුමත කරනු ලබන විනිශ්චය මණ්ඩලයක් හරහා මෙම සියළුම නව නිපැයුම් විනිශ්චය කෙරෙන අතර, සෑම විෂයයක්ම අන්තර්ගත වන පරිදි සැකසුනු තාක්ෂණික ක්ෂේත්‍ර 14ක් ඔස්සේ, තිදෙනා බැගින් සමන්විත විනිශ්චය මණ්ඩල 14ක මෙහෙයවීම මත නව නිපැයුම් ඇගයීම සිදු කරනු ලබයි.

  වර්ෂ 2017 සිට 2020 දක්වා වූ කාලරාමුව තුල පේටන්ට් ලාභී නව නිපැයුම් වෙනුවෙන් 2024 වසරේදී ජනාධිපති සම්මාන පිරිනමන ලදී. මෙම කාල සීමාව තුළ රන් සම්මාන 10ක්, රිදී සම්මාන 44ක්, ලෝකඩ සම්මාන 19ක් මෙන්ම කුසලතා සම්මාන 43ක් ප්‍රදානය කෙරිනි.

- මාර්ග භාවිතා කරන්නන්ගේ ආරක්ෂාව තහවුරු කිරීම සඳහා දේශීය නව නිපැයුම් සහ නවෝත්පාදන උපයෝගී කර ගැනීම සඳහා මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව සහ ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම ඒකාබද්ධව දියත් කරන ලද ව්‍යාපෘතිය

  අයදුම්පත් පත් කැඳවීමේදී නිර්මාණ 64 සඳහා අයදුම්පත් ලැබුණු අතර එයින් නිර්මාණ 22ක් සඳහා තාක්ෂණික සහාය ලබාදීම් ප්‍රායෝගික භාවිතයන් සඳහා යොදාගැනීම, ක්ෂේත්‍ර පරීක්ෂාවක් සහ වානිජකරණ සහායන් සඳහා නිර්දේශ විය.

- දකුණු පළාත තුළ නව නිපැයුම් සහ නවෝත්පාදන ප්‍රවර්ධනය සඳහා වන ඒකාබද්ධ ප්‍රවේශය

  ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම, දකුණු පළාත් කර්මාන්ත අමාත්‍යාංශය, දකුණු පළාත් කාර්මික සංවර්ධන අධිකාරිය, රුහුණු විශ්වවිද්‍යාලයේ බීජෞෂණාගාර මධ්‍යස්ථානය, දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය, දකුණු පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මෙම ක්‍රමවේදය මෙහෙයවීමේ මූලික ආයතන ලෙස රජයේ මූල්‍ය සහ නීති රීති සහ ක්‍රමවේදයන්ට අනුව ක්‍රියාත්මක කරනු ලැබේ. මෙම ව්‍යාපෘති යෝජනාව යටතේ, ආයතනවල ඒකාබද්ධ අවබෝධතා ගිවිසුම කෙටුම්පත් කර අවසාන වී ඇති අතර ගිවිසුම් අත්සන් කිරීමට නියමිත වේ.

  දකුණු පළාත තුළ ක්‍රියාකාරී ආකෘති වැඩිදුර සංවර්ධනයට සහ වාණිජකරණය සඳහා අවශ්‍යතාවය හඳුනාගන්නා නව නිපැයුම් සහ නවෝත්පාදන මෙම වැඩසටහන යටතේ ප්‍රවර්ධනය කෙරේ. එමගින් ශ්‍රී ලාංකේය ආර්ථිකය නඟා සිටුවීමට සහ ඉලක්කගත ක්ෂේත්‍ර වල දීර්ඝකාලීන පැවැත්ම තහවුරු කර ගැනීම සමාජ සාධාරණත්වය සහ පරිසර ගුණාත්මක බව තහවුරු කිරීමට බලාපොරොත්තු වේ.

- නව නිපැයුම් වාණිජකරණය සඳහා සහාය දක්වන ණය සඳහා වන INNOVABIZ පොළී සහන ව්‍යාපෘතිය

  නව නිපැයුම් වාණිජකරණයට, නව නිපැයුම්කරුවන් විසින් බැංකුවකින් ලබා ගන්නා ණය සඳහා වන පොළියෙන් කොටසක් වර්ෂ 5ක සහ රු. මිලියනක උපරිමයකට යටත්ව ප්‍රතිපූර්ණය කිරීම් සිදු කරයි. ඒ අනුව පේටන්ට් බලපත්‍ර ඇති නව නිපැයුම් සඳහා මාසික වාරිකයේ පොළිය කොටසින් 75%ක උපරිමයකට ද පේටන්ට් බලපත්‍ර සඳහා අයදුම්කර ඇති නමුත් බලපත්‍ර මේ වන විට නිකුත් වී නැති නව නිපැයුම් සඳහා එම අගය 37.5% ලෙසද ප්‍රතිපූර්ණය කෙරේ. මෙම ව්‍යාපෘතිය යටතේ නව නිපැයුම් වාණිජ්‍යකරණය අභිප්‍රේරණය වීමත්, පේටන්ට් ලබා ගැනීම ප්‍රවර්ධනය වීමත් සිදු කෙරේ.

- නව නිපැයුම්කරුවන් සඳහාම විශේෂිත වූ හැඳුනුම්පත්

නව නිපැයුම්කරුවන් සඳහා ජනතාව අතර සුවිශේෂීත්වයක් නිර්මාණය කිරීම වෙනුවෙන් විශේෂ නිර්ණායකයන්ට අනුකූලව, කාණ්ඩ 05ක් යටතේ මෙම හැඳුනුම්පත නිකුත් කරනු ලබයි. ඒ අනුව මෙම වසර තුල මේ දක්වා හැඳුනුම්පත් 48ක් ලබාදීමට කටයුතු සම්පාදනය කෙරිණි.

12.4. කාර්යසාධනය

I. ගොනු කරන ලද/ ලබාගත් පේටන්ට් බලපත්‍ර / වානිජකරණය සඳහා සහාය

ක්ෂේත්‍රය	ආකාරය	2023 වර්ෂය		2024 වර්ෂය	
		ඉලක්කය	ප්‍රගතිය	ඉලක්කය	ප්‍රගතිය
සෑම ක්ෂේත්‍රයක්ම ආවරණය වේ.	තාක්ෂණික සහාය දැක්වීම/ වානිජකරණය සඳහා සහාය	10/10	13/14	12/05	40/16
	මූල්‍ය සහාය දැක්වීම/ වානිජකරණය සඳහා සහාය	-	-	-	-/02

II. විද්‍යාව ප්‍රචලිත කිරීම

ප්‍රචලිත කිරීමේ ක්‍රමවේදය	2023 වැඩසටහන්			2024 වැඩසටහන්		
	ඉලක්කය	නිම කළ	ප්‍රතිලාභීන්	ඉලක්කය	නිම කළ	ප්‍රතිලාභීන්
දේශන	15	18	2000	15	28	6621
වැඩමුළු	4	7	180	3	8	440

III. නව නිපැයුම් හා නවෝත්පාදන ප්‍රවර්ධනය

ක්ෂේත්‍රය	2023 නව නිපැයුම් හා නවෝත්පාදන			2024 නව නිපැයුම් හා නවෝත්පාදන		
	ඉලක්කය	ප්‍රගතිය	කර්මාන්ත හා සබැඳි සංඛ්‍යාව	ඉලක්කය	ප්‍රගතිය	කර්මාන්ත හා සබැඳි සංඛ්‍යාව
හඳුනාගත් තාක්ෂණික ක්ෂේත්‍ර14. *	15	24	2	15	32	04
* 1)මහජන ආරක්ෂාව, සුඛසාධනය හා ජාතික ආරක්ෂාව 2) වෛද්‍ය විද්‍යාව හා ඖෂධවේදය 3) පොදු කර්මාන්ත 4) තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය5) ව්‍යවහාරික විද්‍යා හා තාක්ෂණ 6) ආහාර තාක්ෂණය 7) පරිසර සංරක්ෂණය8) රසායන විද්‍යාව 9) සාම්ප්‍රදායික වෛද්‍ය විද්‍යාව 10) භෞතික විද්‍යාව 11) කෘෂිකර්මය 12) බලශක්තිය 13) ප්‍රවාහන 14) ඉංජිනේරු						

12.5. 2025 වර්ෂය සඳහා ඉලක්ක

- දකුණු පළාතෙන් වාණිජකරණය වූ නව නිපැයුම්10 ක් වෙළඳපොල ට හඳුන්වා දීම
- INNOVABIZ පොළී සහන ව්‍යාපෘතිය, 2024 ප්‍රගතිය සමාලෝචනය කර 2025 වර්ෂයට ද ක්‍රියාත්මක කිරීම
- "සහසක් නිමැවුම්" අන්තර්ජාතික නව නිපැයුම් හා නවෝත්පාදන ප්‍රදර්ශනය සහ තරඟය පැවැත්වීම
- නව නිපැයුම් සඳහා ආරම්භක ව්‍යාපාර අවස්ථා බිහි කිරීමේ වැඩසටහන එළැඹෙන වසරේ දී පුළුල්ව ක්‍රියාත්මක කිරීම සහ කර්මාන්ත ක්ෂේත්‍රයේ තාක්ෂණික ගැටළුවලට නවෝත්පාදන සහාය ලබාදීමේ වැඩසටහන යටතේ කර්මාන්තයේ ගුණාත්මකභාවය ඉහළ නැංවෙන නව වැඩසටහන් ක්‍රියාවට නැංවීම
- පාසල්, විශ්වවිද්‍යාල හා තෘතියික අධ්‍යාපන ආයතන තුල නව නිපැයුම් සමාජ ස්ථාපිත කිරීමේ වැඩසටහන පුළුල් කිරීම "Inventor Champs" නවෝත්පාදන රියැලිටි වැඩසටහන හරහා පාසල් සිසුන්ගේ නවෝත්පාදන හැකියාවන් හා දැනුම ඉහළ නැංවීමට කටයුතු කිරීම
- ජාත්‍යන්තර නව නිපැයුම් තරඟ සඳහා සහභාගීවීමේ අවස්ථාව හා ඉන් ප්‍රතිලාභ නව නිපැයුම්කරුවන්ට හිමි කර දීමට කටයුතු කිරීම, බුද්ධිමය දේපළ අයිතිය සුරක්ෂිත කර ගැනීම සඳහා නව නිපැයුම්කරුවන්ට මඟ පෙන්වන වැඩමුළු පැවැත්වීම හා එම සේවා තවදුරටත් පුළුල් කිරීම
- 2021 හා 2022 වර්ෂයන් වෙනුවෙන් නවනිපැයුම් සඳහා ජනාධිපති සම්මාන පිරිනැමීමට කටයුතු යෙදීම

13. සී/ස ශ්‍රී ලංකා නිනිති තාක්ෂණ ආයතනය (පෞද්) සමාගම (SLINTEC)

13.1. හැඳින්වීම

සී/ස ශ්‍රී ලංකා නිනිතිතාක්ෂණ ආයතනය (පෞද්) සමාගම (SLINTEC) 2009 වසරේදී ශ්‍රී ලංකා රජයේ කැබිනට් පත්‍රිකාවක් යටතේ ස්ථාපනය කරනු ලැබූ අතර විද්‍යා, තාක්ෂණ සහ පර්යේෂණ අමාත්‍යාංශයේ සහ ප්‍රමුඛ පෙළේ ශ්‍රී ලාංකීය සමාගම් අතර ඇතිකර ගනු ලැබූ ප්‍රථම රාජ්‍ය-පෞද්ගලික සහයෝගීතාවයද මෙය වේ. මෙම සමාගම් වනුයේ MAS හෝල්ඩින්ග්ස් සී/ස,බ්‍රැන්ඩික්ස් ලංකා සමාගම, සී/ස කැම්සෝ ලෝඩ්ස්ටාර් (පෞද්) සමාගම, ඩයලොග් ඇක්ෂියාටා, හේලීස් PLC, ලංකෙම් සිලෝන් PLC, බ්‍රවුන්ස් PLC සහ LOLC PLC යන සමාගම්ය. 2011 මාර්තු 31 දින SLINTEC ආයතනය සී/ස NANCO (පෞද්) සමාගම සමඟ ඒකාබද්ධ කරනු ලැබූ අතර එලෙස සංයුක්ත කරනු ලැබූ සමාගම සී/ස NANCO (පෞද්) සමාගම යන නාමය යටතේ ස්ථාපනය කරනු ලැබ පසු කලකදී සී/ස ශ්‍රී ලංකා නිනිති තාක්ෂණ ආයතනය (පෞද්) සමාගම (SLINTEC) ලෙස නැවත නම් කරනු ලැබිණ.

දැක්ම

නවෝත්පාදනයෙන් ක්ෂිතිජයෙන් ඔබ්බට

මෙහෙවර

අපගේ දිවි පෙවෙතෙහි වෙනස්කම් ඇති කිරීමට සමත් නිෂ්පාදනයන් සොයාගැනීමේ සහ ඒවා වැඩි දියුණු කිරීමේ අපගේ ප්‍රයත්නයෙහිදී විශිෂ්ට චින්තනයන් සහ විශිෂ්ට තාක්ෂනයන් එක් කිරීම හරහා රටෙහි නිනිති තාක්ෂණ පර්යේෂණ ක්ෂේත්‍රයේ ප්‍රගමනය උදෙසා ප්‍රධාන කාර්යභාරයක් ඉටුකිරීම

13.2. ආයතනයෙහි කාර්යයන්

1. නිනිති සහ උසස් තාක්ෂණයන් පිළිබඳ විශේෂිතව ගෝලීය මට්ටමේ පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානයක් ගොඩනැගීම
2. නිනිති සහ උසස් තාක්ෂනයන් භාවිතයෙන් නිෂ්පාදන වඩා තරඟකාරී කරවීම
3. නිනිති තාක්ෂණය සමඟ ඛනිජ එක්කිරීම තුලින් ලැබෙන ප්‍රතිලාභ ප්‍රදර්ශනය කිරීම හරහා ශ්‍රී ලංකාවේ ඛනිජ සම්පත් සඳහා අගයන් එක්කිරීම
4. පර්යේෂණ,සංවර්ධන සහ වානිජකරණය සඳහා නිනිතිතාක්ෂණ සහ විද්‍යා උද්‍යානයක් නිර්මාණය සහ කළමනාකරණය

13.3. 2024 වර්ෂයේදී ලද ජයග්‍රහණ

මෙහෙවර හා බැඳුණු පර්යේෂණ

සමාලෝචිත කාල පරිච්ඡේදය තුල බාහිර අරමුදල් ඇසුරෙන් ක්‍රියාත්මක කරනු ලැබූ ව්‍යාපෘතීන්හි වත්මන් තත්ත්වය පහතින් දක්වා ඇත.

ව්‍යාපෘති නාමය	අරමුදල් සපයන ආයතනය	ව්‍යාපෘතිය සඳහා වැයවන වියදම (රු.මි.)	වත්මන් තත්ත්වය
දේශීය			
කර්මාන්ත අංශයේ යෙදීම් සඳහා කොහු කෙඳි වලින් නිස්සාරණය කරන ලද ලිග්නින් ඩයි	කර්මාන්ත අංශය	10	2022 දී දියත් කරන ලද ලිග්නින් මත පදනම් වූ ස්වාභාවික සායම් ව්‍යාපෘතිය මේ වනවිට සම්පූර්ණ කර ඇති අතර තාක්ෂණය පවරාදීම සඳහා

			සිදුකෙරෙන සාකච්ඡා අවසන් අදියරේ පවතී.
රෙදිපිළි යෙදුම් සඳහා ස්වභාවික ඩයි වර්ග - ක්ෂුද්‍ර ජීවී	කර්මාන්ත අංශය	5	දැනට සිදුකෙරෙමින් පවතී
තෝරාගත් යෙදුම් සඳහා සංවේදක ද්‍රව්‍ය සංවර්ධනය කිරීම	විදේශීය /දේශීය	10	සිදුකෙරෙමින් පවතී
මෙහෙවර පදනම් කරගත් කාණ්ඩය යටතේ ව්‍යාපෘති යෝජනා දහඅටක්	ශ්‍රී ලංකා රජය	75	දැනට සිදුකෙරෙමින් පවතී (2025 ක්‍රියාකාරී සැලැස්ම හරහා අයවැය අනුමත කර ගැනෙනු ඇත.)
ටයර් නිෂ්පාදනයේදී 6PPD සඳහා විකල්පයක් ලෙස ස්වභාවික සහ කෘතිම ප්‍රතිඔක්සිකාරක පිළිබඳ සොයා බැලීම	කර්මාන්ත අංශය	10	දැනට සිදුකෙරෙමින් පවතී
සමුද්‍ර පරිසරයේ යෙදීම් සඳහා සාම්ප්‍රදායික ආලේපනයන්හි ප්‍රති-විබාදන ගුණ වැඩි දියුණු කිරීම.	කර්මාන්ත අංශය	10	දැනට සිදුකෙරෙමින් පවතී
ජාත්‍යන්තර			
ආර්ථික වශයෙන් අඩු සංවර්ධනයක් සහිත රටවල ආහාර සුරක්ෂිතතාව සහ තිරසර සංවර්ධනය යටපත් කිරීමේ හැකියාවක් කෘෂිකාර්මික ක්ෂුද්‍ර ප්ලාස්ටික් වලට පවතීද?	NERC/ GCRF	බ්‍රිතාන්‍ය පවුම් 96,329.02 (SLINTEC)	මෙම ව්‍යාපෘතිය 2025 වර්ෂයේ අවසන් කිරීමට නියමිතව ඇත.
ඉලෙක්ට්‍රොනික ක්ෂේත්‍රයේ ග්‍රැෆීන් යෙදුම් , වෛද්‍ය උපාංග, EV බැටරි, ජල පිරිපහදුව, කෘෂිකර්මය, ද්‍රව්‍ය විද්‍යාව සහ බලශක්තිය	විදේශ/ අබුඩාබි විශ්වවිද්‍යාලය	50	දැනට සිදුකෙරෙමින් පවතී

ගිවිසුම්ගත පර්යේෂණ

- **තැඹිලි ලෙලි අපද්‍රව්‍ය මගින් ස්වභාවික සායම් වර්ග නිපදවීම**

තැඹිලි ලෙලි අපද්‍රව්‍යවලින් ස්වාභාවික සායම් නිස්සාරණ ක්‍රමයක් වැඩිදියුණු කිරීම සඳහා වන මාස තුනක කෙටි කාලීන ව්‍යාපෘතියක පර්යේෂණ අදියර කර්මාන්ත අංශයේ සහයෝගීතාව යටතේ සාර්ථකව නිම කර ඇත. කුඩා පරිමානයේ අත්හදා බැලීම් දෙක තුනකින් පසුව එය තාක්ෂණ පැවරුම් කණ්ඩායම වෙත භාර දී ඇත.

- **පාම් ඔයිල් කර්මාන්තයේ අපද්‍රව්‍ය වලින් තිරසාර ස්වභාවික රෙදි සායම් සංවර්ධනය කිරීම**

ඛනිජ රසායනික ප්‍රභවයන්ගෙන් ලබාගැනෙන කෘත්‍රිම ඩයි වර්ගයන්හි බොහෝ විට පිළිකා කාරක අඩංගු වන අතර, ඒ හරහා රෙදිපිළි හේතුවෙන් සෞඛ්‍ය අවදානමක් නිර්මාණය වී ඇත. කෘෂිකාර්මික අපද්‍රව්‍යවලින් ලබා ගැනෙන ස්වභාවික ඩයි වර්ග වැනි පරිසර හිතකාමී විකල්ප සඳහා ඇති ඉල්ලුම වැඩි වීමට මෙය හේතු වී ඇත. 2022 මැයි මාසයේදී SLINTEC ආයතනය, කර්මාන්ත අංශය සමඟ එක්ව අපද්‍රව්‍ය වලින් නව ස්වභාවික සායම් නිපදවීම අරමුණු කර ගනිමින් පර්යේෂණ දියත් කරන ලදී. 2024 වර්ෂයේදී, මෙම ව්‍යාපෘතිය පාම් ඔයිල් කර්මාන්තයේ අපද්‍රව්‍ය ඇසුරෙන් තිරසාර සායම් වර්ග වැඩිදියුණු කිරීම කෙරෙහි අවධානය යොමු කරමින් නව අදියරකට අවතීර්ණ විය. මෙම අදියර කුඩා සහ තොග අත්හදා බැලීම් කිහිපයකින් සාර්ථකව අවසන් වූ අතර, ව්‍යාපෘතිය තාක්ෂණ පැවරුම් කණ්ඩායම වෙත පවරා දී ඇත.

- **ක්ෂුද්‍ර ජීවී පොහොර සංවර්ධනය**

සී/ස ෆාර්මර්ස් ෆර්ටිලයිසර් (පෞද්) සමාගම යනු ශ්‍රී ලංකා රජයේ කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ පවතින පොහොර ලේකම් කාර්යාලයට කාබනික පොහොර සපයන ලියාපදිංචි ආයතනයකි. හිතකර ක්ෂුද්‍ර ජීවීන් ඇතුළත් කිරීමෙන් පොහොර කාර්යක්ෂමතාව ඉහළ නැංවීමේ ව්‍යාපෘතියක් 2022 නොවැම්බර් මසදී SLINTEC විසින් දියත් කරන ලදී. ව්‍යාපෘතිය 2024 වර්ෂයේදී සාර්ථකව නිම කරන ලද අතර එය තාක්ෂණ පැවරුම් කණ්ඩායම වෙත භාර දී ඇත.

- **දුම්රිය තිරිංග කුට්ටි සඳහා බහු අවයවික සංයෝගයක් සංවර්ධනය කිරීම**

දුම්රිය තිරිංග සපත්තු (තිරිංග කුට්ටි) සඳහා බහු අවයවික සංයෝගයක් සංවර්ධනය කිරීම සඳහා 2024 වර්ෂයේදී දියත් කරන ලද සංයෝග සම්පාදනය කිරීමේ ව්‍යාපෘතියේ පර්යේෂණ අදියර සාර්ථකව නිම කර ඇති අතර මේ වන විට තාක්ෂණ පැවරුම් කණ්ඩායම වෙත භාර දී ඇත.

- **ජලජීවී වගාව සඳහා මුහුදු ලුණු සංවර්ධනය**

රතු මුහුදු ලුණු පරාමිතීන් වලට ගැලපෙන මුහුදු ලුණු වර්ගයක් නිර්මාණය කිරීම අරමුණු කරගත්, ජලජීවී වගාව සඳහා වන මුහුදු ලුණු සංවර්ධන ව්‍යාපෘතිය සාර්ථකව නිම කර තාක්ෂණ හුවමාරු කණ්ඩායම වෙත පවරා දී ඇත.

- **බිම් ඇතුරුම් සඳහා ජලප්‍රතිරෝධී සහ ඉරිතැලීම්-ප්‍රතිරෝධී විකල්ප සිමෙන්ති ආලේපනයක් වැඩිදියුණු කිරීම**

බිම් ඇතුරුම් සඳහා ජලප්‍රතිරෝධී , ඉරිතැලීම්-ප්‍රතිරෝධී විකල්ප සිමෙන්ති ආලේපනයක් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතියේ පර්යේෂණ අදියර 2024 වර්ෂයේදී සාර්ථකව නිම කළ අතර මේ වනවිට තොග අත්හදා බැලීම් සහ තාක්ෂණය පවරාදීම සම්බන්ධ සාකච්ඡා සිදු කෙරෙමින් පවතී.

- **කැල්සියම් කාබනේට් නවීකරණය කිරීම**

කැල්සියම් කාබනේට් නවීකරණය කිරීමේ ව්‍යාපෘතිය හරහා වර්ණක ශ්‍රේණියේ TiO2 හා සැසඳිය හැකි ඉහළ වර්තනාංකයක් සහිතව $CaCO_3$ සංවර්ධනය කිරීම අරමුණු කරයි. අවසන් ව්‍යාපෘති සමාලෝචනය සහ තාක්ෂණ පැවරුම් සාකච්ඡා මේ වන විට සිදුවෙමින් පවතී.

- **ශාක සාර අතුරු නිෂ්පාදන වලින් ස්වභාවික සායම් වර්ග නිපදවීම**

දැනට ක්‍රියාත්මකව පවතින මෙම ව්‍යාපෘතියේ අරමුණ වන්නේ ශාක නිස්සාරණ කර්මාන්තයේ අතුරු නිෂ්පාදන ඇසුරෙන් ප්‍රශස්ත වර්ණ නිස්සාරණ පරාමිතීන් සහිත ස්වභාවික සායම් සංයෝගයක මූලාකෘතියක් සැකසීමයි. මෙම සායම් සංයෝගය, සම්මත සායම් කිරීමේ ක්‍රියාපටිපාටිය අනුගමනය කරමින් 100% කපු රෙදි මත යෙදීම සඳහා නිර්මාණය කර ඇත. 2024 දෙසැම්බර් මස වන විට අවසාන සන්ධිස්ථාන ද්විත්වය සම්පූර්ණ කිරීමට ඉලක්ක කර ඇති අතර ව්‍යාපෘතිය සැලසුම් කළ පරිදි ඉදිරියට ක්‍රියාත්මකව පවතී.

- **සමාලෝචනයට භාජනය වන කාල සීමාව තුළ (2024) ආරම්භ කරන ලද ගිවිසුම්ගත ව්‍යාපෘති**

ව්‍යාපෘති නාමය	සේවාලාභියා	මුදල
දැනට ක්‍රියාත්මකව පවතින පර්යේෂණ		
රෙදි සඳහා ස්වයං-ඇලවුම් රෙදි කැබලි වැඩිදියුණු කිරීම	කර්මාන්ත අංශයේ හවුල්කරු	මුළු ව්‍යාපෘති පර්යේෂණ වටිනාකම ආසන්න වශයෙන් රු.මිලියන 15ක් පමණ වේ.
රුධිර සීනි නියාමනය කිරීමේ ක්‍රමවේදයක් හඳුනා ගැනීම		
ශාක අපද්‍රව්‍ය ඇසුරෙන් තිරසාර ස්වභාවික ඩයි වර්ග සංවර්ධනය කිරීම		
රන් නැනෝ අංශු වල නව හරිත සංශ්ලේෂණය		

ආහාරයට ගත හැකි තීන්ත ද්‍රව්‍ය සංවර්ධනය	කර්මාන්ත අංශයේ හවුල්කරු	
වාණිජමය ශක්‍යතාවකින් යුතු යෙදුම් සඳහා ඇනෝඩීකරණය කළ ඇලුමිනියම් අපද්‍රව්‍ය භාවිතය		
සංවර්ධන ව්‍යාපෘති		
පැසුණු හිසකෙස් ආවරණය සඳහා ශාක ආශ්‍රිත කළු හිසකෙස් සායම් සංවර්ධනය කිරීම	කර්මාන්ත අංශයේ හවුල්කරු	ආසන්න වශයෙන් රු.මිලියන 15ක් පමණ වේ.
පුද්ගලික අංශයේ කර්මාන්ත තුළ සිටින ගනුදෙනුකරුවන් සඳහා ශක්‍යතා අධ්‍යයනයක් සිදු කිරීම සහ නව පර්යේෂණ ව්‍යාපෘති 10ක් දියත් කිරීම පිළිබඳ සාකච්ඡාවක් දැනට ක්‍රියාත්මකව පවතී.		ශක්‍යතා අධ්‍යයනය සඳහා සේවාලාභීන් සම්බන්ධ වීමේ ගාස්තුව රුපියල් 250,000 කි. ආසන්න වශයෙන් රුපියල් මිලියන 2.5 කි

උපදේශන සහ විශ්ලේෂණ සේවා

උපදේශන සේවා

- බීම වර්ග, ඇඟලුම් හා අනෙකුත් අංශ ඇතුළු විවිධ අපනයන කර්මාන්ත සම්බන්ධයෙන් පැන නැඟ ඇති රසායනික ද්‍රව්‍ය ඇසුරින් අපවිත්‍ර වීම් පිළිබඳ ගැටළු නිරාකරණය කිරීම සඳහා කුඩා පරිමාණයේ ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ලදී.
- තේ සංඝටක විශ්ලේෂණ ව්‍යාපෘතිය - මුළු ආදායම වශයෙන් රු.මිලියන 12ක මුදලක් උපයා ගැනීමේ අපේක්ෂාවෙන් තේ සාම්පල 1,000ක් හරහා සංයෝග 23ක් විශ්ලේෂණය කිරීම සඳහා ගිවිසුමකට එළැඹ ඇත. මෙම ව්‍යාපෘතිය සඳහා සේවාදායකයා විසින් රුපියල් මිලියන 5 ක මූලික අත්තිකාරම් මුදලක් ගෙවා ඇත.
- එක්ව ඖෂධ ආරක්ෂාව උදෙසා මූලිකත්වය ගැනීම : සියල්ලන් සඳහා කාලෝචිත සහ උසස් ආරක්ෂක ප්‍රමිතීන් සහතික කරමින් ඖෂධ පරීක්ෂණ ක්‍රියාවලීන් විධිමත් කරනු පිණිස NMRA සමඟ හවුල්කාරීත්වයක් ස්ථාපනය කර ගැනීමට SLINTEC විසින් කටයුතු කර ඇත. මෙම හවුල්කාරීත්වය හරහා ඖෂධ කර්මාන්තයේ ප්‍රමාදයන් අවම කර ගුණාත්මක භාවය ඉහළ නැංවීමේ වැදගත් ඉදිරි පියවරක් සනිටුහන් කෙරේ.

- **ප්‍රතීතන වැඩසටහන**
  BESPA-FOOD PROJECT - ප්‍රතීතන සූදානම වැඩසටහනේ කොටසක් ලෙස SLINTEC හි උසස් විශ්ලේෂණ සේවා රසායනාගාරය UNIDO විසින් තෝරාගෙන ඇත. මෙම මූලාරම්භය හරහා, සැලකිය යුතු ඉල්ලුමක් සපුරාලමින්, තෝරාගත් ආහාර පරීක්ෂණ සේවා සඳහා SLAB ප්‍රතීතනය ලබා ගැනීමට ISO 17025 රසායනාගාර තත්ත්ව කළමනාකරණ පද්ධතිය ක්‍රියාත්මක කරන්නෙමු.

  2024 ඔක්තෝබර් 31 වැනි දින ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයට (SLAB) අපගේ අයදුම්පත ඉදිරිපත් කළෙමු. ප්‍රතීතනයේ සවිස්තරාත්මක විෂය පථය පහත දැක්වේ.

	නිෂ්පාදනය /පරීක්ෂාවට ලක් කෙරෙන ද්‍රව්‍යය	**සිදුකරන ලද නිශ්චිත පරීක්ෂණ**
01.	තෙල් සහ කුළුබඩු	Aflatoxin B1 and G1
		Aflatoxin B2 and G2

02.	මේද සහ තෙල්	Phthalate (DMP/ DEHP/ DBP/ DNOP DIDP/ DINP)
03.	බීම වර්ග	Phthalate (DMP/ DEHP/ DBP/ DNOP DIDP/ DINP)
04.	කිරි සහ රසකැවිලි නිෂ්පාදන	ලුණු
05.	රසකැවිලි සහ ඝන කිරි නිෂ්පාදන	මේද
06.	කිරි සහ කිරි නිෂ්පාදන	සමස්ත සීනි
07.	රසකැවිලි නිෂ්පාදන	සමස්ත සීනි

විශ්ලේෂණ සේවාවන් 2024	**සේවාදායකයින් සංඛ්‍යාව**	**ආදායම (රු.මිලි.)**
කර්මාන්ත, විශ්වවිද්‍යාල සහ පර්යේෂණ ආයතන	450	25.5

13.4. කාර්යසාධනය

I. පර්යේෂණ සහ සංවර්ධන

පර්යේෂණ ව්‍යාපෘති නවයක් සාර්ථකව නිම කර ඇති අතර, ව්‍යාපෘති හතරක් දැනටමත් වාණිජකරණය කර ඇත. ඉතිරි ව්‍යාපෘති හතර වාණිජකරණය සඳහා සාකච්ඡාවන් සිදු කෙරෙමින් පවතී.

II. තාක්ෂණ පැවරුම් / වාණිජකරණය

SLINTEC විසින් පහත නිෂ්පාදන වාණිජකරණයෙන් රු.මිලියන **76.6**ක් උත්පාදනය කර ගනු ලැබ ඇත : තැඹිලි වලින් ස්වභාවික සායම් නිස්සාරණය, පාම් ඔයිල් අපද්‍රව්‍ය ඇසුරෙන් ස්වාභාවික සායම්, ජලජීවී වගාව සඳහා මුහුදු ලුණු සංවර්ධනය සහ ජෛව හායනයට ලක්විය හැකි ඇසුරුම් ද්‍රව්‍ය සකස් කිරීම

III. පේටන්ට් බලපත්‍ර

2024 වර්ෂය තුළදී, රෙදිපිළි, රූපලාවන්‍ය ද්‍රව්‍ය සහ ද්‍රව්‍ය විද්‍යාව යන ක්ෂේත්‍ර ආවරණය කරමින් පේටන්ට් බලපත්‍ර **06** ක් මූලිකව දේශීය වශයෙන් ගොනු කරන ලද අතර අතර, එක් පේටන්ට් බලපත්‍රයක් ජාත්‍යන්තරව ගොනු කරන ලදී.

IV. විද්‍යාව ප්‍රචලිතකිරීමේ වැඩසටහන්

ප්‍රචලිත කිරීමේ ක්‍රමය	**2023**			**2024**		
	ඉලක්කගත	**සම්පූර්ණ**	**ප්‍රතිලාභීන් සංඛ්‍යාව**	**ඉලක්කගත**	**සම්පූර්ණ**	**ප්‍රතිලාභීන් සංඛ්‍යාව**
දේශන/වැඩමුළු	4	3	1000	4	5	>3000
ප්‍රදර්ශන	1	1	6000	1	3	> 5000

V. විද්‍යාත්මක ප්‍රකාශන

අංක	වර්ගය	2023 ප්‍රකාශන සංඛ්‍යාව		2024 ප්‍රකාශන සංඛ්‍යාව	
		ඉලක්කගත	ප්‍රකාශිත	ඉලක්කගත	ප්‍රකාශිත
1	පොත් සහ පොත් පරිච්ඡේද	15	3	15	12
2	ජර්නල ලිපි (සුවිගත)		6		
5	සාරාංශ (සම්මන්ත්‍රණ,රැස්වීම් කටයුතු)		6		

VI. වෙනත් විශේෂ වැඩසටහන්

- Intex Sri Lanka 2024 සඳහා සහභාගීත්වය: Worldex India Exhibition & Promotion Pvt Ltd විසින් සංවිධානය කරන ලද 2024 අගෝස්තු 7-9 දක්වා BMICH හි පැවති ප්‍රමුඛතම ජාත්‍යන්තර රෙදිපිළි ප්‍රදර්ශනයේදී SLINTEC විසින් රෙදිපිළි නවෝත්පාදනයන් ප්‍රදර්ශනය කරන ලදී.
- Green Legacy සහ LEED සහතිකය: SLINTEC විසින්, 2024 සැප්තැම්බර් 5 වන දින USGBC සහ GBCI විසින් කොළඹ ITC රත්නදීප හිදී පවත්වන ලද "LEED in Sri Lanka" උළෙලේදී තිරසර ඉදිකිරීම් පිළිවෙත් සඳහා සිය කැපවීම නැවත තහවුරු කරමින් පාරිසරික නවෝත්පාදන ක්ෂේත්‍රයේ සිය ගමන්මග ඉස්මතුකර පෙන්වන ලදී.
- Industry Expo 2024: SLINTEC විසින් කාර්මික සංවර්ධන මණ්ඩලය විසින් සංවිධානය කරනු ලැබ 2024 ජුනි 19-23 දක්වා, BMICH හිදී පැවති ජාත්‍යන්තර කර්මාන්ත ප්‍රදර්ශනය 2024 සඳහා පර්යේෂණ සහ සංවර්ධන ඉදිරිපත් කරන ලදී.
- නව්‍ය අදහස් උත්පාදක සැසිය : SLINTEC විසින් නව්‍ය පර්යේෂණ අදහස් සහ අරමුදල් සපයාගැනීමේ අවස්ථා සාකච්ඡා කිරීම සඳහා ව්‍යවසායකයින්, කර්මාන්ත අංශයේ නායකයින් සහ සිසුන් එක්රැස් කරමින් 2024 ජුලි 11 වන දින NSF ශ්‍රවණාගාරයේදී නව්‍ය අදහස් උත්පාදක සැසියක් පවත්වන ලදී.
- කෘෂිකාර්මික නවෝත්පාදන විවෘත සංසදය: SLINTEC විසින් කර්මාන්තකරුවන්, ව්‍යවසායකයින් සහ උපාධිධාරීන් අතර සහයෝගීතාව වර්ධනය කිරීම අරමුණු කර ගනිමින්, කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රගතිය කෙරෙහි අවධානය යොමු කරමින්, 2024 මැයි 17 දින අන්තර් ක්‍රියාකාරී සැසියක් පැවැත්විනි.
- Nanotechnology Knowledge Hub පාඨමාලා: SLINTEC විසින් 2024 මැයි සහ නොවැම්බර් මාසවලදී නිනිති තාක්‍ෂණය පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලා දෙකක් පවත්වන ලද අතර, සිසුන් 60 කට අධික සංඛ්‍යාවක් සඳහා ප්‍රායෝගික රසායනාගාර අත්දැකීම් සහිත පුහුණුව ලබාදෙන ලදී.
- Global Graphene සහයෝගිතාව: SLINTEC විසින් අබුඩාබි විශ්වවිද්‍යාලය සහ Inovartic Investment ආයතනය සමඟ හවුල්කාරීත්වයෙන්, ශ්‍රී ලංකා සහ එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ ප්‍රභූවරුන්ගේ සහාය යටතේ ADIPEC 2024 හිදී ADU Graphene මධ්‍යස්ථානය දියත් කිරීමට කටයුතු කරන ලදී. මෙම මධ්‍යස්ථානය විසින් බලශක්තිය, ඉලෙක්ට්‍රොනික උපකරණ සහ EV බැටරි වැනි කර්මාන්ත සම්බන්ධ ශ්‍රැෆීන් නවෝත්පාදනයන් මෙහෙයවනු ඇති අතර නිනිති තාක්‍ෂණයේ ප්‍රමුඛයෙකු ලෙස අබුඩාබි ස්ථානගත කරනු ඇත.

13.5. 2025 වසර සඳහා ඉලක්ක

- ජාත්‍යන්තර තාක්ෂණ පැවරුම්
- ආහාර සුරක්ෂිතතා නවෝත්පාදනයේ දේශීය නායකයත්වය හිමිකර ගැනීම
- සල්ෆියුරික් අම්ල බලාගාරය සඳහා උපායමාර්ගික හවුල්කාරිත්වයක් ස්ථාපිත කර ගැනීම
- SLINTEC හි අධ්‍යයන හා පර්යේෂණ විශිෂ්ටත්වය ශක්තිමත් කිරීම
- පුද්ගලික අංශය සමඟ සහයෝගීතාව වැඩි දියුණු කිරීම:
- පරිසරය සහ තිරසරභාවය සඳහා SLINTEC හි කැපවීම අවධාරණය කරමින් හරිත නවෝත්පාදනයන් කෙරෙහි අඛණ්ඩව අවධානය යොමු කිරීම.

14. ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය (SLSI)

14.1. හැදින්වීම

ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය (SLSI) 1964 අංක 38 දරණ ලංකා ප්‍රමිති කාර්යාංශ පනත යටතේ ලංකා ප්‍රමිති කාර්යාංශය ලෙස ස්ථාපිත කළ අතර, 1984 දී මෙම පනත 1984 අංක 06 දරණ ශ්‍රී ලංකා ප්‍රමිති ආයතන පනත මඟින් අවලංගු කර, ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය ලෙස නැවත නම් කරන ලදී. මෙම පනත මඟින් ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය, ශ්‍රී ලංකාව තුළ ප්‍රමිතිකරණය සහ තත්ත්ව කළමනාකරණ පිළිවෙත් ප්‍රවර්ධනය කිරීමේ මූලික වගකීම දරණ ආයතනයක් සේ බලාත්මක කර ඇත.

දැක්ම

අප රට ආර්ථිකයෙහි සියලු අංශවලට අදාළව ප්‍රමිතිකරණය සහ තත්ත්වය වැඩි දියුණු කිරීමේ කාර්යයන් ඉටු කරමින් ජාතික ජීවන තත්ත්වය නගා සිටුවීම පිණිස නායකත්වය ලබා දෙන්නා වූ අග්‍රගන්‍ය ජාතික සංවිධානයක් බවට පත්වීමය.

මෙහෙවර

ආයතනයේ සේවාලාභීන්ගේ ජීවන තත්ත්වය වැඩි දියුණු කරන අතර ජාතික ආර්ථිකයෙහි සියලුම අංශවල ප්‍රමිතිකරණය, මිනුම්, තත්ත්ව ආරක්ෂණය සහ ආශ්‍රිත කාර්යයන් ආරම්භ කිරීම, ප්‍රවර්ධනය කිරීම සහ පහසු කිරීම තුලින්

- ඵලදායීතාව වැඩිදියුණු කිරීම සහ සම්පත් පරිහරණය උපරිම කිරීම
- අභ්‍යන්තර සහ බාහිර වෙළඳාම පහසු කිරීම
- සමාජ ආර්ථික සංවර්ධනය ළගා කර ගැනීම
- භාණ්ඩ හා සේවාවන්හි අන්තර්ජාතික තරඟකාරිත්වය වර්ධනය කිරීම
- පාරිභෝගික අවශ්‍යතා ආරක්ෂා කිරීම

14.2. ආයතනයේ ප්‍රධාන කාර්යයන්

- ජාතික සහ අන්තර්ජාතික පදනම මත ප්‍රමිති සකස් කිරීම.
- කර්මාන්ත සහ වාණිජ ක්ෂේත්‍රයන්හි ප්‍රමිතිකරණය සහ තත්ත්ව පාලනය ප්‍රවර්ධනය කිරීම.
- ප්‍රමිතිකරණ සහ තත්ත්ව පාලන පිළිවෙත් වැඩි දියුණු කිරීම සඳහා අවශ්‍ය පරීක්ෂණාගාර පිහිටුවාලීම, පුස්තකාල සහ වෙනත් පහසුකම් සැපයීම.
- දේශීයව නිෂ්පාදිත, වෙළඳ භාණ්ඩ සහ ද්‍රව්‍ය පරික්ෂා කිරීම සහ ඒවා නිෂ්පාදනයේදී භාවිතා කරන ක්‍රියාවලි සහ පිළිවෙත් පරික්ෂා කිරීම.
- අදාල ප්‍රමිතිවලට අනුකූල වන පරිදි පරික්ෂා කිරීම සඳහා භාවිතා වන මිනුම් උපකරණ ක්‍රමාංකනය සහ වෙනත් මිනුම් අවශ්‍යතා සඳහා කටයුතු සැලැස්වීම.
- ප්‍රමිතිකරණය සහ තත්ත්ව පාලනය පිළිබඳ පර්යේෂණ සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම සහ ඒ සඳහා කටයුතු සැලැස්වීම.
- භාණ්ඩ සහතිකරණය සඳහා වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීම.
- වෙළඳ භාණ්ඩ, ද්‍රව්‍ය සහ අනෙකුත් නිෂ්පාදනවල තත්ත්වය සහතික කිරීම.
- ප්‍රමිතිකරණය සහ තත්ත්ව පාලනය ප්‍රවර්ධනය කිරීම.
- ආයතනයට සමගාමී අරමුණු ඇති, ශ්‍රී ලංකාවෙන් බැහැර ආයතන, සමාගම් හෝ පුද්ගලයන් සමඟ සහයෝගීතාව පවත්වාගෙන යාම.
- වෙළඳ භාණ්ඩ, ද්‍රව්‍ය , නිෂ්පාදන , ක්‍රියාවලි සහ ක්‍රමවේද වැඩි දියුණු කර ගැනීම සඳහා නිෂ්පාදකයින් සහ පාරිභෝගිකයින් දරණ ප්‍රයත්නය සම්බන්ධීකරණය කිරීම

14.3. 2024 වර්ෂයේ ජයග්‍රහණයන්

- විද්‍යුත් වාහන භාවිතය ප්‍රවර්ධනය කිරීම සහ නියාමනය කිරීම සඳහා වන රජයේ මූලාරම්භය සඳහා සහාය වනු පිණිස විද්‍යුත් වාහන සහ ඒවායේ ආරෝපණ මධ්‍යස්ථාන ක්ෂේත්‍රයේ නව ශ්‍රී ලංකා ප්‍රමිති තිස් හයක් (36) හඳුන්වා දෙන ලදී.
- කර්මාන්ත සංවර්ධනය සඳහා මානව සම්පත් සම්බන්ධ කර ගැනීම වැඩිදියුණු කිරීම සඳහා පුද්ගල කළමනාකරණ වරලත් ආයතනය (CIPM) විසින් කරන ලද ඉල්ලීමකට අනුව මානව සම්පත් කළමනාකරණ (HRM) ක්ෂේත්‍රයට නව ශ්‍රී ලංකා ප්‍රමිති එකොළහක් (11) හඳුන්වා දෙන ලදී.
- ISO / TC 34 / SC 8 තේ සඳහා වන ජාත්‍යන්තර කමිටු රැස්වීම ශ්‍රී ලංකාවේ පැවැත් වූ අතර ඒ සඳහා දේශීය හා විදේශීය විද්වතුන් 37 ක් සහභාගී විය.
- ආනයන පරීක්ෂාව සඳහා නව ආනයනික භාණ්ඩ 34 ක් 2024-05-17 දිනැති අංක 20384 – 35 අති විශේෂ ගැසට් පත්‍රය මඟින් 1969 අංක 01 දරන ආනයන (පාලන) පනත යටතේ වන ප්‍රමිතිකරණ සහ තත්ත්ව පාලන රෙගුලාසි මඟින් ආනයන හා අපනයන පාලක ජනරාල් විසින් හඳුන්වා දෙන ලදි.
- ප්‍රතීතකරණය
  - (අ) කුරුඳු සහ තේ කොළ සඳහා පූර්ව අපනයන පරීක්ෂාව කිරීම සඳහා ISO 17020 ප්‍රතීතන සහතිකය ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය මඟින් 2024-02-05 දින ප්‍රදානය කරන ලදී.
  - (ආ) ආනයන පරීක්ෂාව සිදුකිරීම සඳහා ISO 17020 ප්‍රතීතකරණ සහතිකය භාණ්ඩ 10 ක් සඳහා ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය මඟින් 2024-02-05 දින ප්‍රදානය කරන ලදී.
  - (ඇ) පුළුල් කරන ලද ක්‍රමාංකනයන්;
    - IR උෂ්ණත්වමාන
    - මිනුම් පටි

- විදේශ ක්‍රමාංකනයක් ආරම්භ කිරීම. (මාලදිවයින)
- පද්ධති සහතිකකරණය සඳහා නව විදේශ වෙළඳපොළ ප්‍රවේශය ලබා දීම. (ISO 14001 සහතිකකරණය - තායිලන්තය)
- ජාතික ඖෂධ නියාමන අධිකාරිය විසින් කර්මාන්තකරුවන්ට ලබා දෙන බලපත්‍රය සඳහා GMP සහතිකකරණය ලබාදීම ආරම්භ කිරීම.
- ISO 14005, ISO 27001, ISO 37001 නව කළමනාකරණ පද්ධති ස්ථාපිත කිරීම.
- IP PBX පද්ධතිය: ආයතනයේ සන්නිවේදන කාර්යක්ෂමතාව වර්ධනය කිරීමට IP දුරකථන පද්ධතියක් ක්‍රියාත්මක කිරීම.
- SLSI සහ Standardization Administration of China (SAC) අතර අවබෝධතා ගිවිසුමකට එළඹුණි.
- SLSI සහ China Quality Certification Centre (CQC) අතර අවබෝධතා ගිවිසුමකට එළඹුණි.

14.4. කාර්සාධනය

I. ප්‍රමිති සම්පාදනය

	2023	2024
සකස් කරන ලද ප්‍රමිති සංඛ්‍යාව	264	269
සම්මත කළ කළමනාකරණ පද්ධති ප්‍රමිති සංඛ්‍යාව	113	49

II. භාණ්ඩ සහතික කිරීම

	2023	2024
නිකුත් කරන ලද නව බලපත්‍ර සංඛ්‍යාව	100	94
ඉපැයූ ආදායම (මිලියන)	433.648	401

III. තත්ත්ව ආරක්ෂණය

	2023	2024
අනුකූලතාව සඳහා තක්සේරු කරන ලද තොග සංඛ්‍යාව	16 643	19 388
ඉපැයූ ආදායම (මිලියන)	328.325	452

IV. ක්‍රමාංකන සේවා

	2023	2024
නිකුත් කරන ලද ක්‍රමාංකන වාර්තා සංඛ්‍යාව	4 284	4477
ඉපැයූ ආදායම (මිලියන)	34.836	41

V. රසායනාගාර සේවා

	2023	2024
පරීක්ෂණ වාර්තා නිකුත් කළ සංඛ්‍යාව	12 312	15 900
ඉපැයූ ආදායම (මිලියන)	254.197	සෘජු 67 අභ්‍යන්තර 286

VI. පද්ධති සහතිකකරණය

	2023	2024
නිකුත් කරන ලද නව සහතික සංඛ්‍යාව	143	182
ඉපැයූ ආදායම (මිලියන)	118.491	124

VII. පුහුණු

	2023	2024
සහභාගී වූ සංඛ්‍යාව	1 444	1 583
ඉපැයූ ආදායම (මිලියන)	41.161	45

VIII. ප්‍රලේඛන සහ තොරතුරු සේවා

	2023	2024
බාහිර පාර්ශ්වයන්ට නිකුත් කරන ලද ප්‍රමිති සංඛ්‍යාව	3 778	4445
ඉපැයූ ආදායම (මිලියන)	19.204	22

IX. විද්‍යාව ප්‍රචලිත කිරීම

ප්‍රවර්ධන ක්‍රමවේද	2023 දී වැඩසටහන්			2024 දී වැඩසටහන්		
	ඉලක්කය	සම්පූර්ණ	ප්‍රතිලාභීන්	ඉලක්කය	සම්පූර්ණ	ප්‍රතිලාභීන්
ඩිජිටල් ක්‍රමයට මාධ්‍ය ප්‍රචාරණ පැවැත්වීම	15	75	1 116	20	128	4 850
වෙබිනා පැවැත්වීම	4	11	655	5	7	840

14.5. 2025 වසර සඳහා ඉලක්ක

- ජාතික ප්‍රමිතිකරණ උපාය මාර්ගය (National Standardization Strategy) යාවත්කාලීන කිරීම.
- භාණ්ඩ සහතික කිරීම සඳහා නව නිෂ්පාදන කාණ්ඩ හඳුනා ගැනීම.
- නව භාණ්ඩ පහක් (05) සඳහා ආනයන පරීක්ෂණ ක්‍රියාවලියේ ප්‍රතීතන විෂය පථය පුළුල් කිරීම.
- පරිමාව සහ උෂ්ණත්වය යන ක්ෂේත්‍රවල නව ප්‍රතීතන ක්‍රමාංකන ක්‍රමවේද 02ක් ස්ථාපනය කිරීම.
- අනුකූලතා තක්සේරුව සඳහා නව පරීක්ෂණ ක්‍රමවේද හතක් හඳුන්වා දීම.
- නව කළමනාකරණ පද්ධති සහතික කිරීමේ යෝජනා ක්‍රම දෙකක් සඳහා ප්‍රතීතනය ලබා ගැනීම.
- පාසල් සිසුන්, විශ්වවිද්‍යාල උපාධි අපේක්ෂකයින් සඳහා " තත්ත්වය " සහ " SLSI සේවාවන් " පිළිබඳ දැනුම්වත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.
- ව්‍යාපාර ක්‍රියාවලි සංවර්ධනය කිරීම සහ ඒකාබද්ධ කිරීම - II අදියර (භාණ්ඩ සහතිකකරණය සහ පද්ධති සහතිකකරණය)
- ව්‍යාපාර ක්‍රියාවලි සංවර්ධනය කිරීම සහ ඒකාබද්ධ කිරීම- II අදියර (පරීක්ෂණාගාර කළමනාකරණ පද්ධතිය)

විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ තුළින් ප්‍රගතිය කරා

விஞ்ஞானம், தொழினுட்பம் மற்றும் ஆராய்ச்சியினூடான சாதனைகள்

Achievements through Science, Technology and Research

විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය

3 වන මහල, සෙත්සිරිපාය 1 අදියර, බත්තරමුල්ල

விஞ்ஞான மற்றும் தொழினுட்ப அமைச்சு

3 ஆவது மாடி, செத்சிறிபாய கட்டம் 1, பத்தரமுல்லை

Ministry of Science & Technology

3rd Floor, 1st Stage Sethsiripaya, Battaramulla

Department of Government Printing